

සතියේ තුනපහ මඩියපලේ
අද පත්‍රය සමඟ



The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
දිනමිණ




ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ බිනර අව සැටවක ලත් කුජ දින | කාණ්ඩය 111 පත්‍රය 226 පිටු 24 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත්පතකි | 2020 සැප්තැම්බර් 08 අඟහරුවාදා



මැණික්-ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගේ

# 14%ක ආදායම් බද්ද 15%ක රන් ආනයන බද්ද ඉවතට

**4%ක සහන පොලියට ලක්ෂ 10ක ණයක්** – ජනපති තීරණය කරයි

නුවන් කොඩිකාර

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් උපයන ලාභය මත පනවා ඇති සියයට 14ක ආදායම් බද්ද සහ සහ සියයට 15ක් වූ රත්‍රන් ආනයන බද්ද ඉවත් කිරීමට මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ ඊයේ (7) පැවැති සාකච්ඡාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තීරණය කළේය. පිට 02

# භික්ෂූන් වහන්සේ 15,000කට ‘බුදු පුත් සුරක්ෂා’ රක්ෂණය

ඔක්. 1 දා සිට ක්‍රියාත්මක කරන්නැයි අගමැතිගෙන් උපදෙස්

ධනුෂ්ක ගොඩකුඹුර

බෞද්ධ භික්ෂූන් වහන්සේ 15,000ක් සඳහා බුදු පුත් සුරක්ෂා සෞඛ්‍ය රක්ෂණාවරණ වැඩපිළිවෙළ ඔක්තෝබර් මස 1 වැනි දා සිට ක්‍රියාත්මක කරන්නැයි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඊයේ (7) පැවැති සාකච්ඡාවක දී බලධාරීන්ට උපදෙස් දුන්නේය. පිට 02

## මෝදර ධීවර වරාය අඩු මිලට බදු දුන්නාට

# රාජිත උසාවි කැඳවයි



කුමුදු හෙට්ටිආරච්චි

මෝදර ධීවර වරාය ඉතා අඩු මුදලකට පෞද්ගලික සමාගමකට බදු දීමෙන් රජයට අතිවිශාල පාඩුවක් සිදු කළ බවට චෝදනා පහක් මත අල්ලස් කොමිසම පවරා ඇති නඩුවට ලබන මස 29 වැනි දා අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස දන්වා හිටපු ධීවර අමාත්‍ය රාජිත සේනාරත්න, ශ්‍රී ලංකා වරාය නීතිගත සංස්ථාවේ හිටපු සභාපති උපාලි ලියනගේ හා එහි කළමනාකාර අධ්‍යක්ෂකව සිටි නීල් රවින්ද්‍ර මුණසිංහ යන අයට සිතාසි නිකුත් කිරීමට කොළඹ මහාධිකරණ විනිසුරු ප්‍රදීප් හෙට්ටිආරච්චි මහතා ඊයේ (7) නියෝග කළේය. පිට 02

## තවත් දෙදෙනකුට සිතාසි



# නැවේ ගින්න යළි ඇවිළේ

අසේල ලියනගේ

ආපදාවට පත් වූ නෞකාව රඳවා තබාගෙන සිටින සංගමන්කන්ද තුඩුවට ඔබ්බෙන් වූ මුහුදු ප්‍රදේශයේ පවතින අයහපත් කාලගුණික තත්ත්වයත් සමඟ හටගත් අධික සුළං තත්ත්වය නිසා නෞකාවේ අභ්‍යන්තරයේ පැවති ගිනි පුපුරු ඊයේ (07) නැවත සක්‍රීය තත්වයට පැමිණ පාලනය කර තිබූ ගින්න නැවතත් හටගෙන ඇති බව නාවික හමුදාව පවසයි. පිට 02

# මහවැලි පවුල් 110,000කට ඉඩම් ඔප්පු

චන්දිමා කරුණාරත්න

මහවැලි කලාපවල ජීවත්වන ජනතාවගෙන් මේ වසර තුළ පවුල් 110,000 කට ඉඩම් ඔප්පු ලබා දීමට රජය සැලසුම් සකස් කර ඇත.

මහවැලි කලාප 10ට අයත්, පවුල් සංඛ්‍යාව 331,388ක් පමණ වන වන අතර, සමස්ත ජනගහනය 12,00000කි. පිට 02

## විස්සට එරෙහිව එජාපය උසාවි යන සූදානමක

පිට 02



## තුනෙන් දෙකේ ජනවරමින් පාර්ලිමේන්තුව මිය ගිහින්

පිට 02



## විස්සට අපිත් කැමැති නෑ

පිට 02

## උපදේශක කාරක සභා 28ක් පත් කරයි

ස්වර්ණා විජේකෝන්

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය සඳහා අමාත්‍යාංශ උපදේශක කාරක සභා 28ක් පත් කර තිබේ. පිට 02



බුදු පුත් සුරක්ෂා රක්ෂණාවරණය ගැන අගමැති කාර්යාලයේදී ඊයේ (7) පැවැති සාකච්ඡාවේදී බුද්ධ ශාසන අමාත්‍යාංශයේ තොරතුරු ඇතුළත් ග්‍රන්ථය අගමැති මහින්ද රාජපක්ෂ මහතා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාට පිළිගැන්වූ අවස්ථාව.

ලබන 14 දා කොමිසමේ පෙනී සිටින්නැයි

## දූෂණ විරෝධි කමිටුවේ සිටි මැති-ඇමැතීන්ට නිලධාරීන්ට සිතාසි

පිට 02

## රේඩියෝ ගුරුවරයා i පත්‍රය හෙට දිනමිණ සමඟ

## මනුෂගේ වරෙන්තුව ආපසු කැඳවීමට නියෝග

පිට 02

## ගිනි අවි - බෝම්බ සමඟ බද්දේගම හිටපු විපක්ෂ නායක අත්අඩංගුවට

චන්ද්‍රිකා පෙරේරා

ගිනි අවියක්, ජීව උණ්ඩ, බෝම්බයක් සහ රම්බෝ පිහි ඇතුළු අවි ආයුධ තොගයක් සමඟ බද්දේගම ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක ගැමුණු ඒකනායක ඊයේ (7) බද්දේගම පොලීසිය සහ විශේෂ කාර්ය බළකාය එක්ව කළ මෙහෙයුමකදී අත්අඩංගුවට ගෙන තිබේ. පිට 02

# ප්‍රේමලාල් ජයසේකරට පාර්ලිමේන්තු එන්න අවසර දෙන්න



බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ට අධිකරණයෙන් නියෝග

නෙල්කා මැදගෙදර

මරණ දඬුවම නියමව සිටියදී මන්ත්‍රීවරයකු ලෙස ඡන්දයෙන් තේරී පත් වූ ප්‍රේමලාල් ජයසේකර මහතාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීමට අවසර දෙන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට සහ වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයාට නියෝග කරමින් අභියාචනාධිකරණය ඊයේ (7) අතුරු නියෝගයක් නිකුත් කෙළේය. පිට 02




Cargills food city
වාසි මල්ල
රු. 250ක් වටිනා නැවුම් එළවළු මිලදී ගෙන
සීනි 1kg හෝ පරිප්පු 1kg හෝ කීරි සම්බා 1kg සඳහා
50% ඉතිරියක් ලබාගන්න
කොන්දේසි සහ නියමයන් සහිතයි.
• 2020 සැප්තැම්බර් 4 සිට 11 දක්වා පමණයි
• තොග අවසන් වන තුරු පමණයි
• 50%ක දීමනාව වලංගු වන්නේ එක් නිෂ්පාදනයක් සඳහා පමණයි
Cargills SINCE 1844

ගන්නම හිතෙන DATA LOAN
326 MB RS. 29
896 MB RS. 49
1793 MB RS. 99
අමතර ගාස්තු සහ බදු අදාළ වේ. කොන්දේසි සහිතයි.
හදිස්සියේ ඩේටා ඉවර වුණොත් ටක් ගාලා මොබිටෙල් වෙතින් කිසිම කරදරයක් නැතුව ඩේටා ලෝන් එකක් අරගන්න
සක්‍රිය කර ගන්න #170# අමතන්න.
වේගවත්ම INTERNET පුළුල්තම ආවරණය 4G LTE
Sri Lanka Telecom Mobitel
ඔබ සමගයි. සැමදා.

The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 08 අඟහරුවාදා

## වනාතවිල්ලුවේ වන සංහාරය

වනාතවිල්ලුවේ වන සංහාරය අපේ පරිසර කතාවේ තවත් අනුවේදනීය සිද්ධියක් ලෙස පවතී. ඉඩම් අක්කර සියයකට වැඩි ප්‍රමාණයක් ගිනි තබා විනාශ කර ඇති අතර, මුකළාන්වල පැවැති පලු, බුරුත, හල්මිල්ල වැනි වටිනා දැව කපාගෙන ගොස් තිබේ. දැව ජාවාරමක් සිදු වී ඇති බව ඉතා පැහැදිලිය. රජය සතු ඉඩම් ගිනි තැබීම සම්බන්ධයෙන් පිරිසක් අත්අඩංගුවට ගෙන තිබුණ ද හොර ව්‍යාපෘතියේ ඇත්ත තවම හෙළිදරව් වී නැත. ප්‍රාදේශීය දේශපාලකයන් කිහිප දෙනකු මේ ඉඩම් විකිණීමට සැලැසුම් කර ඇති බව ද දැනගන්නට ලැබේ. වටිනා දැව විකුණාගෙන ඉඩමත් අලෙවි කිරීමට සැලැසුම් කිරීම අපූරු ව්‍යාපාරයකි.

ගිනි තබා හේන් ගොවිතැනට අයත් ඉඩම් ලෙස හුවා දක්වමින් ඉඩම් කට්ටි අලෙවි කිරීමට සැලැසුම් සකස් කර තිබෙන්නට ඇත. එහෙත් මේවා රජය සතු වටිනා ඉඩම්ය. ගිනි තබා විනාශ කර ඇති අක්කර සියයකට වැඩි භූමිය සිමෙන්ති සංස්ථාව සතු බව වාර්තා වී ඇත. සිමෙන්ති සංස්ථාව එම භූමිය තවත් ආයතනයකට බදු දී ඇත්තේ හුනුගල් කැඩීම සඳහා බව ද කියති. පවත්නා තත්ත්වය එය නම්: යට කී පෞද්ගලික ආයතනය ද මේ ජාවාරමට හවුල් බව අමුතුවෙන් කිව යුතු නැත. ආයතන හා පුද්ගලයන් සම්බන්ධ වී රටේ පරිසරය උලාකන බවක් පෙනෙන්නට තිබේ. එය දෙවියන්ගේ නාමයෙන් වහාම නැවැත්විය යුතුය.

රටේ බොහෝ තැන්වලින් පරිසර විනාශය පිළිබඳ තොරතුරු වාර්තා වන්නට පටන්ගෙන තිබේ. එය අතිශය නරක තත්ත්වයකි. පුදුමයකට මෙන් මෙකී වාර්තා පළ වන්නේ විනාශය සිදු වූවාට පසුවය. වන විනාශය හෝ පරිසර විනාශය හෝ වළක්වා ගැනීමට පියවර ගන්නා බවක් පෙනෙන්න නැත. පරිසර සංවිධාන පවා තම වාර්තා එළිදක්වන්නේ විනාශයෙන් පසුවය. ඉහත සිද්ධිය සම්බන්ධයෙන් වගකීම පැවරෙන ආයතන කිහිපයක් තිබේ. සිමෙන්ති සංස්ථාව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඉඩම බදු ගත් ආයතනය ද ඒ අතර ප්‍රධාන වෙයි. රටේ පාරිසරික නීතියට හා වෘක්ෂලතා ආඥා පනතට අනුව ගිනි තැබීම හෝ ගස් කපා ඉවත් කිරීම අවසරයකින් තොරව සිදු කළ නොහැකිය.

ඉහත කී මුකළාන්වල දැවැන්ත ගස් ස්වයංක්‍රීය විදුලි කියත් මඟින් කපා ඇති බව ද එලෙස ගස් කපන ශබ්දය ප්‍රදේශවාසීන්ට ඇසී ඇති බව ද දැනගන්නට ලැබේ. එම සිද්ධීන් වාර්තා වන්නේ ද විනාශය සිදු වීමෙන් පසුවය. ප්‍රදේශවාසීන් තම යුතුකම හා වගකීම පැහැර හැර ඇති බවක් පෙනෙයි. තමන් අවට පරිසරය පිළිබඳ අවධානයකින් පසු වීම යහපත් පුරවැසියකුගේ වගකීම වෙයි. එම වගකීම ඉටු කළේ නම් මේ විනාශය සිදු නොවන්නට ඉඩ තිබිණි. සිමෙන්ති සංස්ථාව අදාළ ඉඩම ආරක්ෂා කර නැත; ඒ ගැන අවධානයකින් පසු වී නැත. එම සංස්ථාවේ ප්‍රධානීන් ද විනාශයේ වගඋත්තරකරුවන් බවට පත් විය යුතුය.

පවත්නා නීති-රීතිවලට අනුව රජය සතු ඉඩමකින් අතු රිකිල්ලක් කැඩීම පවා බරපතළ වරදකි. එබඳු වරදක් සිදු කරන තැනැත්තකු අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත යොමු කිරීමේ නෛතික ප්‍රතිපාදන පවතී. ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ පවා පරිසරය ආරක්ෂා කිරීම සඳහා දැඩි නීති ක්‍රියාත්මක විය. ඒ අනුව රටේ වනාන්තර හා අනෙකුත් පාරිසරික සම්පත් ආරක්ෂා විය. සියලු විනාශ ව්‍යාප්ත වන්නට වූයේ නිදහසින් පසු යැයි කිව හැකිය. දේශපාලකයන් ස්වකීය බලය පාවිච්චි කරමින් වනය විනාශ කරන්නත්, වගුරු බිම් ගොඩ කරන්නත්, වැලි ජාවාරම් කරන්නත් පටන්ගෙන තිබේ. පොලීසිය මේ සම්බන්ධයෙන් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබේ.

ගිනි තබා විනාශ කළ ඉඩම් අක්කර සියයක භූමි භාගයේ වටිනා දැව අලෙවි කිරීමට හැර වෙනත් විනාශ ගණනක් සිදු වන්නට ඇත. ඒ ගැන විමර්ශනයක් තවම සිදු කර නැත. වනාතවිල්ලුව ප්‍රදේශය විශේෂ පරිසර පද්ධතියකට අයත්ය. එහි ජෛව විවිධත්වය, සත්ත්ව ගහනය ගිනි තැබීම නිසා විනාශ වන්නට ඇත. මේ මුකළාන්වල මිල කළ නොහැකි ඖෂධ පැළෑටි තිබෙන්නට පුළුවන. දැන් ඒ සියල්ල විනාශ විනාශ වී ඇතැ'යි සිතන්නට පුළුවන. මේ සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කොට සිදු වූ පාඩුව වරදකරුවන්ගෙන් අය කර ගැනීමට ද වරදකරුවන්ට උපරිම දඬුවම් ලබාදීමට ද රජය ක්‍රියා කළ යුතුය.

1950 ගණන් වන විට රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 44%කට වැඩි අනුපාතයක් වනාන්තර සඳහා වෙන් වී තිබිණි. 1990 ගණන් වන විට එය 25%කට වැඩි නොවූ බව ඇතැම් වාර්තාවල සඳහන්ය. අද වන විට වනාන්තර භූමිවල අනුපාතය 16%ක් හෝ 18%ක් හෝ වන බව ඇතැමුන්ගේ මතය වී තිබේ. වසරින්-වසර වනය විනාශ කිරීම ශීඝ්‍ර වී ඇත. වන විනාශයේ භයානක පැත්ත වන්නේ දැව ජාවාරම්කරුවන්ගේ ක්‍රියා කලාපයයි. කුමන ආයතන පැවතිය ද දැව ජාවාරම්කරුවන්ගේ වන විනාශය නැවතී නැත. වත්මන් රජය යටතේ හෝ එය මුළුමනින්ම නවතා දැමිය යුතුය.

මේ වන විට තෙත් කලාපයේ දිය උල්පත් සිඳී යමින් පවතී. තෙත් කලාපයට ද ජල අර්බුදය පැමිණ තිබේ. කැලණි හා කළු ගංගාවල ජලයට ලවණ මිශ්‍ර වීම දිගින් දිගටම සිදු වෙයි. මීට හේතුව අනවසර වැලි ගොඩදැමීමය. අපේ ඍතුමය වර්ෂා රටාව වෙනස් වී ඇත. එය වන විනාශය නිසා සිදු වූවක් බව පැහැදිලිය. මතු පරපුරට ජීවත් විය හැකි රටක් නිර්මාණය කිරීමට නම්: සියලු පාරිසරික විනාශ වහාම නැවැත්විය යුතුය. එහි පළමු වගකීම භාරගත යුත්තේ රජයයි.

### දිල්රුගේ සීවිද

| | |
|---|---|
| මසක් මාළුවක් ගන්නට අතමිට නැති | සැරේ |
| අවධානය අඩු ගානට තියෙන දෙයක් | කෙරේ |
| යන්තම් සහනයක් දැනුණි දමන්න හැකි | හුරේ |
| දෙකකින් හරි බස්සපු එක නියමයි | බිත්තරේ |



# කර්මාන්තකරුවාගේ පන්නරය රටේ සංවර්ධනයට

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019 නොවැම්බර් විශාල ජන වරමකින් රටේ නායකයා ලෙස පත් කරගන්නේත්, 2020 අගෝස්තු පැවැති මහ මැතිවරණයේ දී අතිවිශාල පාර්ලිමේන්තු බලයක් ලබා දුන්නේත් ජනතාවට එතුමාගේ රාමුවෙන් පිට චින්තනය කෙරෙහි තිබූ දැඩි විශ්වාසය නිසාමය. ජාතික රජයක් යැයි අටමගලක් අටවා ඇමැති සංඛ්‍යාවත්, රාජ්‍ය ඇමැති සංඛ්‍යාවත් වැඩි කර ගැනීමට එතුමාට ඕනෑ තරම් අවස්ථාව තිබිණි. එහෙත් එතුමා එසේ කළේ නැත. ඒ ජනතාව එයට අකමැති බව එතුමා හොඳින් දන්නා නිසාත් ඔහුගේ හෘදය සාක්ෂියට එකඟව එය නොගැළපෙන නිසාත්ය.

රාජ්‍ය අමාත්‍යංශ ඇති කිරීමේ දී තරමක් දිග නම් සහිතව එහෙත් පැහැදිලි කාර්යභාරයක් ඉෂ්ට-සිදිධ කරන පරිදි සකස් කර තිබීම සාම්ප්‍රදායික ජන සමාජයට වටහා ගත නොහැකි විය. ඒ නිසාම සමාජ මාධ්‍ය ජාල තුළ තවමත් විවිධ විහිළු සහගත ප්‍රකාශ කරති. මැටි ඇමැති, බතික් ඇමැති, කුරුඳු ඇමැති, යනාදී ලෙස මේ විහිළු සහගත ප්‍රකාශ කරන අය මෙසේ රාජ්‍ය අමාත්‍යංශ සකස් කිරීමටත් කැබිනට් අමාත්‍යංශ තනි අමාත්‍යංශ ලෙස සකස් කිරීමටත් හේතුව නොසොයති. නොදනිති.

කැබිනට් අමාත්‍යංශය සහ ඇමැතිවරයා අදාළ ඉතා පුළුල් ක්ෂේත්‍රයක ප්‍රතිපත්ති සකස් කිරීමටත් ජනාධිපතිතුමා අපේක්ෂා කරන බව පෙනේ. රාජ්‍ය අමාත්‍යංශ සඳහා ඉතා විස්තරාත්මකව සහ පැහැදිලිව ඔවුන්ගේ කාර්යභාරය සඳහන් කර ඇත්තේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ භාරධූර වගකීම ඔවුන්ට පැහැදිලිව විස්තර කරමිනි. බතික් සහ අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අමාත්‍යංශය ගෙන බලමු. එය අද රටේත් ලෝකයේත් විශාල ඉල්ලුමක් මෙන්ම ඉහළ මිළ ගණන්වලට අළෙවි වන භාණ්ඩයකි. අත්යන්ත්‍ර නිෂ්පාදන රෙදිපිළි බංගලාදේශයේ ආරෝන් නමින් අත්යන්ත්‍ර රෙදිපිළි සහ අත්කම් භාණ්ඩ සඳහා ඉතා ප්‍රසිද්ධ මිල අධික භාණ්ඩ විකුණන වෙළෙඳ සමාගමක් වේ. එය අද ලෝකයේ ඉහළ ගුණාත්මක අගයක් ඇති අත්කම් භාණ්ඩ සඳහාම වූ ප්‍රසිද්ධ සන්නාමයයි.



**මහාචාර්ය රෝහණ පී. මහලියනාරච්චි**
**සබරගමු විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති**
**දියතලාව යුද හමුදා ඇකඩමියේ හිටපු අධ්‍යයන උපදේශක**

### බතික් මැටි අගය

ලංකාවේ බතික් අග්නිදිග ආසියාවේ නිෂ්පාදනය කරන බතික්වලට වඩා ඉහළ ගුණාත්මක බවක් ඇති නිෂ්පාදනයකි. කලක් ලංකාව බතික් පිළිබඳ විශාල කීර්ති නාමයක් දිනා සිටියේය. එහෙත් පසුගිය කාල වකවානුවේ ඒවාට ඇති වූ හීන රාජ්‍ය අනුග්‍රහය නිසාත් වෙනත් වෙළෙඳපොළ ඌනතා නිසාත් එම ඉහළ කීර්තිනාමය අදට වලංගු නැත. එහෙත් එම තත්ත්වයෙන් බතික් කර්මාන්තය මුදවාගෙන පැවතීයාමටත් වඩා ලෝකප්‍රකට සන්නාමයක් දිනා දීම වර්තමාන රාජ්‍ය අමාත්‍යංශයේ අභියෝගයකි. ඉන්දියාවේ උණ කෙඳිවලින් සහ කෙසෙල් කෙඳිවලින් සාදන අත්යන්ත්‍ර සාරි ඉතා මිල අධිකය. මෙම රාජ්‍ය අමාත්‍යංශයෙන්ද රාමුවෙන් පිටත චින්තනයකින් බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයට විශාල වෙළෙඳපොළක් නිර්මාණය කර දීමට පුළුවන.

මැටි ඇමැති යැයි උපහාස කරන ප්‍රසන්න රණවීර මහතා රාජ්‍ය ඇමැතිධුරය දරන අමාත්‍යංශය රටට විශාල ආර්ථික පුනර්ජීවනයක් කළ හැකි එකකි. මැටි භාණ්ඩ යනු ලෝකයේ අද ඉතා විශාල වටිනාකමකට අලෙවි වන ඒවාය. ජනතාව ඇලුමිනියම්, බෙලෙක් වනි ලෝහ භාණ්ඩවලින් ඉවත් වී මැටිවලින් තැනූ වළං, කෝප්ප වෙත නැඹුරු වෙමින් සිටිති. එම අමාත්‍යංශයට අයත් මැටි, පිත්තල වෙනත් ලෝහ, පන්, වේවැල් ආදී භාණ්ඩ ප්‍රවර්ධනය කාලෝචිතම අවස්ථාවකි මේ. මේ සඳහා විධිමත් සැපයුම්දාමයක් නිර්මාණය කිරීම අත්කම් නිෂ්පාදනයක් සඳහා වූ දුෂ්කරතා හඳුනාගෙන විසඳුම් දීම, විද්‍යුත් අලෙවි ක්‍රමදාමයක්ද සමන්විත විධිමත් කාර්යක්ෂම අලෙවිදාමයක් නිර්මාණය කර දීම යනාදිය තුළින් උක්ත ක්ෂේත්‍රයේ පෙරළියක් කිරීමට අදාළ රාජ්‍ය අමාත්‍යංශයට හැකි වනු ඇත. ලෝකයේ අද මහා පරිමාණ අලෙවි දාමයන් සිදුවන්නේ විද්‍යුත් අලෙවි කරණය තුළිනි. ලංකාවේ සියලුම පාරම්පරික අත්කම් භාණ්ඩ නිෂ්පාදන විද්‍යුත් අලෙවිදාමයකට සම්බන්ධ කර ලොව පුරා අපේ පාරම්පරික අත්කම් භාණ්ඩ බෙදා හැරීමේ සහ ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදයක් මා පොදු ජන පෙරමුණේ කර්මාන්ත සහ විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදන කමිටුවට ඉදිරිපත් කළෙමි.

නව මැටි නිධි හඳුනාගෙන ඒවා ජාවාරම්කරුවන්ගේ අතට පත් වීමට ඉඩ නො දී නියම කර්මාන්තකරුවන්ට පමණක් ලබා ගැනීමට හැකි යාන්ත්‍රණයක් සැකසීම, පන්, වේවැල් ආදී ශාක විධිමත් ලෙස වගා කිරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දීම, ඒවා පහසු මිලට කර්මාන්තකරුවන්ට ලැබීමේ ක්‍රමවේදයක් සැකසීම ආදී නිවැරදි සහ කාර්යක්ෂම සැපයුම් ක්‍රියාවලියක් සැළසුම් කිරීම උක්ත මැටි සහ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යංශයේ ප්‍රමුඛ කාර්යයක් වනු ඇත.

### නවීන දැක්ම

පේෂකර්ම හෝ පාරම්පරික අත්කම් භාණ්ඩ නිෂ්පාදන හෝ මැණික් සහ ස්වර්ණාභරණ හෝ කිනම් රාජ්‍ය අමාත්‍යංශයක් වුවද මූලිකවම අදාළ කර්මාන්තකරුවන් මුහුණ දෙන සැපයුම්දාමයේ දුෂ්කරතා, නිවැරදිව හඳුනාගෙන ඒවාට පිළියම් යෙදිය යුතුය. මේ කටයුත්ත කිරීමේ දී සාම්ප්‍රදායික චින්තනයෙන් ඉවත් වී ජනාධිපතිතුමා සිතන පරිදිම රාමුවෙන් පිටතට ගොස් නවීන දැක්මකින් යුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍යය.

ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කර ඇති පරිදි අනවශ්‍ය නීතිරීතිවලින් මෙම කර්මාන්තකරුවා බැඳ තැබීම නොකළ යුතුය. බදු සහිත ණය සපයා දිය යුත්තේ මෙම කර්මාන්තකරුවන්ටය. අප රටේ කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවා බොහෝ දුරට අසාර්ථක වන්නේ අළෙවිකරණයේදීය. ඒ සඳහා ඔවුන්ට පිටිවහලක් වීම ආරම්භයේ දී අත්‍යවශ්‍යම කරුණකි.



**කෘෂි අස්වැන්න නිසි කලට සාධාරණ මිලකට අලෙවි කරගැනීමේ මංපෙත් සකසා දීම කළ යුතුය. ඒ සඳහා රාජ්‍ය අමාත්‍යංශයක් තිබුණේ නම් වඩා වැදගත්ය. කෙසේ වෙතත් ඉල්ලුම සැපයුම සමපාත නොවීමෙන් සිදු වන අධික විචල්‍ය මිල උච්චාවචනය කෘෂි නිෂ්පාදන සඳහා බොහෝ විට සිදු වන දෙයකි. මේ සඳහා තොරතුරු තාක්ෂණයත්, බහුදත්ත තාක්ෂණය සහ කෘත්‍රිම විද්වත් තාක්ෂණයත් යොදා ගෙන විසඳුමක් මා ඉදිරිපත් කරන්නේ වසර විස්සකටත් වඩා වැඩි කාලයක සිටය.**

කෘෂිකර්ම සංවර්ධනයට ද මේ නව රාජ්‍ය ප්‍රතිපත්ති තුළ විශාල අවධානයක් යොමු කර ඇත. අනවශ්‍ය ආනයනයන් සීමා කිරීම හෝ නවතා දැමීමත්, රටට අවශ්‍ය සහ රටේ නිෂ්පාදනය කළ හැකි සියල්ල රට තුළම නිෂ්පාදනය කර ගැනීමත්, අපනයනය අභිමුඛ කෘෂි නිෂ්පාදනයකට යෑමත් ඉතා හොඳ තීරණ වේ. කෘෂි නිෂ්පාදන ආනයනයේ දී භාණ්ඩයේ ගුණාත්මකභාවය, කල් තබා ගැනීමේ දී වඩාත් වැඩි කාලයක් තබා ගැනීමේ හැකියාව, භාණ්ඩයේ ඇසුරුම, නැවුම් එළවළු සහ පලතුරු නම් ඒවායේ වර්ණය, ස්වභාවය, නැවුම් බව, රඳවා ගැනීම ආදිය ගැන වඩාත් සැලකිලිමත් විය යුතුය.


කෘෂිකර්ම අමාත්‍යංශය යටතේ රාජ්‍ය අමාත්‍යාංශ හතරක් පිහිටුවා ඇත. ඒවාට නිශ්චිත වූ කාර්යභාරයක් පවරා ඇත. පොහොර සහ යෙදවුම් සඳහා වෙනමම රාජ්‍ය අමාත්‍යංශයක් ඇති කිරීම වැදගත් වේ. කාබනික කෘෂිකර්මය සහ කාබනික පොහොර යනු හොඳ මාතෘකාවකි. හොඳ ඉල්ලුමකි. එහෙත් වෙළෙඳපොළේ ගුණාක්මක කාබනික පොහොර තිබේද? කාබනික කෘෂිකර්මයෙන් පමණක් මේ රටේ ඉතා විශාල ජනගහණයක් පෝෂණය කළ හැකිද? මේ පිළිබඳ නිවැරදිව අධ්‍යයනයක් කිරීම අදාළ රාජ්‍ය අමාත්‍යංශය සතු වගකීමකි. ගුණාත්මක තත්ත්වයෙන් යුත් පොහොරත්, බීජත් ගොවි ජනතාවට ලබා දීමට උක්ත රාජ්‍ය අමාත්‍යංශයට හැකි විය යුතුය. ජනාධිපතිතුමා මෙසේ රාජ්‍ය අමාත්‍යංශ හතරක් ඇති කළේ ගොවි ජනතාවට ඒ තුළින් විධිමත් සේවයක් ලබා දීමටයි. ගොවි ජනතාවට අවශ්‍ය ඉහළ ගුණාත්මක බීජ ලබා ගැනීමට පහසු මාර්ගයක් තිබීම, පොහොර නිසි කලට නිසි ප්‍රමාණයෙන්, නිසි ප්‍රමිතියෙන් යුතුව පහසු මිලට ලබාගත හැකි වීම, ජලය නිසි පරිදි කළමනාකරණය කර නිසි ප්‍රමාණයෙන් ලබා දීම යනා දී කාරණා සහ විධිමත් කෘෂි ව්‍යාපෘති සේවයක් ලබා දීමෙන් ගොවිතැන නගාසිටුවිය හැකිය. මේවා බොහොම සරල අවශ්‍යතාය.

### කෘෂි අලෙවිය

එසේ නිසි පරිදි නිෂ්පාදනය කරන කෘෂි අස්වැන්න නිසි කලට සාධාරණ මිලකට අලෙවි කරගැනීමේ මංපෙත් සකසා දීම කළ යුතුය. ඒ සඳහා රාජ්‍ය අමාත්‍යංශයක් තිබුණේ නම් වඩා වැදගත්ය. කෙසේ වෙතත් ඉල්ලුම සැපයුම සමපාත නොවීමෙන් සිදුවන අධික විචල්‍ය මිල උච්චාවචනය කෘෂි නිෂ්පාදන සඳහා බොහෝ විට සිදු වන දෙයකි. මේ සඳහා තොරතුරු තාක්ෂණයත්, බහුදත්ත තාක්ෂණය සහ කෘත්‍රිම විද්වත් තාක්ෂණයත් යොදා ගෙන විසඳුමක් මා ඉදිරිපත් කරන්නේ වසර විස්සකටත් වඩා වැඩි කාලයක සිටය. පොදු ජන පෙරමුණේ කෘෂිකර්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයටද එය ඇතුළත් කළෙමු. දැන්වත් ඒ පිළිබඳ අවධානය යොමු වේවායි පතමි.

එමෙන්ම ජනාධිපතිතුමා මහා පරිමාණ කර්මාන්ත සංවර්ධනය ගැනද දක්වා ඇත්තේ ඉතා හොඳ අවධානයකි. නැව් සහ බෝට්ටු කර්මාන්තය, මෝටර් රථ සහ දුම්රිය මැදිරි නිෂ්පාදනයට වැනි මහා පරිමාණ කර්මාන්ත සංවර්ධනයක් ද රටට ඉතාම අවශ්‍යය. අප ඩොක්යාඩ් මඟින් නැව් නිෂ්පාදනයට අත්පොත් තැබුවේ 1974 දීය. එහෙත් ඊට පසු එම කර්මාන්තයට යොමු වූ කොරියාව, චීනය වැනි රටවල් අප පසුකර බොහෝ දුර ගොස්ය. අපේ රටේ දුම්රිය මැදිරි නිෂ්පාදනය කළේ මීට වසර 120 කටත් පෙරය. ඒ ගල් අඟුරු දුම්රිය සඳහාය. 1977න් පසුවත් කෝච්චි පෙට්ටි ලංකාවේ නිෂ්පාදනය කර ඇත. එහෙත් ක්‍රමානුකූලව එය විනාශ කර ඇත.

ජනාධිපතිතුමා කාර්මික සහ කෘෂිකාර්මික සංවර්ධනයක් ගැන වඩාත් විශ්වාසය තබා ඇත. ඒ පිළිබඳ අප සතුටු විය යුතුය. මෙම දැක්ම ඉතාම දිගු කාලීන දැක්මකි. එය ක්‍රියාත්මක කිරීමට සහාය වීම රටේ උසස්, බුද්ධිමත් සියලු දෙනාගේම වගකීමකි; යුතුකමකි.



# චන්ද්‍රසිරි ගජදීර නමැති දේශපාලන චරිතයෙන් නූතන පරපුරට උගත හැකි දේ බොහෝ තිබෙනවා

## අගමැති මහින්ද රාජපක්ෂ



## චන්ද්‍රසිරි ගජදීර ප්‍රතිපත්ති ගරුක දේශපාලන නායකයෙක්

### පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ

**වැලිගම සමූහ ටී.කේ. මහින්ද**

වියත්කම, උගත්කම මෙන්ම මහත්මා ගුණාංග දේශපාලනඥයකුට අවශ්‍ය බවත්, චන්ද්‍රසිරි ගජදීර නමැති දේශපාලන චරිතයෙන් නූතන පරපුරට බොහෝ දේ ඉගෙන ගත හැකි බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ බව පැවසුවේ මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේ පැවැති චන්ද්‍රසිරි ගජදීර මහතාගේ පළමු වර්ෂ පූර්ණ ගුණ සමරු උත්සවයට පෙරේදා (6) ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වෙමිනි.

අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ තවදුරටත් අගමැතිවරයා මෙසේද පැවසීය.

චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා හා අප අතර සම්බන්ධකම් පැති කිහිපයකින් ගොඩනැගෙනවා. එතුමා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ වීමත්, නීතිඥයකුවීමත්, දේශපාලන සම්බන්ධතාවයත් එසේම අප හැමෝම මාතරවීමත් ඊට හේතු වුණා. මේ සම්බන්ධතාවයන් එක්ක බොහෝ දේ කතා කළ හැකියි.

විශේෂයෙන්ම එතුමාගේ වර්ෂ පූර්ණ උත්සවයට සම්බන්ධ වන විට මේ රටේ දේශපාලනය ගැන මගේ මතකයට නැගෙනවා.මේ රටේ වාමාංශික දේශපාලනයේ පුරෝගාමී චරිතයක් වූ එස්.ඒ.වික්‍රමසිංහ මැතිතුමා කොමියුනිස්ට් පක්ෂයෙන් දකුණේ දේශපාලනයට අසහාය නායකයෙක් වුණා. ඔහුගෙන් ලැබුණු සහාය කවදාවත් අමතක කරන්නට බැහැ. අද අප ගුණ සමරන ගජදීර මහතාත් ප්‍රගතිශීලි දේශපාලන නායකයන්ගේ අඩිපාරේ ගමන් ගත් කෙනෙක් වීම විශේෂත්වයක්. ඔහු අදහස්, වැඩ කටයුතුවලින් මෙන්ම හැම කාරණයකදීම මාතර සලකුණ ලෙස හැඳින්වීමේ වරදක් නැහැ.

වියත් දේශපාලනය ගැන බොහෝ දෙනකු උනන්දුවකින් කතා කරනවා. ඒ මහතා මීට දසක හතරකට කළින් ඉදන් මේ පිළිබඳව කතා කළා. මේ රටේ වියත් දේශපාලනය කරමින් ඔහු කතා කළා. එවගේම එතුමා මහත්මා දේශපාලනය නියෝජනය කළා. දේශපාලනයේ දී වියත්කම හා උගත්කම ඉතා වැදගත්. මහත්මා දේශපාලනයත් ඉතා වැදගත් වෙනවා. වියත්කම වගේම මහත්මාකමක් අවශ්‍ය බව නූතන පරපුරට මතක් කරන්න කැමැතියි. දේශපාලනයට අත්‍යවශ්‍යම කාරණාවන් බවට මෙය පත් වෙනවා. චන්ද්‍රසිරි ගජදීර මහතා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක්. සරසවියේ ඉන්නා විට දේශපාලනය පටන් ගත්තා. ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙක් ලෙස දේශපාලනයට ඇවිත් උපාධිය ලබා ගත්තා. අනතුරුව ගුරු සේවයට බැඳුණා.

රාජ්‍ය සේවයට බැඳුණත් අදහස් අතින් ඔහු වමේ ව්‍යාපාරය බද්ධ වී තිබුණා. 1988 නාගරික මන්ත්‍රීවරයා විදිහට මහජන දේශපාලනය ආරම්භ කරණු ලැබුවා.මුලින්ම 1994 දී පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. වසර 17 ක් පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ගෙදර යවන්න අප සමඟ සම සමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත් කටයුතු කරණු ලැබුවා. චන්ද්‍රසිරි ගජදීර

මහතා භිෂණය මැදින්, වෙඩි උණ්ඩ මැදින් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න කැපවූ මාතර නියෝජිතයෙක් බව මා සඳහන් කරන්න කැමැතියි. වියතෙක්, උගතෙක් වුවත්, එතුමා එය ආභරණයක් කර ගත්තේ නැහැ. මහත්මාකම තිබෙනවා කියා රටට කියන්න ගියෙත් නැහැ. වියත්කම, උගත්කම ගැන ප්‍රචාරය කර කර ඉන්නේ නැතිව රටට වැඩක් කරණු ලැබුවා. මහත්මයෙක් ලෙස දේශපාලනය කරණු ලැබුවා. මහත්මා දේශපාලඥයෙක් කියා පෝස්ටර් ගැහුවේ නැහැ.ඒ නිසාම චන්ද්‍රසිරි ගජදීර නාමය අප හදවත්වල රැ දී තිබෙනවා. එතුමා කැබිනට් ඇමැතිවරයෙක් ලෙස වැඩ කළ වකවානුව මට හොඳට මතකයි.යුද්ධය සිදු වූ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කණ්ඩායමක් එක්ක අප ජාතික ආණ්ඩුවක් ගොඩනගා තිබුණා. එම ජාතික ආණ්ඩුවේ ස්වදේශ කටයුතු නියෝජ්‍ය ඇමැතිවරයා ලෙස චන්ද්‍රසිරි ගජදීර මහතා කටයුතු කළා. එතුමාගේ ඇමැතිවරයා බවට පත් වූයේ එක්සත් ජාතික පක්ෂයෙන් පැමිණි මන්ත්‍රීවරයෙක්. ඇමැතිවරු හා මන්ත්‍රීවරුන් අතර සීතල යුද්ධයක් පැවතුණා. ඇමැතිවරයා එක පක්ෂයකින් හා තවත් පක්ෂයකින් නියෝජ්‍ය ඇමැතිවරයා පත්වුවහොත් එම යුද්ධය තවත් බරපතළ වෙනවා. නමුත් චන්ද්‍රසිරි ගජදීර හිතන්න පුළුවන් පරිනත දේශපාලඥයෙක් නිසා තමන්ගේ ඇමැතිවරයා සමඟ ගැටුම් ඇති කර ගන්නේ නැතිව වැඩ කළා පමණක් නොව ඇමැතිවරයාගේ ප්‍රසංශාව දිනා ගන්නත් එතුමා සමත් වුණා. දේශපාලන පරිනත බව හා මහත්මා ගතිගුණ නිසා එහෙම කරන්න පුළුවන් වුණා. එතුමා යුද්ධය අවසන් වන විට බන්ධනාගාර පුනරුත්ථාපන ඇමැතිවරයා ලෙස කටයුතු කළා.

එල්.ටී.ටී.ඊ. සාමාජික තරුණයන් 13000ක් පමණ පුනරුත්ථාපනයට බාර වුණා. එය ඉතා වගකීමකින් යුතුව කළ යුතු රාජකාරියක් වුණා. එතුමාගේ කාලයේ කිසිදු ප්‍රශ්නයක් නොමැතිව මෙම තරුණයන් පුනරුත්ථාපනය කර නිදහස් කරණු ලැබුවා. මෙම තරුණයන් මාතර ට ගෙනත් වැඩ සටහනක් ක්‍රියාත්මක කළා.ලෝකයේම දරුණුම ත්‍රස්තවාදී තරුණ පිරිසක් කිසිදු ප්‍රශ්නයක් ඇති නොවන පරිදි පුනරුත්ථාපනය කර සමාජ ගත කරන්න ගජදීර මහතාගේ නායකත්වය ඉතා වැදගත් වුණා. මානව හිමිකම් රකිමින් ත්‍රස්තවාදීන් පිරිසක් පුනරුත්ථාපනය කළ රටක් හැටියට පිළිගැනීමක් ලබා ගැනීමට අපේ රටට හැකියාව ලැබුණා. මේ සියල්ල කළ හැකි වූයේ ගජදීර මහතා තුළ තිබූ මහත්මා කම හා උගත්කම නිසා යැයි මා විශ්වාස කරනවා. වර්ෂ පූර්ණ ගුණ සමරුව පැවැත්වෙන මෙවැන් මොහොතක ඔහු ගේ ගුණ පිළිබඳ මතකයට ගන්න පුළුවන් වීම ගැන අප සතුටට පත් වෙනවා.එතුමාට නිවන් සුවය ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

**ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ උප සභාපති, මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා-**

ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලනය වෙනුවෙන් චන්ද්‍රසිරි ගජදීර මහතා සියලු කැපවීම් සිදු කළා.සාමාජිකත්වයේ සිට දේශපාලන මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති දක්වාත්, නගර සභාවේ සිට කැබිනට් ඇමැතිවරයෙක් දක්වාත් දැවැන්ත ගමන් මඟක් එතුමාට තිබුණා. එම ප්‍රතිපත්තිගරුක දේශපාලනය හැම කෙනෙකුටම පාඩම් කියා දුන්නා.ජීවිත කාලයේම එක පක්ෂයක්, එක ධජයක්, එක අරමුණක් වෙනුවෙන් කැපවුණා. ඔහු ගේ වියෝවීම මාතර දේශපාලනයට දැවැන්ත හිස්තැනක් නිර්මාණය වී තිබෙනවා. ඔහු ප්‍රාර්ථනා කරණු ලැබූ ලෝකය ගොඩනගන්නට අප දැවැන්ත කැපවීමක් කරණු ලැබුවා. ඒ වෙනුවෙන් වමේ සියල්ල එකට එකතු වී ඉන්නවා. වමේ දේශපාලනයත්, මාතර අතරත් පවතින්නේ ඉතා සමීප සබඳතාවයක්. ඒ වගේම අගමැතිතුමන්ගේ පැමිණීමට ස්තුති කරනවා.

මෙම අවස්ථාවට කථානායක මහින්ද යාපා අබේවර්ධන, විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, රාජ්‍ය ඇමැති කාංචන විජේසේකර, මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුන රණවක, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය ජී.වීරසිංහ, එහි හිටපු ලේකම් ඩිව් ගුණසේකර මහතා ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

# කොළඹ ගං වතුර පාලනයට නව මුතුවැල්ල උමං මාර්ගයේ වැඩ කඩිනම් කරන්න

## අගමැති මහින්ද උපදෙස් දෙයි



**චන්දිමා කරුණාරත්න**

කොළඹ ගං වතුර පාලනය කිරීම සඳහා පැරණි උමං මාර්ග වෙනුවට විකල්ප නව උමං මාර්ගයක් ලෙස ඉදිවන නව මුතුවැල්ල උමං මාර්ගයේ වැඩකටයුතු කඩිනමින් අවසන් කරන්නැයි නාගරික සංවර්ධන හා නිවාස ඇමැති අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දෙයි.

වසර 225කට වඩා පැරණි ලන්දේසි යුගයේ ඉදිකරන ලද මුතුවැල්ල උමං මාර්ගයට විකල්පයක් වශයෙන් උතුරු කොළඹ ගංවතුර පාලනය කිරීම සඳහා ඉදිකරමින් පවතින නව මුතුවැල්ල උමං මාර්ගයේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතියට (Metro Colombo Urban development) මෙලෙස උපදෙස් ලබා දී ඇත.

මේ වන විට මීටර් 3ක විෂ්කම්භයකින් යුත් උතුරු කොළඹ නව මුතුවැල්ල උමං මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. මේවනවිට මීටර් 778 ක දිගින් යුත් උමඟ ඉදිකර අවසන් කැර ඇති අතර දැනට මෝදර ප්‍රදේශයෙන් එම නව උමඟ මුහුද ට වැටීමේ වැඩ කටයුතු සිදු කරමින් පවතී.

මාස 3ක් ඇතුළත නව උමගෙහි වැඩ කටයුතු මුළුමනින්ම අවසන් කිරීමෙන් අනතුරුව ඒ හරහා ජලය බැස යෑමේ කටයුතු සිදු කෙරුණු ඇත. අලුත් මාවත ප්‍රධාන ඇළ මාර්ගය අසලින් මෙම නව උමඟ ආරම්භ වන අතර උමඟ අවසන් වන්නේ මෝදර ධීවර වරාය ආසන්නයෙන්ය.

මෙම උමෙගහි දිග ප්‍රමාණය මීටර් 778 කි.

මෙම උමෙගහි අවම ගැඹුර මීටර් 3 1/2 ක් වන අතර එහි උපරිම ගැඹුර මීටර් 17.2 කි. උමඟ ආරම්භක කොටස කෙටි විවෘත ඇළ මාර්ගයක් ලෙස ඉදිවනු ඇත. ඉන් පසුව භූගත උමං මාර්ගයක් ලෙස තත්පරයකට ජලය ලීටර් 15, 000 ක් මුහුදට මුදා හැරිය හැකිය.

අලුත් මාවත හා ඇණු පොකුණ ග්‍රාම සේවා වසම් හරහා පොළව යටින් ජලය බැස යෑම සඳහා මෙම උමඟ ඉදිකර තිබේ.

මීටර් 1.8 ක විෂ්කම්භයකින් මුතුවැල්ල පැරණි උමං මාර්ගය උතුරු කොළඹ වතුර බැස යෑමට ඉදිකර තිබුණ ද වසර 225 ක් මෙම ප්‍රදේශය ක්‍රමක් ක්‍රමයෙන් නාගරීකරණය වීමෙන් අනතුරුව පසුකාලීනව උතුරු කොළඹ ප්‍රදේශයේ ජලය බැස යෑමට මීටර් 1.8 ක විෂ්කම්භයකින් යුත් මෙම මුතුවැල්ල පැරණි උමං මාර්ගය ප්‍රමාණවත් නොවීය.

මේ නිසා බ්ලූමැන්ඩල් සහ අලුත් මාවත ප්‍රදේශ කුඩා වර්ෂාවක දී වුව ද ජල ගැලීම්වලට ලක්වන අතර ඒ නිසා එම ගංවතුර තත්ත්වයෙන් පවුල් රැසක් වැසි කාලවල දී දැඩි අසරණ තත්ත්වයකට පත්වෙති.

කොළඹ ගංවතුර පාලනය කිරීමට හා හඳුනාගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කරගෙන කොළඹ අගනගර ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කෙරිණ.

එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහ වර්තමාන ජනාධිපති එවකට රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි.

'කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය', නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් වේ. මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම අමෙරිකන් ඩොලර් මිලියන 321ක් වන අතර එයන් අමෙරිකන් ඩොලර් මිලියන 213 ක් ලෝක බැංකුවෙන් සහනදායී ණය පදනම මත ලැබුණු අතර ශ්‍රී ලංකා රජය අමෙරිකන් ඩොලර් මිලියන 108 ක් ආයෝජනය කැර තිබේ.

කොළඹ අගනගර කලාපයේ පවතින වැසි ජලය නිසා ඇතිවන ජල ගැලීම් දුෂ්කරතා අවම කැර නාගරික යටිතල පහසුකම් නැංවීම හා පළාත් පාලන ආයතනවල හැකියාවන් වර්ධනය කිරීමට ව්‍යාපෘති යටතේ දැනටමත් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවමින් සිටී.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන මෙම දැවැන්ත ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කැර ගැනීම්, නැවත පදිංචි කිරීම් ඇතුළු සමස්ත පිරිවැය රුපියල් මිලියන 3, 450 කි.

නව මුතුවැල්ල උමගේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා වන මූලික ශක්‍යතා අධ්‍යන කටයුතු හා සැලසුම් 2013 වසරේ දී ආරම්භ කළ අතර, එහි ඉදිකිරීම් කටයුතු පළපුරුදු විදේශීය සමාගමක් වන චයිනා පෙට්‍රෝලියම් පයිප් ලයින් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් ආයතනයට භාර දෙන ලදි. ඉදිකිරීම් අධීක්ෂණය යූෂින් ඉංජිනියරින් කෝපරේෂන් ලිමිටඩ් විසින් සිදු කරනු ලබන අතර මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා නව මුතුවැල්ල, අලුත් මාවත ග්‍රාම නිලධාරී වසමේ ජීවත්වන පවුල් දැනුවත් කැර ඇති අතර පවුල් 150කට අයත් ඉඩම් හෙක්ටයාර් 1.719 ක ප්‍රමාණයක් රජයට පවරාගෙන මෙම උමඟ ඉදිකිරීමට යොදා ගන්නා ලදි. දැනටමත් මෙම ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියේ දී ව්‍යාපෘතිය හේතුවෙන් නිවාස හා ඉඩම් අහිමිවූවන්හට නිවාස හා වන්දි ගෙවීමට රුපියල් මිලියන 647 ක පිරිවැයක් දරා ඇත. තවද උමඟ ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වූ අනවසර පවුල් 63 ක් සඳහා 'මෙත්සඳ සෙවන' නිවාස සංකීර්ණයෙන් නිවාස ලබා දී තිබේ.

නව මුතුවැල්ල උමං මාර්ගය ඉදිකිරීමෙන් පසු කාලාන්තරයක් තිස්සේ පැවැති ජල ගැලීම් පාලනයට ස්ථිර විසඳුමක් ලැබෙන අතර කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ජල ගැලීම්වලින් තොර කොළඹ නගරයක් ඇති කිරීම සඳහා කැප වී සිටියි.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් උප ව්‍යාපෘති 55 ක් ක්‍රියාවට නැංවෙන අතර ඉන් උප ව්‍යාපෘති 45 ක් මේ වනවිට නිමාකර ඇත. මෙම නිමාකර ඇති ව්‍යාපෘති අතර ගාලු පාර හා ආර්.ඒ.ද. මැල් මාවත ප්‍රතිසංස්කරණය, කොළඹ නගර ශාලා චතුරස්රයේ ආදර්ශ කලාපය සංවර්ධනය, බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය සංවර්ධනය හා කාක දූපත වෙරළ උද්‍යානයේ නවීකරණයන් සිදුකිරීම ආදී ව්‍යාපෘති ප්‍රධාන වේ.

දැනට ක්‍රියාවට නැංවෙන ව්‍යාපෘති 10 ක් අතුරින් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සඳහා ක්‍රියාත්මක කොළොන්නාව හා මාදිවෙල නැගෙනහිර ජල හැරවුම් ඇළ මාර්ග නවීකරණය කිරීම, අඹතලේ, ශාන්ත සෙබස්තියන් උතුරු හා දකුණු පොම්පාගාර ඉදිකිරීම ආදිය ඇතුළත් වේ. එමෙන්ම, මෙයට සමගාමීව මීටර් 1, 100 ක් වන ප්‍රධාන උමං මාර්ගයකින් හා මීටර් 2, 500 ක් වන අතුරු උමං මාර්ග තුනකින් සමන්විත ටොරිංටන් උමං මාර්ග පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ද මේ වන විට ආරම්භ කැර ඇත. ටොරිංටන් ප්‍රධාන උමං මාර්ගය කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාල ප්‍රදේශයෙන් ආරම්භ වී බෞද්ධාලෝක මාවත ඔස්සේ ගමන් කැර බම්බලපිටිය වෙරළ තීරයෙන් මුහුදට වැටේ.



# ආරක්ෂක ලේකම් රචනා කළ කෘති ද්විත්වය එළිදකී

**නුවන් කොඩිකාර**

ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා රචනා කළ 'පාතාලයෝ' නවකතාව සහ 'ගෝඨාභය' ග්‍රන්ථයේ ඉංග්‍රීසි අනුවර්තනය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත පිළිගන්වනු ලැබීය.

සත්‍ය සිද්ධීන් සමුදායක් පාදක කොටගෙන 'පාතාලයෝ' නවකතාව රචනා කැර තිබේ. 'ගෝඨාභය' සිංහල කෘතිය පසුගිය වසරේ එළිදුටු අතර මෙවර එහි ඉංග්‍රීසි අනුවර්තනය එළිදැක්විණි.

කෘති ද්විත්වය දොරට වැඩුම කොළඹ ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලවේ දී පෙරේදා (6) සිදු කෙරිණි.

කමල් ගුණරත්න මහතා විසින් මීට පෙර 'රණමග ඔස්සේ නන්දිකඩාල්' නමින් සිංහල භාෂාවෙන් ද එහි ඉංග්‍රීසි අනුවර්තනය 'Road To Nandikadal' ඇතුළුව 'කඩොල් ඇත්තු' 'උත්තර දේවි' 'ගෝඨාභය' යන කෘති 5 ක් රචනා කැර ඇත. 'පාතාලයෝ' සහ 'GOTABAYA' ඉංග්‍රීසි අනුවර්තනය ඔහු විසින් රචනා කරන ලද 6 වැනි සහ 7 වැනි ග්‍රන්ථ ද්විත්වයයි.

කෘති ද්විත්වයේ පළමු පිටපත් කමල් ගුණරත්න මහතා ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහ නායක අතිපූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර නායක ස්වාමින් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය වෙත පිළිගැන්වීය. අනතුරුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත කෘති පිළිගන්වනු ලැබීය.

කමල් ගුණරත්න මහතා සිය හමුදා ජීවිතයේ ගුරුවරුන් ලෙස සලකන මච්බිම වෙනුවෙන් යුද බිමේ දී සිය ජීවිත පූජා කළ ලුතිනන් ජනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සහ මේජර් ජනරාල් විජය විමලරත්න මහත්වරුන් වෙනුවෙන් එම මහත්මීන් වෙත ද කෘති පිටපත් පිළිගැන්විණි.

ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහතා උත්සවයේ ප්‍රධාන දේශනය කෙළේය.

කතුවරයා හඳුන්වාදීම ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු සහ සිංහල භාෂාව පිළිබඳ ආචාර්යවරයකු වන විශ්ව රාජපක්ෂ මහතා සිදු කෙළේය.

කමල් ගුණරත්න මහතාගේ ජන්ම දිනය ඊයේ දිනට යෙදී තිබිණි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා සහ චමල් රාජපක්ෂ, බන්දුල ගුණවර්ධන, මහින්දානන්ද අලුත්ගමගේ, සරත් වීරසේකර, නාලක ගොඩහේවා යන ඇමැතිවරු, අමාත්‍යාංශ ලේකම්වරු, හිටපු හමුදාපතිවරු, වත්මන් හමුදාපතිවරු ප්‍රමුඛ ආරක්ෂක අංශ ප්‍රධානීහු ඇතුළු පිරිසක් උත්සවයට එක්ව සිටියහ.

# කොළඹ ගඵූර් ගොඩනැගිල්ල් ප්‍රතිසංස්කරණ කටයුතු

## ජනපති - අගමැති උපදෙසින් අද ඇරැඹේ

කොළඹ ගඵූර් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අගමැති මහහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙසින් අද (8) සිට ආරම්භ වේ.

එවකට නාගරික සංවර්ධන හා ආරක්ෂක ලේකම් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජක්ෂ මහතා 2012 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2015 න් පසු අතරමඟ ඇණිහිට තිබූ ව්‍යාපෘතියක් වන අතර මිලියන 620 ක වියදමකින් නැවත එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භවේ.

ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ උපදෙස් යටතේ කොළඹ නගරය අලංකාර කිරීමේ වැඩසටහන යටතේ පැරණි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ කොළඹ ගඵූර් ගොඩනැගිල්ල ප්‍රතිංස්කරණය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව සිදු කෙරේ.

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසාද් රණවීර යන මහත්වරුන්ගේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු අද (8)දින උදේ 8.30 ආරම්භ කිරිමට නියමිතයි.

# විපක්ෂය බොරු බිල්ලන් මවනවා!

# 20වැනි සංශෝධනයෙන් කොමිසම් කිසිවක් අහෝසි වෙන්නේ නැහැ

● ශ්‍රීලපොපෙ සභාපති, ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්

## යහපාලන ආණ්ඩුව ගෙදර ගියේ 19 නිසා

## 19 තිබෙන තෙක් රටට පැවැත්මක් නැහැ

චන්දිමා කරුණාරත්න

විසිවන සංශෝධනයේ අරමුණ හා අභිමතාර්ථය වන්නේ සීමිත කාලයක් තුළ ඉටුකර ගැනීමට අවශ්‍ය බලතල රජයට ලබාදීම බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ සභාපති, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවැසීය.

20 වන සංශෝධනයෙන් කොමිෂන් සභා අහෝසි වනවා යැයි ඇතැමුන් ප්‍රකාශ කළද එය සම්පූර්ණ මිථ්‍යාවක් බවත් පැවැසූ ඒ මහතා 20 වන සංශෝධනය යටතේ කොමිෂන් සභා හතක් තිබෙන බවත් ඒවායේ අඛණ්ඩ පැවැත්ම සහතික කර තිබෙන බවත් ප්‍රකාශ කළේ ය.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස් සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව, ජන්ද කොට්ඨාස පිළිබඳ සීමා නීර්ණ කොමිෂන් සභාව යන කොමිෂන් සභා හත දිගටම පවතින බව ඒ මහතා පෙන්වා දුන්නේ ය.

ඒ මහතා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මාධ්‍ය මධ්‍යස්ථානයේදී ඊයේ (07) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීවේය.

19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවේ ද්වේෂ සහගතවයි, රටට හොඳක් කිරීමේ අරමුණින් නෙවෙයි. එහි අභිලාශය වුණේ එක පවුලකින් පළි ගැනීමයි. රාජපක්ෂ පවුලේ සියලු සාමාජිකයන් දේශපාලන කරළියෙන් ඉවත් කිරීමයි. අවසානයේදී ඒ 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් මහා විනාශයක් වුණේ රාජපක්ෂ පවුලට නෙමෙයි, අපේ රටේ ජනතාවටයි. 19 වන ව්‍යවස්ථා සංශෝධනය පවතින තාක් මේ රට ඉදිරියට ගෙනයාමේ පුළුවන්කමක් නැහැ. 19 වන සශෝධනය නිසා මේ රටේ අරාජික තත්ත්වයක් ඇති වුණා. ආණ්ඩුවක් නැති වුණා. ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීමට සුදුසු නීති රාමුවක් තිබුණේ නැහැ. අපි ක්ෂණිකව කටයුතු කරන්නේ ඒ තත්ත්වයෙන් මේ රට ගොඩ ගැනීමටයි.

19 වන සංශෝධනය ඉවත් කරලා ඒ වෙනුවට 20 වන සංශෝධනය ආදේශ කිරීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට දැවැන්ත වරමක් ජනතාව දුන්නා. නමුත් ජනාධිපතිවරයාට අමාත්‍යාංශධුර දරන්න බැහැ. 19 වන සංශෝධනය තිබෙන තාක් කිසිම අමාත්‍යාංශයක් දරන්න බැහැ. පොලිස්පතිවරයා මොන වරදක් කළත් අස්කරන්න බැහැ. මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛ වගකීම ජනාධිපතිවරයාට තිබෙනවා. නමුත් ඒ වගකීම ඉටුකිරීමට කිසිම බලයක් නැහැ. 19 වන සංශෝධනයෙන් බලය උදුරාගෙන තිබෙනවා. 19ට පෙර හදිසි පණතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පූර්ණ බලතල තිබුණා.

ස්ථාවර ආණ්ඩුවක් හදන්න බැරි වුණත් පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැ. ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිධුරයට පත්වුණේ නොවැම්බර්.

19 වන සංශෝධනය නොතිබුණා නම් වහාම පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා. පසුව තමන් සමග වැඩකළ හැකි අභිනව පාර්ලිමේන්තුවක් පත් කරන්න ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. නමුත් එය කරන්න බැරි වුණා. ඒ නිසා මාස 10ක් අපතේ ගියා. කාටද අවාසිය. රාජපක්ෂ පවුලට නෙමෙයි ජනතාවටයි. 19 වන සංශෝධනය තිබෙන තාක් ජනාධිපතිවරයාට වැඩි වැඩක් කරන්න කාලයක් නැහැ. තමන්ගේ කාලයෙන් වැඩි කොටසක් වෙන් කරන්න වෙනවා උසාවි, උසාවිවලට සම්බන්ධ වැඩකටයුතු සඳහා වෙන් කරන්න වෙනවා.

සෞභාග්‍යයේ දැක්මේ අන්තර්ගත ප්‍රතිඥා ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට තිබෙන ඉඩකඩ ඉතාමත් සීමිත වෙනවා. ඒනිසා මුක්තිය අවශ්‍ය වෙනවා. එය සාධාරණයි කියා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන තිබෙනවා.

පාර්ලිමේන්තු කවුන්සිලය පසුගිය දවස් තුන තුළ විශාල ලෙස විවේචනයට භාජනය වූ දෙයක්. එය කොමිෂන් සභාවට සම්බන්ධයි. 20 වන සංශෝධනයෙන් කොමිෂන් සභා අහෝසි වෙලා කියා සමහරු ප්‍රකාශ කරනවා. එය සම්පූර්ණ මිත්‍යාවක්. කොමිෂන් සභා තිබෙනවා. 20 වන සංශෝධනය යටතේ කොමිෂන් සභා හතක් තිබෙනවා. ඒවායේ අඛණ්ඩ පැවැත්ම සහතික කර තිබෙනවා.

ඒ කොමිෂන් සභා හත වන්නේ මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස් සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව, ජන්ද කොට්ඨාස පිළිබඳ සීමා නීර්ණ කොමිෂන් සභාව යන කොමිෂන් සභා හත දිගටම තිබෙනවා. එකක්වත් අහෝසි කර නැහැ. හැබැයි මේ කොමිෂන් සභා හත ස්ථාපිත කිරීමේ කාර්යභාරයේදි යම් වෙනසක් ඇති කර තිබෙනවා. කලින් තිබුණේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, එහි කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් දහ දෙනෙක් සිටියා. ඉන් 5දෙනෙක් අගමැතිවරයා හා විපක්ෂනායකවරයාගේ එකගතාවය මත පත් කළා. යහපාලන ආණ්ඩුවේ එය ප්‍රශ්නයක් වුණේ නැහැ.

20 වන සංශෝධනය හරහා ව්‍යවස්ථා මණ්ඩලය වෙනුවට පාර්ලිමේන්තු කවුන්සිලයක් තිබෙනවා. ඒ පාර්ලිමේන්තු කවුන්සිලයේ යෝජනා හා අදහස් විමසීමට අනිවාර්ය යුතුකමක් හා වගකීමක් ජනාධිපතිවරයාට පැවරෙනවා.

20වන සංශෝධනයෙන් වැරදි විදිහට පාර්ලිමේන්තුව පාවිච්චි කිරීමේ බලයත් ආණ්ඩුවෙන් අහිමි කර තිබෙනවා. යහපාලන රජය සර්ව ජන ජන්ද බලය පළාත් සභා මට්ටමින් අහෝසි කිරීම සඳහා කූඨ වැඩපිළිවෙළක් දියත් කළ බව මේ රටේ ජනතාව දන්නවා . පළාත් සභා වලට කාන්තා සම්බන්ධයෙන් කියලා පනතක් ඉදිරිපත් කර කමිටු අදියරේ සංශෝධන 34ක් පිටු 39ක් එකතු කළා.

ඒ පනතේ ස්වභාවය සම්පූර්ණයෙන් වෙනස් කළා. ඒ කූට ක්‍රියාමාර්ගය තුළින් පළාත් සභා ජන්දය අහෝසි කළා. එහෙම දෙයක් මීට පස්සේ සිදුනොවන්නට 20 වන සංශෝධනයෙන් වැඩ කටයුතු සලසලා තිබෙනවා.

ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක් තවදුරටත් තහවුරු වන වගන්ති , 20 වන සංශෝධනයේ පැහැදිලිව ඇතුළත් වී තිබෙනවා. ජනාධිපතිවරයාගේ වාර දෙක කිසිසේත් වෙනස් කර නැහැ. තුන්වෙනි වාරයක් බැහැ. 20 වන සංශෝධනයෙන් ඒ තත්ත්වය ඒ විදිහටම රැකෙනවා.

ඒ වගේම ජනාධිපතිවරයාගේ නිල කාලය සහ පාර්ලිමේන්තුවේ නිල කාලය අවුරුදු හය නෙමෙයි අවුරුදු පහයි. තොරතුරු ගැනීමේ අයිතිය



ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක අත්‍යවශය ලක්ෂණයක්. එය ඒ විදිහටම තිබෙනවා. මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙනවා. ඔක්තොම්බර් මාසයේදි පමණ පාර්ලිමේන්තුවේ විවාදයට භාජනය වෙනවා. කිසිම සැකයකින් තොරව තුනෙන් දෙකක බහුතරය එයට ලැබෙනවා කියා අපේ දැඩි විශ්වාසයක් තිබෙනවා. 20 වන සංශෝධනයේ අරමුණ හා අභිමතාර්ථය වන්නේ සීමිත කාලයක් තුළ ඉටුකර ගැනීමට අවශ්‍ය බලතල රජයට ලබාදීමයි .

**වරාය හා නාවික අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා -**

19 වන සංශෝධනය යහපාලන රජය ගෙදර යැවීමේ සාධකය වුණා. මේ 19 වන ව්‍යස්ථා සංශෝධනය මේ රටට ගැළපෙන්නේ නැහැ කියා අපි සෑම මැතිවරණයකදීම ප්‍රකාශ කළා. මැතිවරණ කොමිසම හැසිරුණු විදිහ අපි දැක්කා. පලාත් පාලන ජන්දය අපිට ලැබුණා ද? ජනාධිපතිවරණ අවස්ථාවේදී ද අපි ඒ බව ප්‍රකාශ කළා. එහිදී අපිට ජනවරම ලැබුණා. තුනෙන් දෙකක ජනවරමත් අපිට ලැබුණා. එයින් පැහැදිලිවම 19 වන සංශෝධනය රටට ගැළපෙන්නේ නැති බව හොඳටම පිළිඹුබු වෙනවා. තුනෙන් දෙකක අයිතිය රැකීම අපේ වගකීමක්. ඒ වෙනුවෙන් අප කටයුතු කරනවා.

## ‘225න්ම දක්ෂයා රනිල් ව්‍යවස්ථා ගැන ඔහු හොඳින් දන්නවා’

## 19යේ හොඳ දේවල් ඉවත් කරනවාට අප විරුද්ධයි

● හිටපු ඇමැති අර්ජුන රණතුංග

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයට හිමි ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය එහි නායක රනිල් වික්‍රමසිංහ මහතාට ලබා දිය යුතු බව හිටපු අමාත්‍ය අර්ජුන රණතුංග මහතා පවසයි. පෙරේදා (6) එම පක්ෂයේ 74 වැනි සංවත්සරයට එක් වීමෙන් පසුව සිරිකොත පක්ෂ මූලස්ථානය ඉදිරිපිටදී මාධ්‍යයට අදහස් දක්වමින් ඔහු මේ බව ප්‍රකාශ කළේය. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය ලබා ගැනීමට එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රතික්ෂේප කර සිටින නමුත් නව තත්ත්වයන් හමුවේ එම මන්ත්‍රී ධුරය රනිල් වික්‍රමසිංහ මහතාට දීම වඩාත් සුදුසු බවට තමන් පෞද්ගලිකව සිතන බව රණතුංග මහතා පැවසීය. එහිදි ඒ මහතා මෙසේ ද කීය.

'පාර්ලිමේනතුවට විසිවැනි සංශෝධනය ඉදිරියේදී ගෙන එනවා. ඒ අවස්ථාවේදී විසි වැනි සංශෝධන ගැන ගැඹුරින් සාකච්ඡා කරන්න, අදහස් දක්වන ඒ ගැන ගැඹුරු අවබෝධයක් තියෙන කෙනෙක් ඉන්න ඕන. මම පෞද්ගලිකව හිතන විදියට ඒ සඳහා සුදුසු ම පුද්ගලයා රනිල් වික්‍රමසිංහ මහතා. එතුමාට ව්‍යවස්ථාව ගැන පුළුල් අවබෝධයක් තියෙනවා. ඒ නිසා තමයි අපි එතුමාට කිව්වේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය ගන්න කියලා. එතුමා නම් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය ප්‍රතික්ෂේප කරලා තියෙනවා. අපිත් මුලින් කිව්වා ගන්න එපා කියලා. නමුත් දැන් මම කියන්නේ මේ විසිවැනි සංශෝධනයත් එක්ක එක්සත් ජාතික පක්ෂයෙන් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට සුදුසු ම කෙනා රනිල් වික්‍රමසිංහ මහතා කියලා.

අපේ කණ්ඩායමේ සිටින දක්ෂම පුද්ගලයා එතුමායි. දෙසිය විසි පහේම ඉන්න දක්ෂයා එතුමායි. 20 වැනි සංශෝධනය සම්බන්ධයෙන් වන නීතිය වැනි දේ ගැන කරුණු දැක්වීමට ඉන්න සුදුසුම පුද්ගලයා එතුමායි. හොඳ නරක රටට මෙන්ම ආණ්ඩුවට දැනුම් දෙන්න එතුමා පාර්ලිමේන්තුවේ සිටිය යුතු බව මගේ අදහසයි. එතුමා පාර්ලිමේන්තුවට යැවිය යුතු බව අපෙන් එන යෝජනාවක්. කණ්ඩායමක් හදන විට හොඳ ක්‍රීඩකයන් සිටිය යුතුයි. මේ වෙලාවේ ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කිරීමට එතුමා පාර්ලිමේන්තුවේ සිටිය යුතුයි.

පක්ෂය යළි හදා ගෙන ඉදිරියට ගෙන යන්න අප සැලසුම් කරගෙන යනවා. කලබල විය යුතු නැහැ. ටික කලක් යයි. හොඳ නායකයෙක් නියම වෙලාවට පත් වෙයි. මේ පක්ෂය වට්ටන්න පුළුවන් පක්ෂයක් නෙවෙයි. මම මේ පක්ෂයට ආවේත් ඒ නිසයි. උඩින් එන නායකයෝ විතරක් නොව හොඳ නායකයන්ගේ දායකත්වයෙන් පක්ෂය ඉදිරියට ගෙන යනවා. පහුගිය කාලයේ අපෙන් ඈත් වුණු පාක්ෂිකයින් ගැන සොයා නොබලපු එක ප්‍රශ්නයක් වුණා. අප ඒ ගැන දැන් අවධානය යොමු කර තිබෙනවා. රාජපක්ෂ මහතාට තුනෙන් දෙකක බලයක් මිනිස්සු දී තිබෙනවා. ආණ්ඩුව ගෙන යන්න කාලයක් දිය යුතුයි. මිනිස්සු තීරණය කරයි. බඩු මිල දැනටම ඉහළ ගිහින්. 19 සංශෝධනයේ හොඳ දේ ඉවත් කරනවනම් අප විරුද්ධ වෙනවා. අඩුපාඩු සංශෝධනය කිරීමේ වරදක් නැහැ. ඔවුන්ගේ බලතල වැඩි කිරීමට 20 ගේනවා ජනතාව ඒ ගැන හිතයි. දැනට අප බලා ඉන්නවා. ටික කාලයක් යනවිට විරුද්ධ පක්ෂ සියල්ලම එක් කරගෙන ගමනක් යනවා. අපි 2015 දී සෝභිත නාහිමිගේ අනුශාසනාවෙන් ආණ්ඩුව පෙරළුවා. අපි හොඳ දේවලට සහය දෙමින් වැරදි දේවලට විරුද්ධ වෙනවා. නව ක්‍රීඩා ඇමතිවරයාට අප වැඩක් කරන්න ඉඩ දී බලන්න ඕනෑ. ක්‍රීඩා මාෆියාවකට නොයා යුතුයි.

# ආණ්ඩු විරෝධී පිල ශක්තිමත් කරන්න සජිත්ට එජාපයේ නායකත්වය දෙන්න

● පා.ම. තිස්ස අත්තනායක

ශිවන්ති ප්‍රනාන්දු

ආණ්ඩුවට විරුද්ධව ජනමතය ශක්තිමත් කිරීම සඳහා වන සමගි ජනබලවේගයේ ප්‍රමුඛ අභිප්‍රායේ මූලික පියවර හැටියට සජිත් ප්‍රේමදාස මහතාට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය භාර දෙන්නැයි ඉල්ලා සිටින බව එහි ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා පැවසීය.

සමගි ජන බලවේග කාර්යාලයේ ඊයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් හෙතෙම මේ බව ප්‍රකාශ කළේය.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා ආරම්භ කළ එක්සත් ජාතික පක්ෂයට වසර 74ක් සම්පූර්ණ වුණ ඊයේ (06) දිනයේ එක්සත් ජාතික පක්ෂයේ පරිහානියට පත් වුණු සංවත්සරය පැවැත්වුණා. ඒ සංවත්සර උත්සවයට සහභාගි වී තිබුණේ ඉතා කුඩා පිරිසක්. ඇයි ඒ තත්ත්වයට එක්සත් ජාතික පක්ෂය පත් වුණේ? ඒ ගැන රටම දන්න කරුණක් තියෙන්නේ. ජනතා අපේක්ෂා අනුව එක්සත් ජාතික පක්ෂයේ වෙනස්කම් ඇති කරලා, නායකත්වය වෙනස් කරලා තීන්දු තීරණ ගත්තා නම් එවැනි ඉරණමක් අත් වෙන්නේ නෑ.

ආණ්ඩුවට විරුද්ධව ජනමතය ශක්තිමත් කරන්න නම් ආණ්ඩුවට එරෙහි පක්ෂ එක පිලකට පැමිණීම අපේ ප්‍රමුඛ අභිප්‍රායයි. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා නායකත්වය දෙන්නේ සමගි ජන බලවේගයට පමණක් නෙවෙයි. එතුමා නියෝජනය කරන පක්ෂය තමයි සමගි ජන බලවේගය. ඒ හැර එතුමා විරුද්ධ පක්ෂයේ නායකයා වශයෙන් අනෙකුත් සියලු ආණ්ඩු විරෝධී බලවේගවලට, මධ්‍යස්ථ ඡන්දදායකයන්ට, නායකත්වය දෙන්න සජිත් ප්‍රේමදාස මහතා සූදානම්.

අපි ඉස්සරහා බරපතළම අභියෝගය ආණ්ඩුව තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා ජනතාව දුන්නු ජනවරම පෞද්ගලික අභිමතාර්ථයක් වෙනුවෙන් යොදවා ගන්න කටයුතු කිරීමයි. ඒ තමයි 20 වැනි සංශෝධනය. ඒක ජනතා අභිලාෂය නෙවෙයි. ඔවුන් කියන්න හදනවා අපි මැතිවරණයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා කිව්වා, 19 වෙනුවට 20 වැනි සංශෝධනය ගේනවා කියා. නමුත්, ජනතාවට 20 වැනි සංශෝධනය මොකක්ද කියලා න්‍යාය පත්‍රයක් හැටියට ඔවුන් පෙන්නුවේ නෑ.

ඔවුන් කේක් ගෙඩියට අයිසින් දානවා වගේ 20 වැනි සංශෝධනය ගැන සුන්දරත්වයක් මැව්වා. ඒ ගැන අද බරපතල කාරණා ගණනාවක් එළියට ඇවිත්. විශේෂයෙන් ද්විත්ව පුරවැසිභාවය ඇති අයට ව්‍යවස්ථාදායකයට පත් වෙන්න අයිතියක් නෑ. ඒකෙන් ජනාධිපතිවරයාට 03 වැනි වතාවට පත් වීමේ අවස්ථාව නැති කරලා තිබුණා. ව්‍යවස්ථාදායකයට පත් වෙන්නේ අනන්‍යතා දෙකක රටවල පුරවැසියකු නොවේ. දැනට පාර්ලිමේන්තුවට තේරෙන අය පමණක් නෙවේ. අපි හිතුවේ පළාත් සභාවට, ප්‍රාදේශීය සභාවට, රජයේ ඉහළ තැන්වල විගණකාධිපති, පොලිස්පති, අමාත්‍යාංශ ලේකම්, නීතිපති වගේ ඉහළ තනතුරුවලටත් මේ නීතිය ආදේශ කළා නම් කියලා. දූත මණ්ඩල, තානාපති සේවයේ අයත් ද්විත්ව පුරවැසියන් නම් එය වෙනස් කරන්න තිබුණා.

දේශප්‍රේමී සළුපිළි පොරවගෙන මේ වගේ ක්‍රියාවලියක ආණ්ඩුව නිරත වෙයි කියලා අපි කිසි දවසක සිතුවේ නෑ. ද්විත්ව පුරවැසියන්ට වාසි වන විදිහට ව්‍යවස්ථාව වෙනස් කරන්න හදන අයට ඇයි බැරි තමන්ගේ ද්විත්ව පුරවැසිභාවය ඉවත් කරගෙන මේ තනතුරුවලට එන්න? රටේ ජන වරම පාවිච්චි කරනවා තමන්ගේ ද්විත්ව පුරවැසිභාවය රකින්න.

ජනතාව අපේක්ෂා කරන්නේ ඒකද? ජනතාව අපේක්ෂා කරන්නේ ජනතා අභිලාෂ ඉටු කරන නීතියක්. ක්‍රමවේදයක්. හිතුවක්කාර විදිහට පත් කිරීම් කරන්න මේකෙන් ජනාධිපතිට අයිතිය දීලා තියෙනවා. ජනතාව කාලයක් තිස්සේ කිව්වේ රටේ ඇමතිවරු පත් කිරීම, නියෝජ්‍ය ඇමතිවරු පත්කිරීම රටේ ආර්ථිකයට විශාල බරක් කියලා. ව්‍යවස්ථාදායක සභාවේ කාර්යය හෑල්ලු කරලා. රටක නීතියක් සකස් විය යුත්තේ පාර්ලිමේන්තුවේ පාලකයන්ට නොවේ. පුරවැසියන්ටයි. පුරවැසියන්ට හදන නීතියක් වෙනුවට පාලකයන් වෙනුවෙන් නීති සම්පාදනය කරගැනීම බරපතළ වරදක් ලෙස අපි දකිනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි පළමුවෙන්ම අධිකරණ ක්‍රියාවලියකට යොමු වෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

රටේ ආර්ථිකය සෑණ අගයක් වාර්තා වුණත් ආණ්ඩුවට ඕනේ තමන්ගේ බලය වෙනුවෙන් නීති සම්පාදනය කර, පවුල් බලය සහතික කරගැනීමයි. තුනෙන් 02 බලය ලැබිලා ආණ්ඩුව හැසිරෙන්නේ උද්දච්ච ස්වරූපයෙන්. ඒ ජනවරම පාවිච්චි කරන්නේ ජනතාවගේ යහපත වෙනුවෙන් නෙවෙයි. ජනතාව සිහි බුද්ධියෙන් කල්පනාවෙන් වැඩ කරන්න ඕන කාලය එළඹිලා තියෙනවා. මම නැවතත් කියන්නේ ආණ්ඩුවක් අපි ඇති කරගන්නේ ජනතාවගේ යහපතට, ජනතාව රැකගන්නට. ජනතාව ශක්තිමත් කරන්න. පුරවැසි බලය පාවිච්චි කරලා පාලකයන් ශක්තිමත් කරගන්න පමණක් කිසියම් පාලකයෙක් ක්‍රියා කරනවා නම් ජනතාව ඉදිරියේදී එකතු වෙලා එකට හිට ගත යුතුයි. යැයි තිස්ස අත්තනායක මන්ත්‍රීවරයා වැඩිදුරටත් පැවසීය.

## වැඩ බැරි නිසා දැන් ව්‍යවස්ථාවේ ඇඳ හොයනවා

### ඉරාන් වික්‍රමරත්න



**මාධ්‍ය හමුවට සහභාගි වූ ඉරාන් වික්‍රමරත්න මහතා -** මේ සියලු බලය ජනාධිපතිවරයාට එදා වගේම අදත් තියෙනවා. නටන්න බැරි මිනිහට පොළොව ඇදයි කියනවා වගේ දෙයක් තමයි දැන් වෙලා තියෙන්නේ. එදා පාලනයේ හිටපු පුද්ගලයින්ගේ අඩුවක් වුණේ. 20 ගෙනාවාම කැබිනට් මණ්ඩලය වැඩි කරන්නේ නෑ කියලා මම දැක්කා මාධ්‍යයක පළ වෙලා තියෙනවා. එහෙනම් මොකටද ව්‍යවස්ථාව වෙනස් කරන්නේ? ඇමති මණ්ඩලය පත් කිරීම 19න් සීමා කළා. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කරලා. විගණන සේවා කොමිසම අයින් කරලා තියෙනවා 20න්. ජනාධිපතිවරයා තමයි මේ නිසා හැම පත් කිරීමක්ම කරන්නේ. කොමිෂන් සභාවලට පුද්ගලයින් යෝජනා කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය 19න් අහෝසි කරලා නෑ. කොමිෂන් සභාවෙන් නම් කරන පුද්ගලයා නුසුදුසුයි කිව්වොත් ජනාධිපති වෙනත් කෙනෙක් නම් කරන්න ඕනේ. 20න් කියන්නේ ඒක අවශ්‍ය නෑ කියලා.

ඡායාරූපය : කැළුම් ලියනගේ

# 20 ගෙනැවිත් තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ඩෝසර් කරන්න

● නීතිඥ සුනිල් වටගල



නදී මාණික්කගේ

20 වැනි සංශෝධනය ගෙන එන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ඩෝසර් කිරීමට බවත් එක පවුලක බලය තහවුරු කර ගැනීමට රටේ ව්‍යවස්ථාව වෙනස් කිරීම බේදවාචකයක් බවත් නීතිඥ සුනිල් වටගල මහතා පසුගියදා පිටකෝට්ටේ සෝලිස් උත්සව ශාලාවේදී පැවති මාධ්‍ය හමුවේදී පැවසුවේය.

ජාතික ජනබලවේගයේ නීතිඥයන් විසින් මෙම මාධ්‍ය හමුව සංවිධාන කර තිබූ අතර මේ සඳහා නීතිඥ සුනිල් වටගල, නීතිඥ හර්ෂණ නානායක්කාර, නීතිඥ උපුල් කුමරප්පෙරුම යන මහත්වරු සහභාගි වූහ.

පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය, අධිකරණයේ ස්වාධීනත්වය තනි පුද්ගලයකුගේ අතට ගෙන 19 මුළුමනින්ම හකුලා 20 ගෙන ඒමට පවතින රජය ක්‍රියා කරන බවත් සිංහරාජය සහ කුරුණෑගල ඩෝසර් කළා මෙන් 20 හරහා ප්‍රජාතන්ත්‍රවාදය ඩෝසර් කිරීමට කටයුතු කරන බවත් පැවසූ නීතිඥ සුනිල් වටගල මහතා වැඩිදුරටත් මෙසේද කීවේය.

අමාත්‍ය මණ්ඩලය, මන්ත්‍රීවරු ජනාධිපතිගේ සාක්කුවේ දමාගෙන ඉන්නේ. අග්‍රාමාත්‍ය තනතුර හිස් ලියවිල්ලක් බවට පත්කොට තියෙනවා.

මේ සංශෝධනය මඟින් පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය අමු අමුවේ උල්ලංඝනය කරලා පැය 24ක් ඇතුළත අණපනත් සම්මත කරගන්න පුළුවන් නීතියක් ගෙනත් තිබෙනවා. ජනතාවට අධිකරණයට ගොස් එම නීති පිළිබඳ මතයක් විමසන්න අවස්ථාව අහිමි කරලා. මොන ප්‍රජාතන්ත්‍රවාදයක්ද මේක? විශේෂයෙන් විගණකාධිපතිවරයාගේ බලතල අහෝසි කරලා. 19න් ස්ථාපිත කරපු විගණන කොමිසම බල රහිත කරලා. විගණනයක් අවශ්‍ය නැහැ කියලද මේ ආණ්ඩුව කියන්නේ.

**නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා -**

20 වැනි සංශෝධනය කියන්නේ නැවතත් අපි ගල් යුගය කරා යෑමක් ලෙසයි මම දකින්නේ. ඕනෑම දියුණුයි සම්මත රටක බල බෙදීමක් තිබෙනවා. ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියලා. 20 අනුව අග්‍රවිනිශ්චයකාරකවරු පත්කිරීම, අභියාචනාධිකරණ විනිසුරුවරු පත්කිරීමේ බලය, අධිකරණ සේවා කොමිසන් සභාවට සාමාජිකයන් පත්කිරීමේ බලය පවා ජනාධිපති අතට ගන්නවා. සරල වශයෙන් කිව්වොත් අභියාචනාධිකරණ විනිසුරුවරයෙක් ඉහළ අධිකරණයට උසස්වීමක් ලබාගන්න බලාපොරොත්තු වෙනවානම් එය රඳාපවතින්නේ ජනාධිපතිවරයා ඔහු සමඟ කොතරම් සමීපද කියන කාරණය සමගයි. අධිකරණ සේවා කොමිසම් සභාව ගත්තොත් එහි පත්කිරීම් සියල්ල කරන්නේ ජනාධිපතිවරයා විසින්. ජනාධිපතිවරයා විසින් සියලු පත්කිරීම් කරනවා නම් ජනතාවට ස්වාධීන අධිකරණ පද්ධතියක් ඉතිරි වෙයිද? මීට පෙර නීතියක් ගෙනාවොත් එය කියවලා බලන්න සංශෝධනය කරන්න දින 14ක් තිබුණා. දැන් එය දින 07ක් දක්වා අඩු කරලා. ඇතැම් පනත් පැය 72ක් ඇතුලත අගවිනිසුරු වෙත ඉදිරිපත් කරලා රටේ නීතියක් බවට පත්කරන්න පුළුවන්. එවැනි කරුණක් නීතියක් වෙන තෙක් රටේ ජනතාව නොදන්නවා වෙන්නත් පුළුවන්.

ජනතාව 2/3 බලයක් ලබාදුන්නාට අපි හිතන්නේ නැහැ ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු එන්න පුළුවන් විදියට ව්‍යවස්ථාව වෙනස් කරන්න ඒ ජන්දෙ දුන්න ජනතාව කැමතියි කියලා. ඇමෙරිකාව වෙනුවෙන් ආයුධ අතට ගන්න පුළුවන් කියලා දිවුරන කෙනෙක් ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. මේ සංශෝධනය නිසා ඇමරිකන් පුරවැසියකුට ලංකාවේ ජනාධිපති වෙන්නත් පුළුවන්. දේශප්‍රේමී ජනතාව ඒකට කැමති වෙනවාද කියලා අපි විමසනවා.

**නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතා -** විසිවැනි ව්‍යවස්ථා කෙටුම්පතේ තියෙන ප්‍රධාන කාරණා තුනක් ගැන මම කතා කරනවා. ජනාධිපතිවරයාගේ විධායක ක්‍රියාවකට විරුද්ධව නඩු පැවරීමේ හැකියාවක් දහනව වැනි සංශෝධනයෙන් ඇති කර තිබුණා. විසිවැනි සංශෝධනයෙන් එය හැත්තෑ අටේ ව්‍යවස්ථාවට සමාන ප්‍රතිපාදනයක් මගින් ජනතාවට ලබා දිය යුතුව තිබූ එම අයිතිය අහෝසි කර තිබෙනවා.

මම විශ්වාස කරන්නේ මේ විසි වැනි සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් ලබා ගැනීමෙන් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් ලබා ගැනීමෙන් පමණක් සම්මත කර ගත නොහැකි බවයි. ජනමත විචාරණයකට යා යුතුයි. ජනතා පරමාධිපත්‍යය සම්බන්ධයෙන් යම් සශෝධනයකදී ගැටලුවක් ඇති වුණොත් අනිවාර්යයෙන්ම එය ජනමත විචාරණයකින් සම්මත කළ යුතු වෙනවා. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයට එක මන්ත්‍රීවරයෙක් හැර අනෙක් මන්ත්‍රීවරුන් සියලු දෙනා ඡන්දය දීමෙන් ජනාධිපති ධුරය තුලනය හා සංවරණය කියන ක්‍රියාවලියට ඇතුළත් වෙන්න ඕනෑ නිසා. ජනාධිපතිවරයා ජනතාවට වග විය යුතු නිසා.

ඇමති ධුරයක් කියන්නේ දොල පිදේනියක් නොවේය කියන තත්ත්වය තහවුරු කරන්න දහනව වැනි සංශෝධනයෙන් ප්‍රතිපාදන සැලැසුවා. මේ සංශෝධනය අනුව ඇමති මණ්ඩලය සීමා කිරීම අයින් කර ජනාධිපතිවරයාට අවශ්‍ය ඕනෑම ප්‍රමාණයක් කැබිනට් මණ්ඩලයටත්, රාජ්‍ය අමාත්‍යවරුන් ලෙසත් නියෝජ්‍ය අමාත්‍යවරුන් ලෙසත් පත් කරන්න පුළුවන්. අපිට විද්‍යාත්මකව විෂයයන් පෙළගැස් වූ අමාත්‍යාංශ ගොඩනගන්න බැරි ඇයි? අමාත්‍යාංශ සංඛ්‍යාව ඒ මගින් අඩු කරන්නත් පුළුවන්. එහෙම කළොත්, ආණ්ඩුවේ බහුතරයක් සතුටු කිරීමේ හැකියාව පාලකයාට නැති වෙනවා. මේ නිසා ඇමති මණ්ඩලය සම්බන්ධයෙන් දහනව වැනි සංශෝධනයේ තිබුණු සාධනීයම ප්‍රතිපාදන ඉවත් කරලා.

මේ අනුව ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරීමේ අයිතිය තුනෙන් දෙකේ බලයෙන් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මත තීරණය නොවී ජනතාවගේ පරමාධිපත්‍ය බලය ආරක්ෂා කිරීමේ අර්ථයෙන් ජනමත විචාරණයකට යා යුතුයි.

## නැවත ගල් යුගයට යෑමක්

### නීතිඥ හර්ෂණ නානායක්කාර

## ජනමත විචාරණයකට යා යුතුයි

### නීතිඥ උපුල් කුමරප්පෙරුම

# ගතානුගතික සම්ප්‍රදායෙන් එහාට ගිහින් වැඩ කළ යුතු කාලය එළඹිලා

## විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම

**චමීර ඇල්ලදෙණිය**

ගතානුගතික සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් සෞභාග්‍යයේ නව එළිය පතුරුවන්න වැඩ කළ යුතු කාලය එළඹ ඇතැයි විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා පවසයි.

එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම කෙරවලපිටිය යුගදනවි බලාගාරයෙන් ජාතික ජාලයට මෙගාවොට් 300කට වැඩි විදුලි ධාරිතාවක් සැපයීම ලාංකික විදුලිබල ක්ෂේත්‍රයේ වැදගත් සංධිස්ථානයක් බවත් ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ පසුගියදා (03) කෙරවලපිටිය යුගදනවි විදුලි බලාගාරය සහ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ආයතනයේ වත්මන් තත්ත්වය හා ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහභාගි වෙමිනි.

එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම, එහි දශක තුනහමාරකට වැඩි ගමන් මගේ ශක්තිමත් හා ස්ථාවර වර්ධනයක් කරා එළඹෙමින් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සමාගමක් බවට පත්ව තිබේ. ඒ සමාගම වසර ගණනාවක් පුරා විදුලිය ජනනය, විදුලිබල යටිතල පහසුකම් සංවර්ධනය, විදුලිය බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර් හා තාප ගිල්වුම් ගැලවනයිස් කිරීම වැනි ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ සම්පූර්ණ හර පද්ධතිය ආවරණය කරමින් විවිධ අංශ වෙත ව්‍යාපාරය විවිධාංගීකරණයට ලක්කර තිබේ.

එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් සිය දේශීය නිම්වළලු පුළුල් කරමින් බංග්ලාදේශය, ටැන්සානියාව, උගන්ඩාව, කෙන්යාව, ඉතියෝපියාව, ඝානාව, ඕමානය, ඉන්දියාව, නේපාලය, ජෝර්දානය, මියන්මාරය, මාලදිවයින දූපත් හා ඕස්ට්‍රේලියාව වැනි විදේශ රටවල විදුලි බලාගාර සඳහා ආයෝජනය කරමින් හා ඉංජිනේරුමය, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්පූර්ණ කිරීමෙන් සාර්ථකත්වයක් ලබා ඇත. ලංකා විදුලිබල මණ්ඩලයට 63% ක්, සේවක හිමිකාරීත්වය සහිත ටෙක්පෝ ආයතනයට 10% ක් සහ පෙරදෙව් ආයතනයට 27% ක් වශයෙන් එල්.ටී.එල්. හෝල්ඩිංග්ස් ආයතයේ කොටස් බෙදී ගොස් තිබේ.

දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම විදුලිබල ක්ෂේත්‍රයේ දැවැන්තයන් හා තරගකරමින්, විශිෂ්ටත්වයේ හිණිපෙත්ත කරා පැමිණ ඇති බවත් ඇමැතිවරයා පැවසීය. එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සමග සමස්ත දිවයිනටම විදුලි බලය සපයන භාරධූර කර්තව්‍යයට සාර්ථකව උරදෙමින් සිටින බවත්, පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති ස්ථාපනයට සහ සංවර්ධනයටද මහත් පිටිවහලක් වී ඇති බවත් පැවසීය.

එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගම ලංකාවේ විශාලතම ස්වාධීන විදුලිබල නිෂ්පාදකයා වෙමින්, කෙරවලපිටිය යුගදනවි බලාගාරයෙන් ජාතික ජාලයට මෙගාවොට් 300කට වැඩි විදුලි ධාරිතාවක් සපයමින්, දෛනික විදුලි ඉල්ලුමට සුවිශාල දායකත්වයක් සැපයීම ලාංකීය විදුලිබල ක්ෂේත්‍රයේ වැදගත් සංධිස්ථානයක් බවත් පැවසූ ඇමැතිවරයා සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම හා සේවක පිරිස සමාගමේ ආයතනික අරමුණු කරා ළඟාවීම පිණිස ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් සම්බන්ධයෙන් සිය ප්‍රසාදය පළකර සිටියේය.

සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා ඇතුළු විදුලිබල අමාත්‍යාංශයේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

# තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයේ

## පාසල් සංවර්ධන සමිති නව නිල මඬුල්ල

වරකාපොළ තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ වසර 2020 - 2021 නව නිලධාරි මණ්ඩලය පසුගියදා පත් කෙරිණි. මේ ඒ නිලධාරී මණ්ඩලයයි.

සභාපති - ජේ.ඒ.අයි.යූ. ජයකොඩි (විදුහල්පති)
ප්‍රධාන ලේකම් - ප්‍රභාත් කුමාර
භාණ්ඩාගාරික - දීපානි හේරත්

ආචාර්ය මණ්ඩල නියෝජනය (08)
සුනන්දා නාලනී, ප්‍රභා සේනාධීර, ඩී.ජී.අමරසේන, උඩපැල්පිට ඉන්ද්‍රරතන හිමි, මහින්ද ගුණවර්ධන, රුවන් සමරනායක, ඩී.ජී.ගුණරත්න, ලක්මිණී දෙලපොල

මවුපියන් නියෝජනය (08)
අනුර චන්ද්‍රරත්න, කේ.සී.අයි.පෙරේරා, වජිරා කරුණානායක, ආර්.එම්.අයි.පී.රණතුංග, සංජීව ලසන්ත, සමන් පියසිංහ, රංජිත් දයානන්ද, ප්‍රභාත් කුමාර

ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජනය (02)
කේ. මෙත්තානන්ද, නිශ්ශංක බාලසූරිය

විගණන නිලධාරින් (02)
රංජිත් කුමාර, ප්‍රභාත් ලියනගේ මහත්ම මහත්මීන්.

# පින් පැමිණවීමක් සහ දානමය පින්කමක් 13දා

**වාද්දුව සංචාරක**

වාද්දුව තල්පිටිය එක්සත් අවමංගල්‍යාධාර සමිතිය මගින් වාර්ෂිකව පවත්වනු ලබන සමිතියේ සාමාජික සාමාජිකාවන්ට සහ පවුල්වලින් යැපෙන්නන්ට පින් පැමිණවීමට පැවැත්වෙන මහා සාංඝික දානමය පින්කම 35 වන වරටත් මේ මස 13 වැනි දින දවල් සිදු කෙරේ.

මේ පින්කම තල්පිටිය මැදපාර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති විශ්‍රාමලත් විදුහල්පති හැඩිගල්ලේ වජීරනායක හිමිගේ අනුශාසනා පරිදි උතුරු තල්පිටිය දිබ්බැද්දපාර ප්‍රේමකීර්ති ද අල්විස් ගුණානුස්මරණ ප්‍රජා ශාලාවේදී පැවැත්වෙන බව සමිතියේ සභාපති සාමවිනිසුරු විජිත ගාමිණී පෙරේරා මහතා පැවසීය.

# තමාගේ රාජකාරිය හරියට කරනවා නම් කාටවත් කප්පම් දෙන්න අවශ්‍ය නෑ

## බස්නාහිර පළාත් මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති

**නිමල් රාජපක්ෂ**

පෞද්ගලික බස්වල වැඩ කරන කිසිම කෙනෙකු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට හෝ නිලධාරීන්ට කප්පම් මුදල් ලබාදිය යුතු නැතැයි බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති ප්‍රසන්න සංජීව මහතා පවසයි.

එසේ කප්පම් ලබාගන්නා වේලා සටහන්කරුවකු හෝ වෙනත් නිලධාරියකු සිටීනම් ලිඛිතව ඉදිරිපත් කළ යුතු බවත් එසේ සිටියොත් ඔහුට විරුද්ධව දැඩි දඬුවම් පමුණුවන බවද ඒ මහතා කියා සිටී.

පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයේ සභාපති ගැමුණු විජේරත්න මහතා බස්රථවලින් කප්පම් ගන්නා බව පවසමින් නොයෙක් මත ප්‍රකාශ කොට ජනතාව මුළා කිරීමට තැත් කළද එවැනි කිසිදු කප්පම් ගැනීමක් සිදු නොවන බවත්, තම බස්රථයේ උපකරණ, අඩුපාඩුවකින් තොරව සකස් කොට ධාවනය කරන්නේනම් කිසියම් දඬුවමකට යටත් නොවන බවද සභාපතිවරයා පැවසීය.

තමන්ගේ රාජකාරිය නිසියාකාරව ක්‍රියාත්මක කළානම් කාටවත් මුදල් ලබාදෙන්න අවශ්‍ය නැහැ. තමන්ගේ වැරැදි හදාගෙන බස්රථ ධාවනය කළා නම් අධිකාරිය කිසිකෙනකුට ඇඟිල්ල දික් කරන්න අවශ්‍ය නැහැ. තමන් වැඩ කරනවාට පඩියක් ගෙවනවා නම් කිසිවකුට කප්පම් ලබාදිය යුතු නැහැ. පෞද්ගලික බස්රථ ධාවනය කිරීමේදී බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කිසිවකු කප්පම් නොගන්නා අතර නියමිත කාලසටහනට අනුව ධාවනය කරන්නේ නම් කිසිම ගැටලුවක් පැන නොනගින බවත්, කිසිවකු කප්පම් ලබා ගන්නේ නම් ඒ පිළිබඳ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දැනුවත් කළොත් තරාතිරම නොබලා දැඩි දඬුවම් පමුණුවන බවද ප්‍රසන්න සංජීව මහතා වැඩි දුරටත් පැවසීය.


මෙගා පවර් / Mega POWER / மெகா பவர்
දිනුම් වාරය 604
නිල ප්‍රතිඵල
දිනය: 2020.09.06
NLB NATIONAL LOTTERIES

ඉංග්‍රීසි අකුර: A | සුපිරි අංකය: 01 | ජයග්‍රාහී අංක: 17 58 63 72

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| පවර් සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමඟ අංක 4ම ගැළපේ නම් | 14,075,046.80 | 01 |
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | - |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 06 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 128 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 252 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 6,964 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 4,524 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 112,837 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 20,546 |

ලංකාවේ විශාලම සුපිරි ත්‍යාගය
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 233,165,033.15
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 13,391,479.20
දිනා ඇති මුළු මුදල රු. 18,474,066.80

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk




අද...
සැප් 08
ගින්දරී 3
(උදයකාන්ත වර්ණසූරිය)
තරු පිරිවරා
කොළඹ ලිබර්ටි සිනමාහලේ දී
පෙ.ව. 10.30 - ප.ව. 2.30 සහ ප.ව. 7.00
www.scopecinemas.com / www.sarasaviya.lk
SCOPE
සරසවිය
සිනමා සොම්නස
චිත්‍රපට දැක්ම



2020-09-06 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 589,013
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 37,603,056.80
රු. 14,075,046.80 පවර් සුපිරි ත්‍යාග 01 රු. 2,000,000.00 ත්‍යාග 01 රු. 1,000,000.00 ත්‍යාග 01 රු. 100,000.00 ත්‍යාග 25
www.nlb.lk
NLB NATIONAL LOTTERIES



ධන නිධානය
නිල ප්‍රතිඵල
NLB NATIONAL LOTTERIES
දිනය - 2020/09/06
දිනුම් වාරය - 312

ඉංග්‍රීසි අක්ෂරය: B | ජයග්‍රාහී අංක: 27 38 59 71

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 03 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 56 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 99 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 2,996 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 2,035 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 51,211 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 9,496 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,202,840.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 65,896
මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය 116,071,517.84

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD



ගොවි සෙත
නිල ප්‍රතිඵල
NLB NATIONAL LOTTERIES
දිනුම් වාරය 2532 | දිනුම් අදින ලද දිනය 2020.09.06

ඉංග්‍රීසි අක්ෂරය: N | ජයග්‍රාහී අංක: 29 38 58 59

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 03 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 145 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 325 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 8206 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 5430 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 136569 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 24698 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 175,377
මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 6,178,140.00
ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 63,141,509.20

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk



නිල ප්‍රතිඵල
NLB NATIONAL LOTTERIES
සෙවණ
செவண
ඔබට ගෙවල් - අතට මුදල්
உங்களுக்கு வீடு - கைகளில் காசு
දිනය 2020/09/06
දිනුම් වාරය 293

ඉංග්‍රීසි අකුර: F | ජයග්‍රාහී අංක: 32 41 64 65

| | සංයෝග | තෑගි | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- | බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000/- | බැගින් | 05 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- | බැගින් | 69 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 200/- | බැගින් | 130 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- | බැගින් | 3,304 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50/- | බැගින් | 1,835 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- | බැගින් | 45,856 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- | බැගින් | 7,027 |

- ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම් පත අනිවාර්ය වේ.

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,000,000/-
මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,074,810/-

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 70 00 | 011 232 43 24
ෆැක්ස් 011 4669416
වෙබ් www.nlb.lk



දිනුම් වාරය - 4237 නිල ප්‍රතිඵල
NLB
මහජන සම්පත
දිනය: 2020-09-06
ජයග්‍රාහී අක්ෂරය: E | ජයග්‍රාහී අංක: 7 7 5 3 1 9

ත්‍යාග රටාව - අග සිට මුලට

| | ත්‍යාග රටාව | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 7 7 5 3 1 9 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 7 5 3 1 9 | රු. 100,000/- | 08 |
| 3 වැනි ත්‍යාගය | 5 3 1 9 | රු. 10,000/- | 92 |
| 4 වැනි ත්‍යාගය | 3 1 9 | රු. 1,000/- | 881 |
| 5 වැනි ත්‍යාගය | 1 9 | රු. 100/- | 8,967 |
| 6 වැනි ත්‍යාගය | 9 | රු. 20/- | 88,867 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | ත්‍යාග රටාව | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 7 7 5 3 1 | රු. 10,000/- | 06 |
| 8 වැනි ත්‍යාගය | 7 7 5 3 | රු. 1,000/- | 90 |
| 9 වැනි ත්‍යාගය | 7 7 5 | රු. 100/- | 924 |
| 10 වැනි ත්‍යාගය | 7 7 | රු. 50/- | 8,912 |
| 11 වැනි ත්‍යාගය | E | රු. 20/- | 35,508 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 8,673,200.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.32,060,537.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය
ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk



# කඩොලාන රකින අපේ පිළිවෙත

**ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම අද පෙ. ව. 10.00ට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් පරිසර අමාත්‍යාංශයේදී සිදු කෙරේ.**

ලොව ඇති සත්‍ය කඩොලාන ශාක විශේෂ අතරින් තුනෙන් එකක් පමණ දැකගත හැකි මෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතර කඩොලාන සංරක්ෂණයේ හා පුනරුත්ථාපනයේ ප්‍රමුඛයා වශයෙන් ද ක්‍රියා කරන ශ්‍රී ලංකාව කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීම ශක්තිමත් ඉදිරි පියවරක් මෙන්ම ඓතිහාසිකවද වැදගත්ය.

කඩොලාන පරිසර පද්ධතිය යනු සුවිශේෂ සත්ත්ව හා ශාක එකතුවකි. මුහුද හා ගොඩබිම අතර කිවුල්දිය පරිසරයේ නොනැසී පැවැතීමට අනුවර්තනය වී ඇති කඩොලාන ප්‍රජාව අනෙකුත් පරිසර පද්ධති අතරින් විශේෂය. ලොව පුරා වෙරළබඩ ප්‍රජාවගේ යහපැවැත්ම, ආහාර සුරක්ෂිතතාව මෙන්ම ආරක්ෂාව සඳහා මෙම පරිසර පද්ධතිය දක්වන්නේ විශාල දායකත්වයකි. ජෛව විද්‍යාත්මකවද පොහොසත් කඩොලාන පරිසර පද්ධතිය ආර්ථික හා පාරිසරික වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කාබන් තිර කිරීම හා රඳවා ගැනීමට ඇති සුවිශේෂ හැකියාව හේතුවෙන්, මේ වන විට ලෝකයටම අභියෝගයක් වී ඇති දේශගුණ විපර්යාස අවම කිරීම සඳහාද එය දායක වේ.

**කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ විද්වත් කමිටුවේ සභාපති** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය සම්බන්ධයෙන් මෙය බෙහෙවින් වැදගත් බවය.

## විද්වත් කමිටුව

"පරිසර අමාත්‍යාංශය, 2015 දී කඩොලාන සංරක්ෂණ සඳහා විද්වතුන්ගේ කමිටුවක් ස්ථාපිත කළා. ඉන්පසුව අපේ රටේ කඩොලාන සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ යොදාගත හැකි ප්‍රතිපත්තියක් තිබේද යන කාරණය ගැන මේ කමිටුව විමසා බැලුවා. අපට එවැන්නක් තිබුණේ නෑ. දැනටමත් අපට වනජීවී ප්‍රතිපත්තිය, පරිසර ප්‍රතිපත්තිය, තෙත් බිම් පිළිබඳ ප්‍රතිපත්තිය ආදී වශයෙන් ප්‍රතිපත්ති ගණනාවක්ම තිබියදී අලුතෙන් මෙවැනි ප්‍රතිපත්තියක අවශ්‍යතාවක් ඇතිවන්නේ ඇයි කියන එක ඊළඟ වැදගත් කාරණයයි. මෙම විමසා බැලීමේදී කඩොලාන සඳහා වෙනම ප්‍රතිපත්තියක අවශ්‍යතාව අපට පෙනුණා."

ඒ අනුව මෙම ප්‍රතිපත්තිය පිළියෙල කිරීම එවක් පටන් සිදු විය. ඊට මේ හා සම්බන්ධ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය ආදි සියලු රාජ්‍ය ආයතනද, රාජ්‍ය නොවන ආයතන හා සංවිධානද ප්‍රජාවද දායක විය. ප්‍රසිද්ධ දැන්වීම් පුවත්පත් මාර්ගයෙන් පළකරමින් මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයගේ අදහස් ලබාගැනීමද සිදු විය. ආචාර්ය සෙව්වන්දි ජයකොඩි පවසන පරිදි එම සියලු අදහස් මෙහිදී අවධානයටත්, සාකච්ඡාවටත් ලක්වී තිබේ.

## ප්‍රතිපත්ති

"මේ ප්‍රතිපත්තිය පිළියෙල කිරීමේදී ඒ සියලු අදහස්ද සැලකිල්ලට ගනිමින් තමයි එය සිදුවුණේ. එලෙස පිළියෙල කළ මේ ජාතික ප්‍රතිපත්තියට මේ වර්ෂයේ, එනම් 2020 ජනවාරි මාසයේදී කැබිනට් අනුමැතිය හිමි වුණා. කඩොලාන මඟින් සැපයෙන පාරිසරික සේවා හා එම පරිසර පද්ධතියේ වැදගත්කම අන් කිසිදු පරිසර පද්ධතියකින් පිරිමසාලිය නොහැකි බව අපි මේ ප්‍රතිපත්තිය මඟින් රටක් හැටියට පිළිගන්නවා. එය ඉතාමත් වැදගත්.

අපේ රටේ වෙරළ හා සම්බන්ධ වන දිස්ත්‍රික්ක 14ම රාජ්‍ය නිලධාරින්, රාජ්‍ය නොවන අංශ, විශ්වවිද්‍යාල ආදිය සම්බන්ධ වන පරිදි අංශ කිහිපයක් ඔස්සේ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමට පියවර ගත්තා. එහිදී නෛතික කාරණා වගේම කඩොලාන පරිසර පද්ධතියේ ඇති වැදගත්කම ඊට අයත් ශාක හා සත්ත්ව විශේෂ ආදිය ගැන දැනුමක් ලබා දුන්නා. මේ වැඩමුළුවට සමගාමීව ඒ ඒ දිස්ත්‍රික්කවල කඩොලානට ඇති ගැටලු හඳුනාගැනීමත් අදාළ රාජ්‍ය නිලධාරීන් නියෝජනය වන නිසා ඒ ගැටලු නිරාකරණය කරගැනීමට අවස්ථාව සැලසීමත් සිදු වුණා."



ශ්‍රී ලංකාවේ කඩොලාන සංරක්ෂණය පිළිබඳ නීති ඇත්තේ වන සංරක්ෂණ, වනජීවී සංරක්ෂණ, වෙරළ සංරක්ෂණ, පරිසර, ධීවර ආදී විවිධ අණ පනත්වලය. කඩොලාන සංරක්ෂණය සම්බන්ධයෙන් 2018 වසරේදී තවත් වැදගත් පොරොන්දුවක් රටවල් ගණනාවක් හමුවේ ශ්‍රී ලංකාව ලබා දී ඇත. ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය එම වැදගත්කම පැහැදිලි කරන්නේ මෙලෙසය.

"2018 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් හමුවේ කඩොලාන සංරක්ෂණයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට අපි රටක් හැටියට පොරොන්දුවක් ලබා දුන්නා. පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සෙසු රටවල් මෙහිදී අප අනුගමනය කරන ක්‍රියාමාර්ග පිළිබඳ උනන්දුවක් දැක්වීම සිදු වෙනවා. එනම් ඒ රටවලටත් ආදර්ශයක් වන අයුරින් අප මේ සංරක්ෂණ හා තිරසාර භාවිත ක්‍රියාවලියේ නියැළිය යුතුයි."

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විදේශ අමාත්‍යාංශයට ද කාර්යභාරයක් පැවරේ. ඒ පිළිබඳ විදේශ අමාත්‍යාංශයේ සාගරික කටයුතු, පරිසර හා කාලගුණික විපර්යාස පිළිබඳ අංශයේ අධ්‍යක්ෂ ජනරාල් හසන්ති දිසානායක මහත්මිය පවසන්නේ, කඩොලාන සංරක්ෂණය වෙනුවෙන් මෙවැනි ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල වීම පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල කඩොලාන සංරක්ෂණයේ ප්‍රමුඛයා ලෙස අප ආදර්ශයක් ලබා දෙන අවස්ථාවක් බවය.

"පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල නීල ප්‍රඥප්තිය (Common wealth Blue Charter) 2013 දී පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල රාජ්‍ය නායක සමුළුවේදී (CHOGM) සම්මත කෙරුණා. ඒ යටතේ සමුද්‍රීය හා වෙරළාශ්‍රිත පරිසර පද්ධතිය රකගැනීම තිරසර නීල ආර්ථිකයක්, ධීවර කර්මාන්තයක් ආදිය යටතේ ක්‍රියාකාරී කණ්ඩායම් 10ක් පත් කළා. හිටපු ජනාධිපතිතුමා කඩොලාන පරිසර පද්ධති සම්බන්ධයෙන් පත් කළ කණ්ඩායමේ නායකත්වය ශ්‍රී ලංකාව බාරගන්නා බව කියා සිටියා. ඒ අනුව කඩොලාන සංරක්ෂණයේ නියමුවා ලෙස මේ වන විට ශ්‍රී ලංකාව කටයුතු කරනවා."

කලාපීය, අන්තර්ජාතික ආදී ප්‍රඥප්තියත්, සම්මුතියත්, ගිවිසුමක් වැනි අවස්ථාවක ඒවාට අත්සන් තැබීමට අදාළව මෙන්ම වාර්තා පිළියෙල කිරීමේදී ද විදේශ අමාත්‍යාංශයට කාර්යභාරයක් පැවරේ. ඒ යටතේ සාගරික කටයුතු අංශය මඟින් ශ්‍රී ලංකාවේ කඩොලාන සංරක්ෂණයට දායක වීම සිදු වේ.

ලෝකයේ යම් රටක් කඩොලාන සංරක්ෂණය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන පළමු අවස්ථාව මෙය වන පසුබිමක මෙන්ම ලොව පළමු කඩොලාන කෞතුකාගාරය මෙරට පිහිටුවා ඇති පසුබිමක කඩොලාන සංරක්ෂණ නියමු කාර්යභාරය ශ්‍රී ලංකාව වගකීමෙන් ඉටුකරන බවට ලොවට ප්‍රකාශ කළ හැකි කාරණාය. කෙසේ වුවද, එපමණක් ප්‍රමාණවත් බවක් ඉන් අදහස් නොකෙරේ. යහපත් මෙන්ම අගය කළ හැකි එළැඹුම්වලට කැළලක් ඇති නොවන අයුරින් කඩොලාන සම්පත රක ගැනීමේ විශේෂ වගකීමක් රටක් වශයෙන් අපට තිබේ.

ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 16000ක් වැනි භූමි ප්‍රමාණයක ව්‍යාප්තව ඇති කඩොලාන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමි ප්‍රදේශවල මෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ජාතික උද්‍යාන, රක්ෂිත ආදියේද පිහිටා ඇත. එමෙන්ම අදාළ නීති කෘත්‍ය ඉටුකිරීමේදීද වනජීවී හා වෘක්ෂලතා මෙන් වන සංරක්ෂණ පනත් අදාළ වේ. මෙවැනි ජාතික ප්‍රතිපත්තියක් එළිදැක්වීමට හැකිවීමේ වැදගත්කම අගය කරමින් අප සමඟ අදහස් දැක්වූ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ අධ්‍යක්ෂ මංජුල අමරරත්න මහතා කියා සිටියේ, එම සංරක්ෂණ ක්‍රියාමාර්ගවලට මෙය විශාල රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කරන බවය.

"දැනටමත් අපේ ජාතික උද්‍යාන තුළ ඇති කඩොලාන බිම්වලට අමතරව උතුර ප්‍රදේශයේ නාගර්කෝවිල්, වෙඩිතලතිවු, නයාරු වැනි අලුත් රක්ෂිත ඇතිකිරීමටත් දෙපාර්තමේන්තුව පියවර ගත්තා. වනජීවී රක්ෂිත ප්‍රදේශවල ඇති කඩොලාන පරිසර පද්ධති ආරක්ෂිතයි. එහෙත් ඉන් බැහැරව ඉස්සන් කොටු ආදිය සඳහා මේ බිම් විනාශ කරමින් තියෙනවා. මිනිස් ක්‍රියාකාරකම් නිසා හානියට ලක් වූ කඩොලාන බිම් ප්‍රතිස්ථාපනය සඳහා අප ක්‍රියා කරමින් සිටියදී මෙවැනි ප්‍රතිපත්තියක් සම්මත වීම ඉතාමත් වැදගත්. මේ කටයුතුවලදී අපි රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහයෝගිතාව මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති හඳුන්වා දෙනවා. ආනවිලුන්දාවත් එලෙස ප්‍රතිෂ්ඨාපනයට සැලසුම් කළ තැනක්.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ, වන සංරක්ෂක නිශාන්ත එදිරිසිංහ මහතා පෙන්වා දෙන්නේ, ඉස්සන් කොටු, ලුණු නිස්සාරණ බිම්, සංචාරක හෝටල් ආදී නොයෙක් ක්‍රියාකාරකම් හේතුවෙන් තර්ජනයට ලක්වන කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සම්බන්ධයෙන් මෙම පනත ඉදිරිපත් වීම ඉතා හොඳ බවය.

## රැක ගැනීම

දැනට ඇති කඩොලාන රැක ගැනීම මෙන්ම හානියට පත්ව ඇති කඩොලාන බිම් ප්‍රතිස්ථාපනය කිරීමද සිදු වෙමින් පවතී. හානියට පත්ව ඇති කඩොලාන බිම් යළි එළිපෙහෙළි කිරීමට ලබාගත යුතු අවසරයට අදාළ කැබිනට් අනුමැතියත් 2019 දී ලැබිණි. එළිපෙහෙළි වූ බිම්වල ප්‍රතිස්ථාපන කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේද දායකත්වයෙන් සිදුවෙමින් ඇත. විශ්වවිද්‍යාල වැනි ආයතනද ඊට එක්ව සිටී. ඒ සමගම මෙතෙක් සංරක්ෂණය නොවී තිබූ කඩොලාන සහිත භූමි ප්‍රදේශ සංරක්ෂණය කරමින් ඒවා ගැසට් කිරීමද සිදු විය. 2019 වසරේදී පළමු වතාවට ජනාධිපතිවරයකු ගැසට් නිවේදන 54ක්ම එක් දිනක් තුළ අත්සන් තැබුවේද මෙම සංරක්ෂණ කාර්යයන් වෙනුවෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට සංරක්ෂිත කඩොලාන බිම් ප්‍රමාණය ඉහළ ගිය අතර හානියට ලක්ව ඇති කඩොලාන බිම් සංරක්ෂණයට ක්‍රමවේදද සැකසී ඇත.

"නැවත මේ වගා කිරීමේදී නිකම්ම පැළ සිටුවන්න හැකියාවක් නෑ. අපි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් සමග එකතු වෙලා ක්‍රමවේදයක් සකස් කළා. ප්‍රතිස්ථාපනය සඳහා භූමියක් තෝරාගත් පසු ඒ ආසන්නම බිම්වල ඇති කඩොලාන විශේෂ ගැන සොයා බලනවා. එම බීජවලින් තමයි පැළ ලබාගන්නේ. එවිට ඒවා හොඳින් මේ පරිසරයට අනුගත වූ ඒවා බව තහවුරුයි. අපේ රටේ සත්‍ය කඩොලාන 21ක් තියෙනවා. ඒත් මේ 21ම හැම ප්‍රදේශයකම පැතිරිලා නෑ. ඒ ඒ ප්‍රදේශවලට ගැළපෙන විශේෂ තෝරාගත යුතුයි. පසේ ආම්ලිකතාවත් වැදගත්.

## ආර්ථික ප්‍රතිලාභ

ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මියගේ එම පැහැදිලි කිරීම කඩොලාන කැපීම තරම් වැවීම පහසු නැති බව මනාව පැහැදිලි කරයි. එය ඉතා දුෂ්කර ප්‍රයත්නයකි. කොපමණ දුෂ්කර වුවද අදාළ අංශ ඊට කැපවී සිටී. අත්හැර දැමූ ලුණු කොටු, ඩෝසර් කිරීම වැනි ක්‍රියාමාර්ගවලින් සිදුවන්නේ එවැනි වෙහෙසකර ප්‍රයත්න වසර ගණාවක් ආපස්සට හැරවීමය.

කෙසේ වුවද අද පටන් කඩොලාන සංරක්ෂණ මෙන්ම තිරසර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් දියත් වීම මෙම අමිල සම්පත රැකගැනීම මෙන්ම එම පාරිසරික සේවා ද, ආර්ථික ප්‍රතිලාභ ද අත්කර ගැනීම අතිශයින් වැදගත් වනු නොඅනුමානය. දැන් ජාතික ප්‍රතිපත්තියක් තිබේ. එය ක්‍රියාත්මක කිරීම වගකිවයුතු අංශවලට පවරා පසෙකට වීම වෙනුවට අප කාගේත් යුතුකම ඊට අවනත වීම හා ක්‍රියාවට නැංවීමට දායක වීමය. මේ එළැඹ ඇත්තේ අනාගත පරපුර අපෙන් ඉල්ලා සිටින ඒ අසීමිත කැපවීම මේ පොළොව වෙනුවෙන් පුද දීමට කාලයයි.

**ධම්මික සෙනෙවිරත්න**

## නැවත වගාවට උපරිම උත්සාහ ගන්නවා



**පරිසර ඇමැති මහින්ද අමරවීර**

මේ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කිරීම මඟින් දැනට අප සතු කඩොලාන සම්පත් රැකගන්නා අතර, තවදුරටත් ඒවා වර්ධනය කිරීමත්, තිරසර භාවිතයත් අරමුණු කෙරෙනවා. කඩොලාන පරිසර පද්ධතියක් සුවිශාල වැදගත්කමකින් යුතුයි. කලපු ආශ්‍රිතව පිහිටන පරිසර පද්ධතියක් නිසා ගොඩබිම ආරක්ෂා කිරීම වගේම සාගර සම්පත ආරක්ෂා කිරීමත් ඉන් සිදුවෙනවා. ඒ වගේම, කඩොලාන ආශ්‍රිතව මත්ස්‍යයන් බිත්තර දැමීම ආදිය සිදුවන නිසා ධීවර ප්‍රජාවටත් මේ සම්පත රැක ගැනීම තවත් ආකාරයකින් වැදගත්.

ඉඩම් ගොඩකිරීම, හෝටල් ඉදිකිරීම, තවත් නොයෙක් සංවර්ධන කටයුතු වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙය වේගයෙන් විනාශ වන පරිසර පද්ධතියක් වෙලා තියෙන්නේ. එවැනි පසුබිමක මේ වටිනා පාරිසරික සම්පත රැක ගැනීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග අපි ගන්නවා. මේවා විනාශ කරන තැන්වලදී ඒවා කරලා තියෙන්නේ එක්කෝ දේශපාලන හයියක්, නැතිනම් ඇතැම් නිලධාරීන්ගේ උදව් ඇතිව කියලයි අපිට පෙනෙන්නේ. ඒ කෙසේ වෙතත් කිසිම තරාතිරමක් නොබලා එවැනි දේට එරෙහිව පියවර ගන්නවා වගේම කඩොලාන නැවත වගාව සඳහා ගත හැකි උපරිම උත්සාහය ගන්නවා.



## කැලෑ පාළුවන්ගේ බලපරාක්‍රමයට තිත තබමු



පුත්තලම දිස්ත්‍රික්කයේ අගනා ස්වාභාවික පරිසරයට අසුබ දසාවක් ලබා ඇති බවක් පෙනෙන්න තිබේ. පුත්තලමටම ආවේණික ස්වාභාවික කඩොලාන බිම් මෙන්ම රැම්සා තෙත් බිම් කිහිපයක්ම අත්තනෝමතික ලෙස වනසා දමා තිබෙන බව පසුගිය දින කිහිපයේම මාධ්‍ය මගින් අසන්නට දකින්නට ලැබිණි. ජනතාව මෙන්ම පරිසරයත් රැකිය යුතු යැයි අදිටන් කොට ගත් ජනාධිපතිවරයකු ප්‍රමුඛ රජයක් බලයේ සිටින අවස්ථාවක මෙවන් විපත් කෙරෙහි දැඩි අවධානයකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

පුත්තලමේ පළමු පරිසර හානිය වාර්තා වූයේ ආනවිළුන්දාවෙනි. 2001 වසරේ දී රැම්සා තෙත් බිමක් ලෙස නම් කරන ලද ආනවිළුන්දාව මෙරට රැම්සා තෙත් බිම් හයෙන් එකකි. හෙක්ටයාර් 1397කින් සමන්විත ආනවිළුන්දාව දුර්ලභ ගණයේ ක්ෂීරපායි, මත්ස්‍ය, සමනල සහ පුෂ්ප වර්ග රැසකට පෝෂක බිමක්ව පවතියි. මෙරට කඩොලාන පරිසර පද්ධති අතර සුවිශේෂී තැනක් උසුලන ආනවිළුන්දාවේ අක්කර දෙකක පමණ බිම් කොටසක් ඩෝසර් කර ඇති බවට අගෝස්තු මාසයේ අග භාගයේ දී පමණ වාර්තා විය.

ආනවිළුන්දාව රක්ෂිතයේ කොටසක් මෙසේ ඩෝසර් කර ඇත්තේ ඉස්සන් වගාවට බවත් මාධ්‍ය වාර්තා කර තිබිණි. 2001 වසරේ දී රැම්සා තෙත් බිමක් ලෙස නම් කරන්නටත් පෙර සිටම රක්ෂිතයක් ලෙස නම් කර තිබුණු ආනවිළුන්දාවේ එක් කොටසක් ඉස්සන් වගාවට වෙන් කොට තිබුණු බවත් පසුව අතහැර දමන ලද එම බිම් කොටස් නැවතත් අත්පත් කරගැනීමේ අරමුණෙන් මෙම විනාශය කොට තිබුණු බවත් දැනගන්නට තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් මේ වන විට විධිමත් පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙන නමුත් ලොවක ඇගයුමට පත් රැම්සා තෙත් බිමට සිදු වූ හානිය පූරණය කරන්නේ කෙසේද යන්න ගැටලුවකි. ආනවිළුන්දාවේ උණුසුම මැකී යන්නටත් පෙර කල්පිටියේ පල්ලිවාසල්තුරෙයි කලපු තීරය ආසන්නයේ කඩොලාන පරිසරය විනාශ කරමින් ඉස්සන් ටැංකි තැනීමේ සිද්ධියක් ද වාර්තා විය. කලපුව ආසන්නයේ පිහිටි මෙම ඉඩම ප්‍රාදේශීය දේශපාලනඥයකුට වාර්ෂික බදු පදනම යටතේ ලබාදී ඇති එකක් බව කියැවේ.

පැරණි ඉස්සන් ටැංකි යළි සැකසීමේ දී කඩොලාන පරිසරයට හානි සිදුව ඇති අතර ඒ සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට පුත්තලම දිසා වන නිලධාරිවරයා පියවර ගෙන තිබිණි. වැඩි දිනක් යන්නටත් පෙර පරිසරලෝලීන්ගේ සිත් කම්පා කළ තවත් සිදුවීමක් පුත්තලම දිස්ත්‍රික්කයේම වනාතවිල්ලුව, එළුවන්කුලම ප්‍රදේශයෙන් වාර්තා විය. ආනවිළුන්දාවටත් පල්ලිවාසල්තුරෙයි ප්‍රදේශයටත් සිදු වූ හානිය මෙන් සිය දහස් ගුණයක හානියක් එළුවන්කුලම ප්‍රදේශයෙන් මේ සතියේ වාර්තා විය. එළුවන්කුලමේ කරටියාමොහොට්ටේ ප්‍රදේශයේ අක්කර සියයක පමණ භූමි ප්‍රදේශයක පළු, බුරුත, වීර ඇතුළු වටිනා ශාක කපා විකුණා දැමීමට අමතරව ප්‍රදේශය සම්පූර්ණයෙන් ගිනි තැබීමටත් මෙම පිරිස කටයුතු කර තිබිණි. මේ හේතුවෙන් ප්‍රදේශයේ ශාක සහ සත්ත්ව විශේෂවලට සිදුව ඇති හානිය ගණන් බැලිය නොහැකි තරම්ය.

මෙම සිදුවීම් සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානය යොමු වී පරීක්ෂණ ආරම්භ තිබීම ගැන සතුටට පත් විය හැකිය. එහෙත් කණගාටුවට කරුණ වන්නේ එකට පසුව එකක් බැගින් නැවත නැවතත් මෙවැනි සිදුවීම් වාර්තා වීමය. ඒ අනුව කල්පනා කරන විට පරිසර හානිය සම්බන්ධයෙන් පවතින නීති රීතිවල දුබලතා නිසා මෙවැනි දේ සිදුවනවාදැයි ජනතාව තුළ සැකයක් මතු වීම සාධාරණය.

පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කතිකාවක් මතුව ඇති පරිසරය රකින ආයතනවල දුබලතා ඇත්නම් ඒවා නිවැරැදි කිරීම පරිසරය බාර නිලධාරින්ගේ යුතුකමක් හා වගකීමක් බව අමුතුවෙන් කිව යුතු නැත. රාජ්‍ය නිලධාරීන් වශයෙන් ජනතාවගේ පැත්තෙන් සිතා බිය සැක නැතිව තීන්දු ගත යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගියේ සතියේ ප්‍රකාශ කළේය. නිවැරැදි තීන්දු ගන්නා නිලධාරීන් රැකීමට තමන් ඉදිරිපත් වන බවත් ජනාධිපතිවරයා පැවසීය.

රටට පිළිලයක් වී තිබූ අපරාධ රැල්ල මැඩීමට ආරක්ෂක අංශයේ බලධාරීන් ඒ අනුව නොබියව තීන්දු ගනිමින් සිටින බව මේ දිනවල ප්‍රවෘත්ති වාර්තා දෙස බැලීමේදී පැහැදිලිය. රටක් වශයෙන් පාතාලය, මත්ද්‍රව්‍ය ජාවාරම වැනි අපරාධ තුරන් කරන අතරම අප සතුව ඇති ස්වාභාවික පරිසරය ආරක්ෂා කරගැනීම අනිවාර්ය කරුණකි. එබැවින් පරිසරය භාර නිලධාරීන් ද තමන්ගේ යුතුකම ඉටු කරනු ඇතැයි ජනතාව උදක්ම බලා සිටිති.

**ධනුෂ්ක ගොඩකුඹුර**



සමාධි පිළිම වහන්සේ



ප්‍රේමරත්න මහතාගේ නිවෙසේ පැවති කඨින පින්කම

# වේලාසිය දකුණ පුරාණ විහාරයේ පංච මහා සම්බුද්ධ පූජාව



සාමණේර හිමිවරුන් පැවිදි වූ මොහොත



අභිනව ප්‍රාකාරය බැඳි බෝධීන් වහන්සේ



විහාරාධිපති කෝට්ටේ අස්සජි හිමි



කොළඹ ඩී. එස්. සේනානායක විදුහලේ ආදි ගුරුභවතුන් ඉදි කළ චෛත්‍ය රාජයාණන් වහන්සේ



යකල්ලේ ධම්මවංස සාමණේර හිමි

**විමලසේන නම්මුනි - නාත්තණ්ඩිය සමූහ**

පුත්තලම, මදුරන්කුලිය හන්දියෙන් දකුණට හැරී කිලෝ මීටර් 5ක් පමණ නැගෙනහිර දෙසට යද්දී දකුණු වේලාසිය ගම්මානය හමු වෙයි. මුළුමනින්ම කැලෑවකින් වට වූ එළිමහන් විශාල වෙල් යායක් හමු වන දකුණු වේලාසිය ගමට නම ලැබුණේ ද අතීතයේ මේ ගම වෙල් සියයයි, වැව් සියයකින් සමන්විත වූ නිසාය. වෙල් සියය නිසා වේලාසිය නම පටබැඳුණු බව ද පැරැණියෝ කියති.

ගමේ එක් තැනක අවුරුදු 2160ක් පැරැණි ඓතිහාසික නටබුන් හමු වෙයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇස නොගැටුණ ද පුරාවිද්‍යා වස්තූන් රැසක් උරුම කර ගත් මේ භූමිය නිදන් හොරුන්ගෙන් ආරක්ෂා වී ඇත්තේ දේව හාස්කමකින් බව ගැමියෝ විශ්වාස කරති. එතරම්ම ඓතිහාසික වූත් ඉපැරැණි වූත් මේ ගම්මානය මෙතෙක් පුරාවිද්‍යා බලවතුන්ගේ අවධානයට යොමු නොවීම විමතියට කරුණකි.



දුගී අයට සලාක ලබා දෙමින්





2019 සැප්තැම්බර් මස 17 වැනි දින අගනුවර වැඩ විසූ කෝට්ටේ අස්සජි හිමියන් මේ භූමියට වැඩම කරන විට එම නටබුන් වී ගිය දාගැබ සහිත භූමි ප්‍රදේශය අක්කර 5කින් සමන්විත වී මැසි මදුරුවන්ගේ රජ දහනක් බවට පත්ව තිබිණි. පසුව උන් වහන්සේ කැලෑව මඳක් එළි පෙහෙළි කොට පුංචි අසපුවක් තනා එහි පදිංචි වූහ. ජලය, විදුලිය නැති භූමියක හුදෙකලාව කල් ගත කළ අස්සජි හිමියෝ අසල නිවසකින් ලැබෙන සුළු දාන වේලක් වළඳා කටුක දිවියක් ගත කළහ.

'මානිවත්ත අභික්කම'(නොනැවතී ඉදිරියටම යමු) බුදු වදන ඔස්සේ ගමන් කළ උන් වහන්සේ පන්සලට ආධාර පිණිස රුපියල් 50,100 බැගින් වූ ටිකට් පොත් මුද්‍රණය කරවා වෙළෙඳසලෙන් වෙළෙඳසලට යමින් ඒවා අලෙවි කර එම මුදලින් විහාරය ගොඩනැඟීමේ කාර්යය සිදු කළහ. උන් වහන්සේගේ මේ උත්සාහයේ වටිනාකම දැන ගත් ඩී. එස්. සේනානායක විදුහලේ අකුරු කරවූ ආචාර්ය මණ්ඩලය තම සිසුවාට උදව් කළ යුතුය යන්න පෙරදැරි කරගෙන රුපියල් ලක්ෂ 12ක් එකතු කර උන් වහන්සේට පූජා කළේ අසපුවක් තනා ගැනීමටය. තමාගේ සුව පහසුවට වඩා පන්සලක් වේ නම් අසපුවට පෙර ඉදි විය යුත්තේ චෛත්‍යයක් බව වටහා ගත් අස්සජි හිමියෝ ඒ මුදල් වැය කර අලංකාර චෛත්‍යයක් ඉදි කළේය. තම සුව පහසුවට වඩා ශාසනේ පැවැත්ම පෙරට දමමින් උන් වහන්සේ කළ මේ ක්‍රියාව ගුරුභවතුන්ගේ ද නොමඳ පැසසුමට ලක් විය. මේ වන විට පුරාණ විහාරයේ විහාරාංග එකිනෙක ගොඩනැඟීම සිදු කරමින් පැවතිණ.

මේ අතරතුර උන් වහන්සේ ටිකට් පොත් රැගෙන මාදම්පේ ප්‍රදේශයේ කළ සංචාරයේදී වේලාසිය දකුණ පුරාණ විහාරයේ නිමැවුම්කරු වූ මාදම්පේ නව නගරයේ සැම්සන් බේකරිය හිමිකරු වන ප්‍රේමරත්න වටවල මහතා හමු විය. ඒ රුපියල් 100ක ටිකට් පතක් විකුණා ආධාරයක් ගැනීමට යෑමේදීය. පන්සල පිළිබඳ තොරතුරු ඇසූ ප්‍රේමරත්න මහතා වේලාසිය දකුණ පුරාණ විහාරයට යෑමට අදිටන් කර ගත්තේය. පසුවදාම ඒ අදහස ඉෂ්ට කර ගත් ඒ මහතා පුරාණ විහාරය ගැන පැහැදී 'හාමුදුරුවනේ ඔබ වහන්සේ මීට පස්සේ ටිකට් විකුණන්න මහන්සි වෙන්න එපා. මම පුරාණ විහාරයේ ඉතිරි සියලුම වැඩ කර දෙන්නම්.' යැයි පවසා පන්සලෙන් පිටත් විය. වේලාසිය දකුණ පුරාණ විහාරයේ දෙවෙනි උපත ආරම්භ වූ ඒ සිද්ධිය පුරාණ විහාරයේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත් විය.

ප්‍රේමරත්න මහතා යනු තම ව්‍යාපාර සමූහයෙන් උපයන මුදල්වලින් ලාභයෙන් කොටසක් වෙහෙර විහාර ඉදිකිරීමටත්, තම සේවකයන්ට අලුතින් නිවාස ඉදිකර දීමටත්, වාර්ෂිකව නොකඩවා තම උපන් දිනය නිමිත්තෙන් මාදම්පාවේ නැති බැරි අහිංසක පවුල් සඳහා වියළි ආහාර ලබාදීමටත් ඇප කැප වී ක්‍රියා කරන අපේ කාලයේ අනේපිඩු සිටාණන් කෙනෙක් බව මාදම්පා නව නගරයේ පැලවත්ත ප්‍රදේශවාසීහු හඳුන්වති. තම වෙළෙඳ ව්‍යාපාරයේ දුෂ්කර අවදියේ සිට දියුණු අවදිය දක්වාම සෙවණැල්ලක් මෙන් ළඟින්ම සිටි මන්ත්‍රීරත්න නම් සේවක මහතාට රුපියල් ලක්ෂ 10ක් පමණ වැය කර නව නිවෙසක් තනා දුන්නේ මුළු වෙළෙඳ ප්‍රජාවටම ආදර්ශයක් දෙමිනි.

ප්‍රේමරත්න මහතා කෝට්ටේ අස්සජි හිමියන් සමඟ මේ දුෂ්කර පළාතේ අභිනවයෙන් ප්‍රතිසංස්කරණය කළ වේලාසිය දකුණ පුරාණ විහාරයේ වැඩ විසීමට කුල දරුවන් දෙදෙනකු පැවිදි කරමින් සංඝ සමාජයට විශාල මෙහෙවරක් ඉටු කළේය. මේ වන විට එක් සාමණේර නමක් පැවිදි දිවියට සමු දී ඇති අතර යකල්ලේ බුද්ධවංශ සාමණේර හිමි අදත් පුරාණ විහාරයේ වැඩ සිටිති. 14 හැවිරිදි උන් වහන්සේ ළඟදීම දහම් අධ්‍යාපනය සඳහා පිරිවෙනකට ඇතුළු වීමට නියමිතය. මේ මස 17 වැනි දින පෙරවරු 10.35ට එළැඹෙන සුබ මොහොතින් පංච මහා සම්බුද්ධ පූජාව උත්කර්ෂවත් වැඩසටහනක් ඔස්සේ ප්‍රේමරත්න වටවල මහතා අලුතින් එක් කළ විහාරාංග සසුනට පූජා කිරීම සිදු වේ.

මේ උත්සවය දායක සභාව වෙනුවෙන් සභාපති සඳුන් ජයවීර, ලේකම් සහන් රවීන්ද්‍ර සහ භාණ්ඩාගාරික ජී. ජයසේන මහත්වරුන් සංවිධාන කරන අතර වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක වෙහෙරගල රාජමහා විහාර ගණයේ විහාරාධිපති තැන්මැන්නාවැටියේ ධර්මකීර්ති රතනජෝති හිමිගේත්, මදුරන්කුලිය ශ්‍රී සරණංකරාරාම විහාර ගණයේ විහාරාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත මදුරන්කුලියේ රතනජෝති හිමිගේත්, ප්‍රදේශයේ දානපති පින්වතුන් ප්‍රධාන ප්‍රේමරත්න වටවල මහතාගේත්, එම පවුලේ සාමාජිකයන්ගේත් සහභාගීත්වයෙන් සිදු කෙරේ.



මුල්ම චෛත්‍යයේ නටබුන්



ප්‍රේමරත්න වටවල මහතා



ප්‍රේමරත්න මහතා තම සේවකයකුට ඉදි කර දුන් නිවෙසක්



විහාරයට පූජා කළ පිළිම වහන්සේ



පැරැණි ඝණ්ටාරය



නව ඝණ්ටාර කුළුන

# ආනවිළුන්දාව ඇතුළු වටිනා පාරිසරික ස්ථාන විනාශ කරන ව්‍යාපෘති ඇරැඹීම බරපතළ තත්ත්වයක්



## අස්ගිරි පාර්ශ්වයේ අනුනායක ආණමඩුවේ ධම්මදස්සි නාහිමි



අනුනායක හිමියන් අටවිසි බෝධි මන්දිරය විවෘත කිරීමේ අවස්ථාව

**මිහිර විජේසේකර- මාරවිල සමූහ**

ආනවිළුන්දාව ඇතුළු පුත්තලම දිස්ත්‍රික්කයේ පාරිසරික ලෙස වටිනාකමින් යුතු ස්ථාන විනාශ කරමින් විවිධ ව්‍යාපෘති ඇරඹීම නිසා බරපතළ පාරිසරික විනාශයක් සිදුව ඇති බව අස්ගිරි මහා පාර්ශ්යේ අනුනායක ආණමඩුවේ ධම්මදස්සි නාහිමියයෝ පවසති.

අනුනායක නාහිමින් මේ බව පවසා සිටියේ උන් වහන්සේගේ ජන්ම දිනයට සමගාමීව කොට්ටුකච්චිය කච්චිමඩුව ශ්‍රී ගුණානන්ද විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකල අටවිසි බෝධි මන්දිරය විවෘත කිරිමේ අවස්ථාවට සහභාගී වෙමිනි.

පුත්තලම දිස්ත්‍රික්කයේ මේ දවස්වල පරිසර හානිය වැඩි වෙලා තිබෙන බව අපි මාධ්‍ය ඔස්සේ දකිනවා.

ආනවිළුන්දාව විවිධ ව්‍යාපෘති වෙනුවෙන් විනාශ කිරිම බරපතළ තත්වයක්. මේ පරිසර විනාශය තුළින් අපි කරගන්නේ අපිට හුස්ම ගන්න තිබෙන පරිසරය විනාශ කර ගැනිම.

සොබා දහම විනාශ කළා. කොළ පාටට ඇසට ප්‍රිය කරන පාට ඒ දෙවල් වෘක්ෂලතා කොයි තරම් මිනිසාට ශාන්තියක් ඇති කරනවාද? මේ සියල්ලම විනාශ කරගෙන ගියා. මේ නිසා අපිට හුස්ම ගන්න තිබේන ඔක්සිජන් වායුව අඩු කරගෙන අඩු කරගෙන ගියා.

මේ නිසා සොබා දහම ආරක්ෂා කරගෙන අලි ඇතුන්ටත් ජීවත්වීමට ඉඩහසර වෙන් කරලා මේ දේවල් තුළින් අපි ජීවත් වෙන්න තිබෙන පරිසරය ආරක්ෂා කර ගත යුතුයි.

සොබා දහම විනාශ වෙනවානම් එහි ප්‍රතිවිපාක ඔබට අපිට විඳින්න වෙනවා. සොබා දහමත් ආරක්ෂා කරගෙන එහි ආරක්ෂාවත් හදාගෙන යන්න වර්තමාන රජයටත් ජනාධිපතිතුමාටත් අපිට හැකි සෑම වේලාවකදිම දැනුවත් කරන්න කටයුතු කරනවා.

අපි අපේකමත් සංස්කෘතියත් ජාතිකත්වයත් බෞද්ධකමත් රැක ගෙන ජීවත් වීම ඉතා වැදගත්.

සමහර පිරිස් අත්තෝමතික ලෙස වැඩ කරනවා. ධනය හම්බකරමින් සොබා දහම වනසනවා. මේ සියල්ල අපි බල බලා නිහඬව සිටිනවා. නිහඬ වීම තුළින් අපි අපටම වළ කපා ගන්නවා.

මේ නිසා අපේ ජීවිත වලට අන්තරාකාරියි. මේ නිසා අපි රජයට කියනවා සොබා දහම ආරක්ෂා කර ගනිමින් යන වැඩ පිළිවෙළකට යායුතු බව මෙම ස්ථානයෙදි මම අවධාරණය කරනවා .

මම තවත් දෙයක් අද මෙතැනදී කියන්න වුවමනායි මගේ නම ආණමඩුව ධම්ම දස්සි ලෙස සදහන් වුණත් වෙනත් නම් ලෙස ඇත්තේ කොට්ටුකච්චියේ ධම්ම දස්සි ලෙසයි.

ඒ මොකද මම ජන්ම ලාභය ලබා තිබෙන්නේ කොට්ටුකච්චියේ. පැවිදි වෙනකම් මම හිටියේ කොට්ටුකච්චියේ. මේ උස්බිම, කච්චිමඩුව, වඩත්ත, හල්මිල්ලෑව ආදි ප්‍රදේශ වල ඉන්නේ මගේ ඥාතින්.

ඒ නිසයි ජන්ම දිනයට සමගාමිව මම මේ වැඩසටහන් සංවිධානය කරන්න කියලා අපේ වඩත්තේ සෝමානන්ද හිමියන්ට දැනුම් දුන්නේ. ඒ මේ ප්‍රදේශ මට අලුත් ගම් නොවෙයි.

මේ සියල්ලෝම මගේ ඥාතින්. අද මම මේ දරුවන්ට වැඩිහිටියන්ට ලබා දෙන පොත් පත් වියළි ආහාර දින ගනණාවක මදි වෙන්න පුළුවන් නමුත් එය මම හැකි ලෙස ලබා දුන් දෙවල්. ඉදිරියෙදිත් මේ පිංවතුන්ට මම උදව් උපකාර කරන්න කටයුතු කරනවා. යැයි උන් වහන්සේ වැඩි දුරටත් පවසා සිටියහ.

මේ අවස්ථවේදි උන් වහන්සේගේ ජන්ම දිනයට සමගාමිව විහාරස්ථානයේ දරු දැරියන්ට පොත් පත් හා ගම්මානයේ අඩු ආදායම් පවුල් සදහා වියළි ආහාර මලු ලබා දිම සිදුවිය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චින්තක අමල් මායාදුන්න මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# පියාත් සහෝදර සහෝදරියනුත් රැකබලා ගන්නා
## මේ දියණියටත් සාමණේර හිමිනමටත් පිහිට වෙන්න



**සිගිරිය විශේෂ**

ඔත්පළ වූ පියා සහ පවුල රැක බලා ගැනීමට වෙර දරණ දාහත් හැවිරිදි දියණියත් සහ දාහතර හැවිරිදි කුඩා සාමණේර හිමි නමක් පිළිබඳ දුක් මුසු පුවතක් මාතලේ විල්ගමුව නුගගොල්ල ග්‍රාමයෙන් වාර්තා වෙයි.

මෙම නිවෙසේ දරුවන් හතර දෙනෙකු සමග මවු පිය යුවළ ජීවත් වූ අතර හඳුනා නොගත් රෝගයකින් පියා හිදිසියේ ඔත්පළ වී තිබේ.

මව දුරබැහැර පළාතකට ගොස් ඇඟඑම් කම්හලක සේවය කරන අතර කුඩා නංගිලා මල්ලිලා රැක බලා ගැනීමත් පියා හට උවටැන් කිරීම ආදී සියලු කටයුතුත් පැවරී ඇත්තේ දාහත් හැවිරිදි දියණියට සහ දාහතර හැවිරිදි එම පවුලේ වැඩිමල් පුතු වනකුඩා සාමණේර හිමි නමකටය .

දාහත් හැවිරිදි ගීශානි දිල්මි කුමාරනායක සිසුවිය සාමාන්‍ය පෙළ විභාගය සමත්ව උසස් පෙළ විභාගයට පෙනී නොසිට පියාට වේලක් හැර වේලක් හෝ උයා පිහා ලබා දී සිය දස හැවිරිදි සහ අට හැවිරිදි මලනුවන් සහ නැගණියන් රැක බලා ගැනීම සිදු කරන්නීය .

මහනුවර ප්‍රදේශයේ විහාරස්ථානයකදී මීට දෙවසරකට ඉහත දී මහණදම් පුරන්නට ගිය මෙම පවුලේ දෙවැනියා වූ දාහතර හැවිරිදි විල්ගමුවේ ශාසනාලෝක සාමණේර පොඩි හාමුදුරුවෝ ද පියාට උවැටනට නිවසට පැමිණ සිටිති .උන්වහන්සේ ලෙඩ ඇඳේ වැතිරී සිටින සිය පියාගේ පිරිසිදු කිරීම් ආදී කටයුතු සිදුකරති.

දිනකට එක වේලක් සරිකරගන්නා මෙම දරුවන්ගේ අධ්‍යාපනය ද අතරමග නැවතී යෑමේ දැඩි අවදානමක පසුවන බව මෙම නිවසේ භාරකාරීත්වය රැගෙන ක්‍රියාකරන දිල්මි පැවසුවාය.

ඇවිද ගැනීමට නොහැකිව දැඩි අසාධ්‍ය තත්වයේ පසුවන මෙම දරුවන්ගේ පියා වන ආර් කේ .ජී .සද්ධාතිස්ස කුමාරනායක (40 ) හැවිරිදි පියාට අප විසින් රෝදපුටුවක් ලබා දීමට ගිය අවස්ථාවේ දී මෙම පවුල පිළිබඳව තොරතුරු අනාවරණය විය.

මෙම නිවසේ සියලු අවශ්‍යතා ඉටු කරන ගීෂානි දිල්මි අප සමග කියා සිටියේ සහෝදර සහෝදරියන්ට සහ පියාට එක වේලක් ආහාර පිස දී ඇතැම් විට තමා කුසගින්නේ සිටින බවය. කුසගින්නේ සිටීම හුරු වී ඇති බවද ඇය දැඩි සිත් වේදනාවෙන් යුතුව පැවසුවාය. පාසල් ගමන අතරතුරදී තමන් ඇඟළුම් කම්හලක සේවය කරමින් මෙම පවුල තම පවුල ජීවත් කළ බවත් එහෙත් එහිදී විවිධ දුෂ්කරතාවයන් වලට මුහුණ පෑමත් සමග තම මව එම ඇගලුම් කම්හලේ සේවයට යවා තමන් සහෝදර සහෝදරියන් සහ පියා රැකබලාගෙන මෙම නිවසේ රැඳී සිටින බවද ඇය කීවාය.මෙම අසරණ පවුලට පිහිට වීමට ඔබත් දායක වෙන්නේම් එය විශාල කුසලයකි

ලිපිනය ආර් කේ .ජී .සද්ධාතිස්ස කුමාරනායක,80 යාය ,නුගගොල්ල ,සෝනුත්ත, මාතලේ

දුරකථන අංකය 071 39 88883

# නිව් ඩයමන්ඩ් නැවේ
## පරිසර තර්ජනවලට මාතර පෙර සූදානම් වෙයි



**තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ**

ශ්‍රී ලංකාවේ නැගෙනහිර මුහුදු තීරයේ සංගමන් කන්ද තුඩුවේ සිට නාවික සැතපුම් 38 ක් දුර මුහුදේ යාත්‍රා කරමින් තිබූ නිව් ඩයමන්ඩ් නම් ඉන්ධන ප්‍රවාහන නෞකාවේ පසුගියදා ඇති වූ ගින්න හේතුවෙන් මුහුදු ජලයට බොරතෙල් මිශ්‍රවීම හෝ වෙනත් යම්කිසි තත්ත්වයක් ඇතිවුවහොත් එයින් මාතර දිස්ත්‍රික්කයට සිදුවිය හැකි අවදානම පිළිබඳව සොයාබැලීම සඳහා වූ සාකච්ඡාවක් මාතර අතිරේක දිස්ත්‍රික් ලේකම් කසුන් එස්.කේ.වැල්ලහේවා මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ගාමිණී ජයසේකර ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මාතර ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් පැය 24 පුරා ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් මැදිරියක් ක්‍රියාත්මක කර ඇති අතර 0412234134 හා 0412117117 දරණ දුරකථන අංක ඇමතීමෙන් එම මෙහෙයුම් මැදිරිය හා සම්බන්ධ විය හැකි බවත් මෙහි දී අවධාරණය කෙරිණි.

පූර්ව සූදානමක් වශයෙන් මාතරට යම් බලපෑමක් සිදුවේදැයි විමසිල්ලෙන් සිටීම සඳහා වූ කමිටුවක් මාතර ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ලුතිතන් කර්නල් එන්.කේ.පී.කළුබෝවිල මහතාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද අතර මාතර දිස්ත්‍රික්කයට මෙයින් යම් බලපෑමක් ඇතිවුවහොත් දික්වැල්ල, දෙවිනුවර, මාතර හා වැලිගම යන මුහුදුබඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී වසම් 42ට බලපෑම් ඇතිවිය හැකි බව ද අනාවරණය කරන ලදී.

මේ අවස්ථාවට මාතර ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ධීවර කාර්යාලය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා යුද හමුදාව, පොලිසිය ඇතුළු ආයතන රැසක් සහභාගි වී සිටියහ.

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ක්‍රමසම්පාදන අංශය රැස්වීම සංවිධානය කරන ලදී.

# විදුලි බල මණ්ඩලයට ඉඩමක් පවරාගන්නවාට
## ජයබිම ජනපදිකයෝ විරෝධය පාති



**ඊ.සී.ප්‍රනාන්දු. මුන්නේශ්වරම සමූහ**

හලාවත ජයබිම ජානපදිකයන්ගේ සමජ අවශ්‍යතාවන් සදහා වෙන් කර ඇති ඉඩමේ කොටසක් විදුලි බල මණ්ඩලයේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සදහා ලබා දීමට ගෙන ඇති පියවරට විරෝධය පල කරමින් එම ප්‍රදේශවාසිහු පසුගිය සිකුරාදා ( 4 දා ) සාමකාමි විරෝධතාවක නිරත වූහ.

1972 ඉඩම් පවරා ගැනීමේ පනත යටතේ මෙම ඉඩම රජයට පවරා ගත් අතර පසුව එය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරා දෙන ලදී.

ජයබිම සාම විහාරාධිපති සහ හලාවත ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති ආඳාඋල්පත සීලවංශ ස්වාමින් වහන්සේ මේ විරෝධතාව සම්බන්ධයෙන් මෙසේ කිහ.:

එවකට සිටි සමගි පෙරමුණු ආණ්ඩුව විසින් ඉඩම් නොමැති පවුල් වෙත මෙම ඉඩමෙන් පර්චස් 20 බැගින් කොටස් පවරා දෙන ලදි.මේ වන විට මෙහි පවුල් තුන් දහසක් පමණ පදිංචිව් සිටිනවා. පවරා දෙන කාලයේ දි මෙම පවුල් වල පොදු අවශ්‍යතාවන් සදහා අක්කර පහක බිමක් වෙන් කර දුන් අතර අප විහාරස්ථානය පවා එහි පවත්වා ගෙන යනවා.මෙම ඉඩමෙන් විශාල කොටසක් පසුගිතිලයේ දි යම් යම් බලපෑම් මත විදුලි බල මණ්ඩලයේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යන්න නොනිල වශයෙන් යොදා ගෙන තියෙනවා. වන සංරක්ෂණ කාර්යාලයත් මේ වන විට මෙහි පිහිටා ඇත. මේ නිසා දැන් අප ජනතාවට සමාජ අවශ්‍යතාවන් ඉටු කර ගන්න ස්ථානයක් නැති විය හැකියි එම නිසා තමයි ජයබිම ජනතාව මෙම නිහඩ විරෝධතාව පවත්වන්නේ. මෙම ඉඩම වෙනත් කටයුතු සඳහා යොදා නොගෙන ජයබිම ජනතා අවශ්‍යතාවන් සදහා ස්ථිර වශයෙන් වෙන් කර දෙන ලෙස අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

පැයක පමණ කාලයක් විරෝධතාව පැවැත්විණි.

# පෙරියකුලමේ කසිප්පු නිෂ්පාදනාගාරය වටලයි



**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

කිළිනොච්චිය ධර්මපුරම් පෙරියකුලම් ප්‍රදේශයේ ඉතා රහසිගතව පවත්වා ගෙන ගිය කසිප්පු පෙරණ මධ්‍යස්ථානයක් පොලිසිය විසින් ඊයේ වටලන ලදි. කිළිනොච්චියේ පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් හා ධර්මපුරම් පොලීසියේ නිලධාරීහු එක්ව මෙම කසිප්පු නිෂ්පදෙනාගාරය වැටැලූහ.සැකකරුවන් දෙදෙනෙකු සමග කසිප්පු තොගයක් අත් අඩංගුවට ගෙන ඇති අතර එහි දිනකට කසිප්පු ලීටර් 100 ත් 150 ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කළ බවට පොලීසියට තොරතුරු ලැබී තිබේ.

කොරෝනා වසංගත සමයේ මත්පැන් අලෙවි සැල් වසා දමා තිබියදී ආරම්භ කොට ඇති බව කියන මෙම කසිප්පු ජාවාරම මේ දක්වාම ඔවුන් විසින් පවත්වා ගෙන ගොස් ඇති බව ධර්මපුරම් පොලීසිය සදහන් කරයි.

එම ස්ථානයේ තිබී කසිප්පු ලීටර් 176 ක් ගෝඩා ලීටර් 1190 ක් හා බැරල් 7 ක් ද තවත් උපකරණ තොගයක්ද අත් අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් කිළිනොච්චිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කිළිනොච්චිය ධර්මපුරම් පොලීසිය පියවර ගෙන ඇත.

# වායු හිඩැස්වලින් වසර ගණනාවක් ජලය සොරාගත් පහක් අත්අඩංගුවට


**සීගිරිය විශේෂ**

වසර ගණනාවක් තිස්සේ ඉතා හොර රහසේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ප්‍රධාන නල පද්ධතියෙන් පෞද්ගලික කාර්යයන් සඳහා ජලය ලබාගත් පවුල් පහක පුද්ගලයන් පස් දෙනෙකු සැකපිට අත්අඩංගුවට ගෙන දඹුල්ල පොලිසියට භාරදීමට දඹුල්ල ජල සම්පත් මණ්ඩලයට 5 දින පෙරවරුවේ හැකි වී තිබේ.

දඹුල්ල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දඹුල්ල කාර්යාලයේ වැඩ භාර ඉංජිනේරු එස් .එස් .කුලතුංග මහතාට ලැබුණු තොරතුරක් මත දඹුල්ල කණ්ඩලම බකමූණ පාර ප්‍රදේශයේ ජල සොරකම සිදුකරන පිරිස් මෙසේ අත්අඩංගුවට ගෙන ඇත .

ඒ අනුව දඹුල්ල සහ මාතලේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉහළ නිලධාරීන් කණ්ඩායමක් මෙම වැටලීම සිදුකොට තිබේ.

දඹුල්ල නගරයට ජලය සැපයෙන ප්‍රධාන ජල නල වල සුළං පිට වීම සඳහා සවි කොට ඇති ස්ථානයකින් ඉතා සූක්ෂම ලෙස ජල නල යොදා ගෙන මෙම ජලය සොරාගෙන ඇතැයි ජල සම්පත් මණ්ඩලය පවසයි.



දඹුල්ල ජල සම්පත් මණ්ඩලයේ වැඩ බාර නිලධාරී ඉංජිනේරු එස් එස් කුලතුංග මහතා කියා සිටියේ ඉතා සූක්ෂම ලෙස මෙම පවුල් පහක පුද්ගලයින් කාලයක් තිස්සේ මෙම ස්ථානයෙන් විශාල ජල නල යොදා ගෙන රහසිගතව ජලය ලබා ගෙන ඇති බව ය. එමෙන් ම නිවාස ඉදිකිරීම සඳහා ගොවිතැන් කිරීම සඳහා මෙන්ම දෛනික පරිභෝජනය සඳහා ද මෙම පිරිස් ජලය ලබාගෙන ඇති බව පරීක්ෂණවලදී හෙළි වූ බව කුළතුංග මහතා වැඩිදුරටත් සඳහන් කළේය,

අත්අඩංගුවට ගත් සැකකරුවන් සහ එලා තිබූ ජලනල සියල්ල ගලවා ගෙන ගොස් දඹුල්ල පොලිසියට භාරදුන් බවත් මෙම කණ්ඩායමට විරුද්ධව ඉදිරියේදී නීතිමය පියවර ගන්නා බවද ඒ මහතා සඳහන් කළේය.

# මාතලේ පාසල්වල පන්ති 67කට
## පන්ති භාර ගුරුවරුන් නෑ

**සීගිරිය විශේෂ**

දඹුල්ල මැතිවරණ කොට්ඨාසයේ පිහිටා ඇති පාසල්වල පන්ති 67ක දුවා දරුවන් පන්තිභාර ගුරුවරන් නොමැතිව අධ්‍යාපන දුෂ්කරතා වලට මුහුණ පා සිටින බව මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා අධ්‍යාපන ඇමැති ජී එල් පීරිස් මහතාගේ අවධානයට යොමු කර තිබේ.

මාතලේ දිස්ත්‍රික්කයේ බරපතලම ගුරු හිගය දඹුල්ල මැතිවරණ බල ප්‍රදේශයේ පවතින බවත් ඒ මහතා පෙන්වා දුන්නේය. දඹුල්ල මැතිවරණ බල ප්‍රදේශයේ පාසල්වල පන්ති 67ක දරුවන් සඳහා එකම ගුරුවරයෙකු හෝ නොමැති බවද මන්ත්‍රීවරයා අධ්‍යාපන අමාත්‍යය ජීල් පීරිස් මහතා හමුවේ අවධාරණය කර සිටියේය.

මාතලේ දිස්ත්‍රික්කයේ බොහෝ දරුදැරියන් ඒ සමර්ථ අටම ලබා ගත්තද ඉංග්‍රීසි භාෂාව අසමත්වන අවස්ථා ඇති බවද පෙන්වා දුනි.

ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා කියා සිටියේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ජාතික පාසලක් ලබා දෙන රජයේ වැඩපිළිවෙළ යටතේ මාතලේ දිස්ත්‍රික්කයට විශේෂ සැලකිල්ලක් දක්වන ලෙසත් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට ජාතික පාසල් දෙක බැගින් ලබා දෙන ලෙසත්ය.




# තිත්තගල්ල ආගමික මධ්‍යස්ථානයට විරෝධය

**එස් දියගහගේ දකුණු පළාත් සංචාරක**

බෞද්ධාගමේ විනය රීතින් බිඳ දමමින් අහංගම තිත්තගල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යන ආගමික මධ්‍යස්ථානයකට විරෝධය පළ කිරිම සදහා අහංගම නගරයේදී මහා සංසරත්නය සහ ප්‍රදේශවාසිහු එක්ව පෙරේදා විශාල උද්ඝෝෂණයක් පැවැත්වූහ.

මෙහිදී උද්ඝෝෂණයට සහාය පළ කිරිමක් ලෙස උද්ඝෝෂණයපැවති කාලය තුළදී නගරයේ කඩසාප්පු වසා දමා තිබුණු අතර නගරය පුරා කළු කොඩිද ඔසවා තිබුණි.

මෙහිදී උද්ඝෝෂකයෝ ගාල්ල මාතර මහා මාර්ගය මැදට පැමිණ මාර්ගය අවහිර කරමින් උද්ඝෝසනය කිරිම එම මාර්ගයේ වාහන ගමනා ගමනයටද බාධා එල්ල විය.

අහංගම තිත්තගල්ල ප්‍රදේශයේ පවත්වා ගෙන යන මෙම ආගම් විරෝධි මධ්‍යස්ථානය අසලින් වැටී ඇති පොදු මාර්ගයක් මෙම මධ්‍යස්ථානය විසින් ගම්වැසියන්ට පාවිච්චි කළ නොහැකි අන්දමට අවහිර කිරිම නිසා අපහසුවට පත් වු-ජනතාව මේ පිළිබද අහංගම පොලිසියට පැමිණිලි කර තිබුණි. ඒ අනුව එම පැමිණිලි පිළිබද සොයා බැලිමට ඉදිරිපත්වූ අහංගම පොලිස් ස්ථානාධිපති මංජුල සිල්වා කුමාරවඩු මහතාට විරුද්ධව මෙම ආගම් විරෝධි මධ්‍යස්ථානය බොරු ප්‍රචාර ගෙන යෑමට විරුද්ධව මෙම උද්ඝෝසනය සංවිධානය කර තිබුණි. සිවුරු පරෙවාගත් කාන්තාවන් හා පිරිමින් භික්ෂුන්වහන්සේ හා භික්ෂුනීන් වහන්සේ ලෙස මෙම ස්ථානයේ එකට වෙසෙන බවත් මෙය ථේරවාදි බෞද්ධාගමික විනය න්‍යායන්ට පටහැනි සේම බෞද්ධාගමේ පිරිහීමටද හේතුවක් බව උද්ඝෝෂණයට එක්වූ භික්ෂුන්වහන්සේ නමක් කීහ.

මේ දිනවල විශාල වශයෙන් කතා බහට ලක් වන පාරිභෝගික භාණ්ඩ අතර බිත්තරවලට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි.කලින් කලට මිල නගින බහින බිත්තර කොරෝනා කාලයේ රුපියල් දහයක පමණ මුදලකට අලෙවි වුවද ක්‍රමානුකූලව එය ඇගට නොදැනී රුපියල් 22 -25 දක්වා මිලකට ඉහළ ගියේය. ඒත් සමග ම නැවත බිත්තර පිළිබඳ ජනතාව දැඩි කතාබහකට පැමිණියේ සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ආහාර වේලේ ජනප්‍රියතම සහ ලාභදායීම ආහාරය බිත්තර නිසාය. හීයක වේගයෙන් ඉහළ නගිමින් තිබූ බිත්තර මිල පිළිබඳ අවධානය යොමු කළ අගමැතිතුමන් පාරිභෝගිකයාගේ පැනයට සහ නිෂ්පාදකයාගේ පැනයට විසඳුමක් සපයනු පිණිස පැවැත්වූ සාකච්ඡාවකදී බිත්තර මිල රුපියල් දෙකකින් පහත හෙළීමට නිෂ්පාදකයන් එකගතාවකට පැමිණියේ පාරිභෝගිකයාට සුභාරංචියක් සමගය. සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයේ නිලධාරීන් හා අගමැති මහින්ද රාජපක්ෂ මහතා අතර හමුවේදී බිත්තර මිල පහත හෙළීමට කටයුතු කරන ලෙස අගමැතිවරයා කළ ඉල්ලීමට කෂණික ප්‍රතිචාර ලැබුණි. ඒ අනුව රතු බිත්තරයක මිල රුපියල් 18.50ක් ලෙසද සුදු බිත්තරයක මිල රුපියල් 18.00ක් ලෙසද මිල නියම කෙරුණි. අද අප කතා කරන්නේ මිල නගින මිල බහින බිත්තර ගැනය.



## බිත්තර වෙළෙඳාමේ ඉතිහාස කතාව

ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට බිත්තර ආනයනය සම්බන්ධයෙන් කොළඹින් ඇසෙන ඉපැරණිම කතාව ඉන්දියාවෙන් පැමිණ මෙරට බිත්තර තොග වෙළෙඳාමේ නිරත වූ ඉන්දියානු නාඩාර් පරම්පරාව හා සම්බන්ධය. එවකට රටේ මුළු බිත්තර අවශ්‍යතාවම ආනයනය කෙරුණු අතර දින කිහිපයක් තිස්සේ තූත්තුකුඩි සිට රුවල් නැව්වලින් කොළඹට බිත්තර ප්‍රවාහනය කළ ඇත්තන්ගේ මුහුදු ගමන ඉතා කටුක වූවකි.

ඒ බිත්තර තොග කොළඹ සිට රටපුරා බෙදා හරිනු ලැබූ කේ. ජී. එන් හෙවත් කානා ඥාවන්නා ඇන්ඩ් කම්පැනිහි සමාරම්භකයා වශයෙන් නල්ලයියා නාඩාර් සැලකෙයි. සුදු ජාතිකයන් මෙරට පාලනය කළ 1931දී එම සමාගම ලියාපදිංචි වී තිබේ. එකල කොළඹින් මඩකළපුව, නුවරඑළිය ආදී දුරබැහැර පළාත්වලට ද බිත්තර ප්‍රවාහනය කෙරුණේ මේ පිරිසේ මෙහෙයවීමෙනි. 1960දී ඉන්දියාවෙන් බිත්තර ආනයනය නවතා දැමූ පසුව මෙරටදී කුඩා කුඩා වශයෙන් ගොවිපළ අරඹන ලදී. මුලින්ම ජා ඇළ, පමුණුගම, පිළියන්දල වැනි ප්‍රදේශවල ඇති කෙරුණු කුඩා කුකුළු ගොවිපළ පසුව වඩාත් ව්‍යාප්ත වූයේ වයඹ පළාත තුළ ය. මෙසේ රට තුළ ව්‍යාප්ත වූ බිත්තර ව්‍යාපාරය අද වන විට දැවැන්ත සමාගම් දක්වා පැතිරීගොස් ඇත.



# මිල නගින මිල බහින බිත්තරේ විස්තරේ

## බිත්තර මිල තීරණය වන්නේ මෙහෙමයි

සත්ත්ව ආහාර සැපයීමේ නිරතව සිටින්නන් සේම සතුන්ගේ වැඩීමට උපකාර වන විටමින් හා ඖෂධ අලෙවියේ නිරත පිරිස් ද බිත්තරයක වෙළෙඳපොළ මිල තීරණය කරන කර්මාන්තයේ පංගුකරුවන් ය. වර්ෂ එකහමාරක පමණ කාලයක් දිනපතා සතුන්ගෙන් බිත්තර ලැබුණ ද එහි මිල ඒකාකාරී නො වේ. බ්‍රොයිලර්, ලේයර් වශයෙන් දෙවර්ගයක් වුවද ඉන් බිත්තර ලැබෙනුයේ ලේයර් වර්ගයෙනි.

රතු සහ සුදු වශයෙන් වර්ණ ගැන්වුණ ද රතු බිත්තර තරමක් මිලෙන් වැඩි ය. ඊට හේතු දක්වමින් ගොවිපළ හිමිකරුවන් පවසන්නේ එම සතුන්ට වැඩිපුර ආහාර සැපයිය යුතු බව ය. සුදු ඒවා වැඩිපුර ආපන ශාලා වලින් මිලදී ගැනේ. බිත්තරයක් කල් තබාගෙන ආහාරයට ගත හැකි කාලය දින 21ක් පමණ වේ. එහෙත් ඉන් උපරිම ඵල නෙළා ගැනීම නම් ගොවීන්ට තවමත් ගැටලුවකි. ඒවා තොග වශයෙන් එක්රැස් කර ගැනීමට සතියක් පමණ කාලයක් ගොවිපළවලදී ගත වේ. එමෙන්ම, ඉන්දියාවේ කිකිළි බිත්තරවලට වඩා තරමින් විශාල ලංකාවේ බිත්තර පෝෂ්‍ය ගුණය අතින් ද ඉදිරියෙන් සිටියි.

බිත්තර මිල වැඩි වීම සහ අඩු වීම ගැන ජනතාව විවිධ අදහස් දක්වති. මේ විවිධ ප්‍රදේශවල පාරිභෝගික ජනතාව බිත්තර මිල ගැන අපට කියූ ආකාරයයි.



ගණේමුල්ල ටවුමේ බිත්තරයක මිල රු. 23යි. විශේෂ උත්සව සමයක් නොවෙන මේ කාලේ එසේ වීම මට පුදුමයි. රු. 8ට පවා තිබුණු බිත්තර රු. 18 මට්ටමටවත් ගෙන එන්න බලධාරීන් මැදිහත් වීම ගැන සතුටුයි.

**ජී. ඒ ආනන්ද**



බත්තරමුල්ලේ එකක් රු. 22 ගණනේ විකිණෙන්නේ.කොරෝනා කාලේ රුපියල් දහයයි. ඒ කාලේ රුපියල් දහයට විකුණන බිත්තර එකපාර වැඩිවුණා. මේකට සාධාරණ මිල ක්‍රමයක් තිබිය යුතුමයි.

**කේ. එන්. ඩී. සිල්වා**



මං හොරණ ඉඳන් කොළඹ ඇවිත් බුලත් විට විකුණීමයි රක්ෂාවට කරන්නේ. දැන් පුවක් ගෙඩියක මිල රුපියල් 20කට ආසන්නයි. එවැනිම තත්ත්වයක් තමයි මේ දිනවල බිත්තරවලටත් තියෙන්නේ. ඒ තරමට මිල වැඩි වීමට බලපෑ කරුණු බොහොමයක් ඇති. ඒවාට නිසි පිළියම් යෙදිය යුතුයි. බිත්තරයක මිල රුපියල් දහ අටක් දක්වා අඩුවීම හොඳයි.

**ඩබ්. අනුලාවතී**



## තොග වෙළෙඳුන්ගේ කතාව



**ඩී. ජේ මඩවල - සභාපති, ලංකා එග් සෙන්ටර් කොළඹ පිටකොටුව.**

'මං අවුරුදු 38ක් මේ ක්ෂේත්‍රයේ නිරතයි. අවුරුදු 80ක් තරම් ඉතිහාසයක් කොළඹ බිත්තර තොග අලෙවිය සම්බන්ධයෙන් තියෙනවා. 1983 වර්ෂය වන විට නුවරඑළිය, මඩකළපුව වැනි ප්‍රදේශවලට ද තොග අලෙවිය සිදු කෙරුණා. ඉල්ලුම සහ සැපයුම අතර නිතරම බිත්තර මිල දෝළනය වෙනවා. ඒ බව සතිපතා මිල නියම කිරීමේදී සැලකිල්ලට ගත යුතුයි. දිගු කලක් ඒ පිළිබඳ කටයුතු කළේ අපි. ඒත් දැන් එසේ නෙවෙයි. සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයයි මිල තීරණය කරන්නේ.

බිත්තර පාලන මිලක් නියම කිරීම සංකීර්ණ කාරණයක්. ඊට වෙළෙඳපොළ පිළිබඳ හොඳ වැටහීමක් අවශ්‍යයි. මස්- මාළු, එළවළු මිල ගණන්, නිවාඩු දින වගේම සමාජ වාතාවරණය ආදිය එහිදී සැලකිල්ලට ගත යුතු වෙනවා. අප පාලන මිල සම්බන්ධව කටයුතු කළ කාලයේදී සඳුදා දින අප සතියකට අදාළව මිල නියම කරනු ලැබුවා.

වැඩි ලාභයක් තබා ගැනීමෙන් එහා කරුණු රාශියක් සැලකිල්ලට ගනු ලැබුවා අපි. එසේම අදට ආදර්ශයක් ද වෙනවා.මේ සම්බන්ධව කොමිටියක් පත් කිරීම එක් පිළියමක්. පශු සම්පත් අමාත්‍යංශය යටතේ පවතින ගොවිපළවලින් බිත්තර සපයා ගැනීමට කටයුතු කිරීම ද ඊට තවත් පිළියමක් වෙයි බිත්තර පාලනය හොඳයි. **නාඩාර් පරපුර මෙරට බිත්තර තොග අලෙවියේ ප්‍රමුඛයන් ලෙස සැලකෙයි.ඔවුන්ගේ සිව්වැනි පරම්පරාව කොළඹ, බංගසාල වීදියේ අදටද දක්නට ලැබේ. වසර 130ක බිත්තර වෙළඳාමේ අත්දැකීම් ඔවුන් සතුය.කේ. ජී. එන් එග් සෙන්ටර් එවැනි අතීතයකට උරුමකම් කියන පරපුරකින් පැවත එන්නකි.එහි කළමනාකාරිත්වය දැක්වූ අදහස් මෙසේ යි.**

'තව සති 2ක් තුළ දැනට ඉහළ ගොස් තිබෙන බිත්තර මිල යම් තරමකින් පහළ යනු ඇතැයි අප විශ්වාස කරනවා. එහෙත් කුකුළු ගොවිපළ කර්මාන්තයට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය,යෙදවුම් ආදියේ මිල මේ වන විට ඉතා ඉහළයි. එසේම අප තොග වශයෙන් ගෙනෙන බිත්තර ඇසුරුම සහ ප්‍රවාහනය සඳහා විශාල වියදමක් දරනවා. බිත්තර 200 කට වඩා වැඩිපුර අසුරන ලී පෙට්ටියක් අප මිලට ගන්නේ රුපියල් 180කට. සේවකයන් ගණනාවකට අප වැටුප් ගෙවිය යුතුයි.ඒ නිසා හැමදේම ගැන සලකලා බිත්තර මිල තීරණය කරනව නම් හොඳයි.



## බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමය බිත්තර මිල ගැන කියන දේ

**බිත්තර පිළිබඳ කතාවේ වැඩිපුරම අවධානය යොමු වන පිරිසක් වන්නේ සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයයි. එහි සභාපති, ආර්. එම් සරත් රත්නායක ය. මේ ඔහු 3500 ක් පමණ වන සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් දක්වන අදහස් ය.**

'දෙමසකට පෙර තිබුණාට වඩා දැන් දෙගුණයකින් පමණ තිරිඟු, නිවුඩු කුඩු, සුනු සහල්, දහයියා මිල ගණන් ඉහළ ගිහින්. පැටවුන්ගේ මිල දශකයකට පමණ පෙර තිබුණාට වඩා දැන් දස ගුණයකින් ඉහළ ගිහින්. ඒ ගැටලු දරාගෙනයි කඩා වැටී තිබුණු ගොවිපළවල්වලට අප පණ දී තිබෙන්නේ. එසේ නොවන්නට මේ කර්මාන්තයේ නිරතව සිටි පවුල් සංඛ්‍යාවෙන් අඩකටම ජීවනෝපාය අහිමි වෙනවා. එහෙත් අපි රුපියල් 16 සිට තොග මිලට සපයනවා.එය එසේ තිබියදී බිත්තරයක් රුපියල් 28 බවට මැසිවිලි නැඟීම වැරදියි. සුපිරි වෙළෙඳසැලේ එසේ විය හැකි වුවත් සාමාන්‍ය ජනතාවට රුපියල් 21කට බිත්තර අලෙවි කොට ලාබ ද ලැබිය හැකි තත්ත්වයක් වෙළෙන්දන්ට තිබෙනවා.

එසේම, රටේ ඕනෑම තැනක වෙළෙඳ සැළකට තොග මිලට රුපියල් 19 බැගින් බිත්තර සැපයීමට අප කටයුතු කරනවා. වයඹ පළාතේ අපේ ගොවිපළවලට පැමිණෙන තොග වෙළෙඳුන්ට රුපියල් 18 හෝ 18. 50 මිලට අවශ්‍ය තොග සැපයීමට අප සූදානම්.



ඒ සමහරු එක බිත්තරයකින් රුපියල් 1.50ක ලාභයක් තබාගෙන ප්‍රවාහනයෙන් පසුව පිට පළාත්වල අලෙවි කරන්නේ රුපියල් ලක්ෂ එකහමාරක් ලාබ තබාගෙන.අතරමැදියන් නිසා සිදුවන ඒ මිල ඉහළ යෑම හුග දෙනකුට පෙනෙන්නේ නැහැ.

එවැනි පටු අරමුණු සහිත වෙළෙන්දන් තමයි, මුලින් ගොවියාවත් අවසානයේ මහජනතාවත් මහ පාරට වට්ටන්නේ. ආපන ශාලාවලින් රුපියල් 10 තරම් අඩු මිලට බිත්තර අලෙවි කළ සමයේදී ආහාරපානවල මිල දැනෙන තරමට අඩු කළේ නැහැනේ. දැන් බිත්තර මිල ඉහළ ගිය බව පවසමින් ආහාර මිල වැඩි කරන ඔවුන් පාවිච්චි කරන්නේ රුපියල් 16 තරම් අඩුම තොග මිලට පවතින බිත්තර බව සමහරු තවම දන්නේ නැහැ.

අප විශ්වාස කළ පරිදිම වර්තමාන රජය අපට විශාල සහන සලසා දෙනු ලැබුවා. සය මසක කාලයක් සඳහා අපේ ණය අයකර ගැනීම නවතා දැමීම වෙනුවෙන් මැදිහත් වූ ජනාධිපතිතුමා ඇතුළු රජයට අප ප්‍රණාමය පුද කරනවා. ඒ අනුව රුපියල් 2කින් බිත්තර මිල අඩු කිරීමට කටයුතු කරනවා.



මං මට්ටක්කුලියේ පදිංචි අවුරුදු 15ක් තිස්සේ සිල්ලර වෙළෙඳ සලක් පවත්වාගෙන යන කෙනෙක්. බිත්තරවල ඉල්ලුමේ අඩුවක් මට දැනෙන්නේ නෑ. ඒත් රතු බිත්තර සැපයුමේ තරමක අඩුවක් මට පෙනෙනවා. ඒවාට ගෘහස්තව වැඩි ඉල්ලුමක් තියෙනවා. සුදු බිත්තර වැඩිපුර ආපන ශාලාවලින් ඉල්ලන්නේ. කොහොම වුණත් කලින් කලට බිත්තර මිල ඉහළ පහළ යනවා. ඒක සාමාන්‍ය දෙයක්.

**ජේ. ඒ සේන**

## බිත්තර මිලට විසඳුමක්

දැන් බිත්තර මිල රුපියල් දෙකකින් අඩු වී තිබේ තිබේ. ඒ අනුව ජනතාවට සහනයක් ඒ හරහා උදාවේ. දිනකට බිත්තර විශාල ප්‍රමාණයක් භාවිත කරන නිවෙසකට මෙම ආර්ථික ප්‍රතිලාභය තදින් දැනෙයි

ඒ අනුව බිත්තර මිල ස්ථාවරව තබා ගැනීම ජනතාවගේ බලාපොරොත්තුවයි. බිත්තර වෙළඳාමෙන් ලාභය ලැබීම වෙළෙන්දන්ගේ බලාපොරොත්තුවයි. මෙම දෙපාර්ශ්වයම බේරාගනිමින් ස්ථාවර විසඳුමක් සෙවීම රජයේ වගකීමයි. ඒ අනුව කුකුළු ආහාරවල මිල පාලනය,බිත්තර පෙට්ටි සඳහා සහන මිලක් ලබාදීම සහ කුකුළු පාලනය සඳහා විධිමත් වැඩපිළිවෙළක් සැකසීම කළ හැකිය

එවිට නිර්මාංස ආහාර වේලක රස බලන්නන්ට හැර අනෙක් සෑම අයටම බිත්තරයක රස බැලීමට හැකි වනු ඇත.

**නුවන් මහේෂ්**

**ඡායාරූප - රංජිත් අසංක**

## ආසියානු ක්‍රීඩා උලෙළට වූෂු නවක ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීමේ පරීක්ෂණයක්

එළැඹෙන 2020 සැප්තැම්බර් මස චීනයේ හංජෝ නුවර පැවැත්වෙන 19 වෙනි ආසියානු ක්‍රීඩා උලෙළ ශ්‍රී ලංකා නියෝජනය සඳහා වූෂු නවක ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමේ පරීක්ෂණයක් ඔක්තොබර් සහ නොවැම්බර් මස තුළදී පවත්වන බව ශ්‍රී ලංකා වූෂු සම්මේලනයේ සභාපති මානෙල් ධර්මකීර්ති මහතා පවසයි.

විශේෂ පරීක්ෂණයන් දෙකක් ඔක්තොබර් මස මස 10 සහ 11 දින මහනුවර දිගන ගෘහස්ථ ක්‍රීඩා පිටියේ සහ ඔක්තෝම්බර් 31 සහ නොවැම්බර් 01 දින මාතර කොටවිල ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවැත්වේ.

වයස අවුරුදු 18 ත් 25ත් අතර තරුණ තරුණියන්ට අයදුම් කළ හැක. නොඑසේනම් පරීක්ෂණය පැවැත්වෙන දෙදින තුළ උදෑසන පරීක්ෂණය සඳහා පැමිණ සහභාගී විය හැකි බවද ශ්‍රී ලංකා වූෂු සම්මේලනය පවසයි. ජාතික සංචිතයට තෝරාගන්න ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට චීන ජාතික විශේෂඥ පුහුණුකරුවන් යටතේ ශ්‍රී ලංකාවේදී සහ චීනයේදී විශේෂ පුහුණු සැසියන්ට සහභාගී විමේ අවස්ථාවද සලසා ඇති බව සභාපතිවරයා පවසයි. වැඩිදුර තොරතුරු සඳහා 0750355108 සහ 0710432592 යන දුරකථන අංක මගින් ලබාගත හැකිය.

## වෛද්‍යපීඨ වෙත සිසුන් 350කට වැඩිපුර අවස්ථාව

රජයේ විශ්වවිද්‍යාල වෛද්‍යපීඨ වෙත ඇතුළත් කරගන්නා සිසුන් සංඛ්‍යාව 350කින් ඉහළ නැංවීමට ඉකුත් දින (04) අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් පීරිස් මහතාගේ සහ වෛද්‍යපීඨාධිපතිවරුන් සමඟ පැවති සාකච්ඡාවකදී තීරණය වී ඇත.

සරසවි ප්‍රවේශ අවස්ථා ලබාදෙන සිසුන් සංඛ්‍යාව පසුගිය වර්ෂවලට වඩා සැලකිය යුතු අන්දමින් ඉහළ නැංවීමට පියවර ගන්නා ලෙස අධ්‍යාපන ඇමැතිවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් සිදුකළ ඉල්ලීමකට අනුව මෙම තීරණය ගෙන ඇත. මෙම තීරණය ගෙන ඇතතේ ඒ සඳහ අවශ්‍ය පසුබිම සහ හැකියාව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ වෛද්‍යපීඨ සහිත සියලු රජයේ විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් සහ පීඨාධිපතිවරුන් සමඟ කළ සාකච්ඡා වට කිහිපයකින් අනතුරුවය.

ඒ අනුව 2019 වසරේ පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල වෛද්‍යපීඨ සඳහ සිසුන් ඇතුළත් කිරීමේදී පසුගිය වර්ෂවලට සාපේක්ෂව වැඩි සිසුන් ප්‍රමාණයකට ප්‍රවේශ අවස්ථා ලබාදීමටත්, ඒ තුළින් රටේ මානව සම්පතට එක්වන අනාගත වෛද්‍යවරුන් සංඛ්‍යාව ඉහළ නැංවීම මෙහි අරමුණ වේ.

මෙම සාකච්ඡාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, උප සභාපති ජනිතා එන් ලියනගේ මහත්මිය ඇතුළු පිරිසක් එක් වූහ.

■ ඒ.පී.දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## සූර් වී යතුරුපැදියක් පදවලා

මත්පැන් පානය කර යතුරු පැදියක් පැදවූ පුද්ගලයකු ඌරුබොක්ක පොලීසියේ රථවාහන අංශයේ නිලධාරින් විසින් පසුගිය 04 දින මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වරදකරු බවට පිළිගත් අයට මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශශිකා මිතුන ආරච්චි මෙනවිය විසින් රුපියල් විසින්පන්දහසක (25000.00)දඩ මුදලක් ගෙවන ලෙසට නියම කළාය.දඩ මුදලට අමතරව රියැදුරු බලපත්‍රය මාස තුනකට අත්හිටු වීමට මෙහිදී නියෝග කෙරිණි.මෙසේ දඩ මුදල් සහ රියැදුරු බලපත්‍රය අත්හිටවනු ලැබුවේ ඇහැල කන්ද තිබ්බොටුව කංකානම්ගේ ලලිත් කුමාර යන අයටයි.

## අම්පාරේ දෙමළ භාෂාව කථා කරන ජනතාවට වෙනම දිස්ත්‍රික්කය පිළිබඳ යෝජනාවක් 2015දී ඉදිරිපත් කළා

### පාස්කු කොමිසමේ සාක්ෂි දෙමින් රවුෆ් හකීම් පවසයි

**සුභාෂිණී සේනානායක**

අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයේ දෙමළ භාෂාව කථාකරන ජනතාවට වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ලබාදෙන ලෙස වන යෝජනාවක් 2015 වසරේ පත්වූ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රමුඛ යහපාලන රජයට ඉදිරිපත් කළ බව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රාවුෆ් හකීම් මහතා පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ සොයාබැලීමට පත්කළ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ අනාවරණය කළේය.

මෙය දීර්ඝකාලීනව ඉදිරිපත් කර තිබූ යෝජනාවක් බවත් මුස්ලිම් කොංග්‍රසයද එයට කැමැත්තෙන් සිටි බව කියා සිටි ඒ මහතා ඒ සඳහා යහපාලන රජය පත්කිරීමට මුස්ලිම් කොංග්‍රසයේ සහාය දැක්වූ බවද කොමිසම හමුවේ කියා සිටියේය.

මෙය ජාතීන් අතර සංහිඳියාවට එරෙහි වන කාරණයක් ලෙස මම දකින්නේ නෑ. එය සංහිඳියාවට බාධාවක් නොවෙයි. දේශපාලන වශයෙන් ජනතා අභිලාෂයන් අපේ නායකත්වය ලබාදීම ජාතිවාදී ලෙස හෝ රටේ ජනතාව අතර විරසකයක් ඇතිකරන ලෙස හුවා දැක්වීම සුදුසු බව මම සිතන්නේ නෑ යැයිද ඒ මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

මෙය ඔලුවිල් ප්‍රකාශනයේ කොටසක් ද යන් රජයේ නීතිඥවරයා රාහුෆ් හකීම් මහතාගෙන් ප්‍රශ්න කර සිටි අතර එය එසේ විය හැකි යැයිද රාහුෆ් හකීම් මහතා කියා සිටියේය.

මෙම ඉල්ලීම දේශපාලන ඉල්ලීමක් ලෙස පැමිණියා. භාෂාමය ලෙස තම කටයුතු කරගැනීමට කරන ඉල්ලීම දේශපාලන වශයෙන් කරන ඉල්ලීම සාධාරණ බව තමා පිළිගන්නා බවද ඒ මහතා කොමිසම හමුවේ අවධාරණය කළේය.

1977 හින්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමෙන් නැගෙනහිර ජනතාවට විශාල අසාධාරණයක් වුණා. බලය බෙදීමට තීරණය කිරීමෙන් මුස්ලිම් අගවරුන්ට තියක් සිදුවුණා.

ආයුධ සන්නද්ධව සිටි දෙමළ ජනතාවගේ මූලික ඉල්ලීමට පරස්පරවීම සුදුසු නොවන නිසාත් මුස්ලිම් ජනතාව අවි අතට ගනීවි යන උපකල්පනය නිසාත් දිවන්ගත අශ්රොෆ් මහතා මුස්ලිම් කොංග්‍රසය පිහිටුවූවා. උතුරු නැගෙනහිර ඒකාබද්ධවීම සිදුවුණේ නැත්නම් ඔලුවිල් ප්‍රකාශය කරුණු අවශ්‍ය වන්නේ නැහැ. උතුරු නැගෙනහිර වෙන්වූ පසු එම ඉල්ලීමට තිබූ ආකර්ශනය දැන් අඩුවී තිබෙනවා. මුස්ලිම් ජනතාවට වෙනම දේශපාලන අනන්‍යතාවක් තිබෙන බව පිළිගත යුතු යැයිද රාහුෆ් හකීම් මහතා කොමිසම හමුවේ වැඩිදුරටත් අනාවරණය කළේය.

## කඩුවෙල නිවෙසක් මතට පස් කන්දක් කඩා වැටී තරුණියක් මියයයි

පැවති අයහපත් කාලගුණ තත්ත්වය සමඟ බලපෑ වර්ෂාව හේතුවෙන් කඩුවෙල කොතලාවල පාසල් මාවතේ නිවෙසක් මතට පස් කන්දක් සමඟ තාප්පයක් කඩා වැටීමෙන් කඩා වැටීමෙන් විසි දෙහැවිරිදි තරුණියක් මිය ගොස් තිබේ.

බරපතළ තුවාල ලැබූ ඇගේ මව මේ වන විට කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබයි.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## ටිපර් රියේ ගැටී ආබාධිත කත එතැනම මරුට



යාපනය සංගුපිටිය ප්‍රධාන මාර්ගයේ තනන්කිලප්පු ප්‍රදේශයේදී යතුරු පැදියක් ටිපර් රථයක ගැටීම නිසා යුද්ධයෙන් ආබාධිත කාන්තාවක් 6 දා දහවල් සිද්ධිය වූ ස්ථානයේදීම මියගොස් තිබේ.

යුද්ධයෙන් පාදය අහිමිව ගිය එස්.මලර්දේවී නැමති හතළිස් නව හැවිරිදි කාන්තාවක් සිය යතුරු පැදියෙන් චාවාකච්චේරියේ සිට පුනරීන් දෙසට ගමන් කරමින් සිටියදී මෙම අනතුරට පත්ව තිබේ.

මියගිය කාන්තාවගේ කෘත්‍රිම පාදය අනතුර සිදුවූ ස්ථානයට මීටර් පනහක් පමණ ඈත මාර්ගයේ වැටී තිබූ අතර මේ අනතුර හේතුවෙන් කාන්තාව පදවා ගෙන ගිය යතුරු පැදියටද දැඩි අලාභ හානි සිදුව තිබේ.

මියගිය කාන්තාවගේ මළ සිරුර චාවාකච්චේරි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කොට ඇති අතර චාවාකච්චේරි පොලීසිය මෙම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ගෙන යයි.

■ කල්පිටිය සමූහ

## පුත්තලම කලපුවේ එළූ දැල් කුඩු 370ක් දැලේ



පුත්තලම කලපුවේ එළා තිබුණු කූඩු දැල් කට්ටල 370ක්, පසුගිය දා සන්ධ්‍යාවේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තුමේන්තුවේ පුත්තලම කායාලයේ නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන තිබිණි. මේ සඳහා කල්පිටිය විජය නාවික හමුදා නිලධාරීන්ගේ සහාය ද ලැබී තිබිණි.

මෙම වැටලීම පිළිබඳව අදහස් දක්වමින්, පුත්තලම සහකාර ධීවර අධ්‍යක්ෂ සරත් චන්ද්‍ර නායක මහතා මෙසේ පැවසුවේ ය.

1996 අංක දෙක දරන ධීවර හා ජලජ සම්පත් පනතට අනුව, සහ මිරිදිය කළමනාකරණ නියෝග අනුව දැල් ඇස් ප්‍රමාණය මිලිමීටර 80 ට අඩු දැල් ඇස් සහිත දැල් පරිහරණය තහනම්. මෙම කූඩු දැල් ඇස මිලිමීටර හතරක් පමණ කුඩායි. එම නිසා මේ දැල මසුන්ට මර උගුලක්. කුඩා මත්ස්‍ය පැටවුන් මේ දැලට හසු වෙනවා.

අනෙක් අතට අනෙකුත් ධීවර කාර්මිකයන්ට මෙම දැල් ඇටවුම් විශාල අවහිරයක්. ඔවුන්ගේ දැල්වල පැටලවෙනවා.

අත් අඩංගුවට පත් සියලු දැල් අධිකරණයට ඉදිරි පත් කිරීමට නියමිතය.

මෙම වැටලීම සහකාර ධීවර අධ්‍යක්ෂ සරත් චන්ද්‍ර නායක මහතාගේ මෙහෙයවීමෙන්,ප්‍රාදේශීය ධීවර පරීක්ෂක බෝයගොඩ,ධීවර නිලධාරීන් වන සුසන්ත පෙරේරා,තාරක නදීශාන්, නිපුන් සංජීව, සමන් පුෂ්ප කුමාර එරංග වීරකෝන් සහ සනත් ප්‍රියන්ත යන නිලධාරීන් විසින් සිදු කරන ලදී.

■ එච්.පී.කරුණාරත්න - අලුවිහාර සමූහ

## අර්තාපල් බීජ මෙරටේම නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක්

අර්තාපල් බීජ අවශ්‍යතාව රට තුළින්ම නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා තීරණය කර ඇත . ගුණාත්මක බීජ අර්තාපල් සපයා ගැනීමේ අපහසුව පිළිබඳව කන්දඋඩරට අර්තාපල් ගොවීන් විසින් කළ මැසිවිල්ලකට අනුව මෙම තීරණය ගත් බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසයි .

මේ යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අර්තාපල් වගාකරුවන් මගින් බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීමට යෝජිතව තිබේ . අර්තාපල් බීජ නිෂ්පාදනය සඳහා ගොවින්ට අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදෙස් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් මගින් ලබාදීමට නියමිත අතර බීජ නිෂ්පාදන අර්තාපල් වගාකරුවන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම කෙරෙහි රජයේ අවධානය යොමුකර තිබේ .

යෝජිත වැඩ පිළිවෙළ යටතේ දිවයිනේ අර්තාපල් වගාව සඳහා අවශ්‍ය සියලු බීජ අර්තාපල් රට තුළින්ම නිෂ්පාදනය කිරීමට මේ වනවිටත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට උපදෙස්දී තිබේ . මේ වනවිටත් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සිදුවන බෝංචි බීජ නිෂ්පාදන ගොවීන්ට මුහුණපෑමට සිදුව ඇති ගැටලු අවමකර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටද ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා තීරණයකර ඇත .

■ ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ





## එළුවන්කුලමට ගිනි තබා ඇත්තේ පොල් ගැට ගසා බාර හාර වෙලා

පොල් ගෙඩි දෙකක් හා කොළ අත්තක් එල්ලා භාරයක් වී සිදුකළ පරිසර විනාශයක් පිළිබඳව පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් එළුවන්කුලම මංගලපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් වාර්තා වෙයි .

මේ පරිසර විනාශය මෙලෙස සිදුකර ඇත්තේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක වන අතර එම භූමිය අක්කර සියයකට වැඩි බව වාර්තා වේ . මේ භූමියේ සියලු ගස් කපා ගිනිතබා මේ පරිසර විනාශය සිදුකර ඇත.

මීට වසර කීපයකට පමණ පෙර මේ අක්කර පන්දහසක් පමණ වන මේ

ඉඩම වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව මගින් ලංකා සිමෙන්ති සංස්ථාවට බදු දී ඇති අතර ඔවුන් විසින් තවත් පෞද්ගලික ආයතනයකට මේ ඉඩම බදු දී තිබේ. මෙලෙස කපා දමා ඇති විශාල ගස් ප්‍රමාණය දහසකට වැඩි අතර එසේ කපා දැමු ගස් ගිනි තබා ඇති අයුරුද දක්නට ලැබිණි. මෙලෙස කපා දැමු ගස් අතර පලු, වීර, මාදං, තේක්ක ඇතුළු වටිනා ගස් වර්ග රැසකි. මෙලෙස කපා දමා ගිනි තබා ඇති ඇතැම් ගස් වට අඩි හත අට ඉක්මවන වසර හාර පන්සියයක් පැරණි ගස් වන බවද පරිසර සංවිධාන නියෝජිතයෝ පෙන්වා දෙති.

06 දහවල් මේ ස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා පරිසර සංවිධාන , සිමෙන්ති සංස්ථාවේ නිලධාරීන් හා වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් පැමිණි

අතර සියලු දෙනා මේ විනාශය හෙළා දැක කතා කරන ලදී.



මෙසේ එළි කරන ලද ප්‍රදේශයේ නිවාස කීපයක්ද ඉදිකර ඇති අයුරු දක්නට ලැබිණි. මීට අමතරව බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් කැණීම් කීපයක් කර ඇති අයුරුද දක්නට ලැබිණි. මේ බැකෝ යන්ත්‍ර ඊයේ දහවල් වන විට මේ භූමියෙන් ඉවත් කර ගැනීමටද පියවර ගෙන තිබිණි.

මෙහි දී වයඹ හඬ පරිසර සංවිධානයේ සම්බන්ධීකාරක අජිත් ගිහාන් මහතා ප්‍රකාශ කළේ මේ විනාශය ලංකාවේ මෙතෙක් සිදුවූ විශාලතම පරිසර විනාශය බවයි . අද වන විට පුත්තලමේ විශාල පරිසර විනාශයක් වෙනවා . මේ පරිසර විනාශය සුළු පටු නැහැ .ලොකු කුඩා සියලු ගස් කපා දමා ගිනි තබා තිබෙනවා . මේ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි . මම දන්නා විදිහට විල්පත්තුවේ වත් මෙතරම් විනාශයක් සිදු වුණේ නැහැ . මේ ඉඩම් බදු ගත්තු ආයතන වලටත් ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරිනුත් මේ සඳහා වගකිව යුතුයි .

මේ පිළිබඳව සොයා බැලීම සඳහා පැමිණි ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති ගාමිණී ඒකනායක මහතා ප්‍රකාශ කළේ මේ ඉඩම මේ වන විට තම ආයතනය විසින් පෞද්ගලික

සමාගමකට බදු දී ඇති බවයි . මෙතරම් විනාශයක් සිදුවන තෙක් මේ ප්‍රදේශයේ කිසිදු නිලධාරියෙක් මේ බව නොදැන සිටීම පුදුමයට කරුණක් බවත් පැවසීය .

ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති ගාමිණී ඒකනායක මේ පිළිබඳව වනාතවිල්ලුව පොලීසියටද පැමිණිල්ලක් කර ඇත .

මේ පිළිබඳව කළ විමසීමේදී වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ පුත්තලම නිලධාරියකු කියා සිටියේ මේ වගකීම ඇත්තේ ලංකා සිමෙන්ති සංස්ථාවට බවයි .

■ විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

## මාතර කඩවත් සතර ප්‍රා.ලේ කොට්ඨාසයේ උපාධිධාරීන් 404කට පත්වීම්



සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රැකියා විරහිත මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උපාධිධාරීන් 404 දෙනකුට පත්වීම් ලිපි ප්‍රදානය කෙරිණි.

වසරක පුහුණුව ලැබීමට නියමිත පත්වීම්ලාභීන් අදාළ අංශවල අධීක්ෂණය මත නායකත්ව සංවර්ධනය , කළමනාකරණ කුසලතා සංවර්ධනය , පෞද්ගලික අංශ කාර්ය අධ්‍යයනය හා රාජ්‍ය අංශ ආයතන කාර්ය අධ්‍යයනය යන කරුණු යටතේ පුහුණුව ලබාදෙනු ලබන අතර අනතුරුව එම පිරිස ස්ථිරව අනුයුක්ත කෙරෙන රාජ්‍ය ආයතනය වෙත අනුයුක්ත කර රැකියාගත පුහුණුවක් ලබාදීමට නියමිතය. පත්වීම් ලිපි ප්‍රදානය මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් දීපිකා ගුණරත්න මහත්මිය අතින් සිදුකෙරිණි.



## මාර්ග හරහා දිය දහරා ගලා යෑමෙන් වාහන ධාවනයට බාධා

අධික වැසි පතනයත් සමග හාලිඇළ මාවත් හරහා ජල ධාරා ගලා යෑම නිසා වාහන ධාවනයට බාධා සිදු වුණි. හාලිඇළ ඔය පිටාර ගැලීමෙන් ජල ධාරා හාලිඇළ නගරයේ පහත් බිම් හරහා ගලා ගිය අතර හාලිඇළ-කන්දෙගෙදර මාවත ජලයෙන් යටවී තිබූ අයුරුයි මේ.

**සේයාරුව-ජී.පී.ඒ.වීරසූරිය -බදුල්ල දකුණ සමූහ**

■ කේ.ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

## වනාතවිල්ලුවේ පරිසර විනාශයට වගකිය යුතු පිරිසට නීතිය ක්‍රියාත්මක කරන්නැයි වයඹ පරිසර සංවිධාන ජනපතිට කියයි

වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, එළුවන්කුලම කුරටියාමොට්ටේ ප්‍රදේශයේ සිදුකර ඇති දැවැන්ත වන සංහාරයට වගකිව යුතු පිරිස් වෙත නීතිය ක්‍රියාත්මක කරන්නැයි වයඹ පරිසර සංවිධාන කිහිපයක් ජනපතිට ඉල්ලීම් කරති.

වනාතවිල්ලුව කුරටියාමොට්ට ප්‍රදේශයේ පිහිටි වසර සිය ගණනක් පැරණි මෙම වනාන්තර පද්ධතිය සංවිධානාත්මක පිරිස් දේශපාලඥයන්ගේද ආධාර අනුබල ඇතිව මෙම වනාන්තර පද්ධිතය වනසා ඇති බවත් මේ පිළිබඳව නිසි අවධානය යොමු කරන්නැයි“ වයඹ පරිසර හඬ,සංවිධානයේ සභාපති විල්පොත ප්‍රේමානන්ද හිමියන් වන සංහාරය දැක ගැනීමෙන් පසුව මාධ්‍යයට පැවසීය.

මේ ස්ථානයට පැමිණි හරිත පරපුර පරිසර සංවිධානයේ කැඳවුම්කරු දිලංක සේනානායක මහතා පවසා සිටයේ පුත්තලම දිස්ත්‍රික්කය පුරා මේ වන විට පරිසර විනාශය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවයි .මේ සියලු පරිසර විනාශයන් පසුපස දේශපාලඥයින් හා ඔවුන්ගේ ගෝල බාලයන් සෘජුව හා වක්‍රව සම්බන්ධව ඇති බවට තොරතුරු ලැබී ඇති බවයි.

මෙහිදී අදහස් දැක්වමින් වයඹ හඬ පරිසර සංවිධානයේ සංවිධායක අජිත් ගිහාන් මහතා පවසා සිටියේ මෑත කාලයේ පුත්තලම දිස්ත්‍රික්ක තුළ සිදුවූ දැවැන්තම වනාන්තර විනාශය මේ වන විට කුරටියාමෝට්ටේ සිදුව ඇති බවයි.

ඒ පිළිබඳව ජනාධිපති වරයාගේ නිසි අවධානය කඩිනමින් යොමු කරන්නැයිද ඔහු පවසයි.

# ශ්‍රී ලංකා පිලේ ද. අප්‍රිකා ටෙස්ට් තරග අත්හැර දෙසැම්බරයේ ඕවර් 10 ක්‍රිකට් තරගාවලියක්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකාව හා දකුණු අප්‍රිකාව අතර පැවැත්වීමට නියමිතව තිබූ ටෙස්ට් තරග දෙකකින් යුත් තරග සංචාරය වෙනුවට එම කාලය තුළ ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර ඕවර් 10 (T10) ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සැලසුම් කරයි. කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකා පිලේ දකුණු අප්‍රිකා ටෙස්ට් සංචාරය කල් දැමීමට සිදුව ඇති අතර ඒ වෙනුවට ඕවර් 10 ක්‍රිකට් තරගාවලිය පැවැත්වීම වෙනුවෙන් දකුණු අප්‍රිකාව ද, සහයෝගය පළකොට ඇතැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා මහතා 'දිනමිණ' ට පැවැසීය.

නොවැම්බර් මස 14 වැනිදා ආරම්භ වන ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය දෙසැම්බර් මස මුල සතියේදී අවසන් වන බැවින් මෙම ජාත්‍යන්තර ඕවර් 10 ක්‍රිකට් තරගාවලිය සංවිධානය කිරීම පහසු වේ. මෙම තරගාවලියට සහභාගී වීම උදෙසා රටවල් කිහිපයක් සමග සාකච්ඡා සිදු කරමින් පවතින අතර බොහෝ විට යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුව හොත් ජාත්‍යන්තර ඕවර් 10 ක්‍රිකට් තරගාවලියක් සඳහා රටවල් කිහිපයක සහභාගීත්වය ලැබෙන පළමු අවස්ථාව මෙය වනු ඇත.

දකුණු අප්‍රිකාවට බලපා ඇති කොරෝනා වසංගත තත්ත්වය බරපතල හෙයින් දෙසැම්බර් මාසයේ දී ටෙස්ට් තරග සංචාරය ක්‍රියාත්මක කිරීමේ ඉඩකඩක් නොමැති බව තහවුරු වී ඇත. දෙසැම්බර් 12 වනදා ශ්‍රී ලංකා කණ්ඩායම දකුණු අප්‍රිකාව බලා පිටත්ව යෑමට නියමිතව තිබූ අතර පළමු ටෙස්ට් තරගය දෙසැම්බර් 18 වනදා ආරම්භ කිරීමට කටයුතු යොදා තිබිණි.

මේ අතර ලංකා ප්‍රිමියර් ලීග් (LPL) විස්සයි-20 ක්‍රිකට් තරගාවලියට සහභාගීවන කණ්ඩායම් 5ක තරගාවලි කළමනාකරණයට සහ මෙහෙයවීමට අයි. පී. ජී. (IPG) (Innovative Production Group) ආයතනය සමග ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගිවිසුමකට එළැඹ ඇත. එම කණ්ඩායම් 5 මිළදී ගන්නා හිමිකරුවන්ගේ අයිතිවාසිකම්, රූපවාහිනී විකාශනය, නිෂ්පාදනය ඇතුළු අයිතීන් පිළිබ මෙහෙයුම් කටයුතු ඩුබායි හී පිහිටි එම ආයතනය විසින් සිදු කරනු ලබයි.මේ අතර ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියට සහභාගීවන' ගාලු ග්ලැඩියේටර්ස් (Galle Gladiators) කණ්ඩායමට පාකිස්තානයේ හිටපු සුපිරි ක්‍රිකට් ක්‍රීඩක සහිඩ් අෆ්රිඩි හා සෆ්රාස් අහමඩ් ක්‍රීඩා කිරීමට ගිවිසගෙන සිටිති. එම කණ්ඩායමේ අයිතිකරු පාකිස්තානයේ ව්‍යාපාරිකයකු වන නදීම් ඕමාර් මහතා වේ.



# අසංග සෙනෙවිරත්න ආසියානු රග්බි විධායක කමිටුවට



ආසියානු රග්බි සංගමයේ විධායක කමිටුවට අසංග සෙනෙවිරත්න මහතා පත් වෙයි. ඔහු එම තනතුරට පත් වූයේ මේ වසරේ මුල් භාගයේදී එම කමිටුවේ සාමාජිකයකුව සිටි ඉන්දුනීසියාවේ ගොන්ඩෝ ගම්බිරෝ එම තනතුරෙන් ඉවත් වීමෙන් පසු පුරප්පාඩු වූ තනතුරට ඔහුගේ නම යෝජනා කිරීමට ශ්‍රී ලංකා රග්බි ආයතනයේ විධායක කමිටුව ඒකමතිකව තීරණය කිරීමෙනි.

ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි අසංග සෙනෙවිරත්න මහතා විධායක කමිටුවට ඇතුළත් කළ බව නිවේදනයක් නිකුත් කරමින් ආසියානු රග්බි සංගමය ප්‍රකාශ කළේය.

මීට වසර දෙකකට පෙර ද ආසියානු රග්බි සංගමයේ විධායක කමිටුවට ඇතුළත් වීමට අසංග සෙනෙවිරත්න මහතාට අවස්ථාව තිබුණද, පසුගිය කාලයේ රග්බි ආයතනයේ නිලධාරීන් එම අවස්ථාව ඉවත දැමූ බවත්, එසේ නොවූවා නම් ඔහුට මෙරට රග්බි ක්‍රීඩාව වෙනුවෙන් වැඩි දායකත්වයක් ලබාදීමට හැකියාව තිබූ බවත් ඔහුගේ නව පත්වීම සම්බන්ධව අදහස් දැක්වූ රග්බි ආයතනයේ ප්‍රකාශකයෙක් පැවැසීය.

වසර 2012 සිට 2017 දක්වා ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ සෙනෙවිරත්න මහතා මේ වන විට ජාතික ඔලිම්පික් කමිටුවේ උපසභාපතිවරයා ද වේ.

# බට්ලර් එංගලන්තය දිනවයි

ප්‍රවේගකාරී පිතිහරඹයක නිරත වූ ජොස් බට්ලර් සංචාරක ඔස්ට්‍රේලියාවට එරෙහිව පැවැති දෙවැනි විස්සයි20 තරගයෙන් කඩුලු 6ක ජයක් එංගලන්ත පිලට අත්කර දීමට සමත් විය. සදම්ප්ටන්හී පෙරේදා පැවැති මේ තරගයේ ජයග්‍රහණයත් සමග තරග 3 කින් සමන්විත විස්සයි20 තරගාවලිය 2-0කින් ජය ගැනීමට එංගලන්තය සමත් වූයේ තවත් තරගයක් ඉතිරිව තිබියදීමය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් ඔස්ට්‍රේලියාව නියමිත ඕවර 20 අවසානයේ කඩුලු 7ක් දැවී ලකුණු 157ක් රැස් කළ අතර, එංගලන්තය ඕවර 18.5කදී තරගය ජයගත්තේ කඩුලු 3ක් පමණක් අහිමි කර ගනිමිනි.

එංගලන්තය ජයග්‍රහණය දක්වා රැගෙන ගිය ආරම්භක පිතිකරු ජොස් බට්ලර් පන්දු 54කදී නොදැවී ලකුණු 77ක් රැස් කළේ හතරේ පහර 8ක් සහ හයේ පහර 2ක් සමගිනි. පළමු කඩුල්ල ලකුණු 19දී බිඳ වැටීමෙන් පසු බට්ලර් සමග එක්වූ ඩේවිඩ් මාලන් ලකුණු 42ක් රැස් කළ අතර, දෙවැනි කඩුල්ලට ලකුණු 87ක සම්බන්ධතාවක් ද ගොඩ නැගුවේය.

මීට වසර හතරකට පෙර ශ්‍රී ලංකාවට එරෙහිව මේ ක්‍රීඩාංගණයේදීම නොදැවී ලකුණු 73ක් රැස් කරමින් සිය විස්සයි20 තරග දිවියේ ඉහළම ලකුණු සංඛ්‍යාව පසු කර යෑමට ද බට්ලර් සිය ඉනිමේදී සමත් විය.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel
ඔබ සමඟයි. සැමදා.

**42 වන ඔබ්සවර් - මොබිටෙල්**

**වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020**

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මඟින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..............................
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..............................
**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**
පාසල : ..............................
ඔබේ නම : ..............................
ලිපිනය : ..............................
ජංගම දුරකථන අංකය : ..............................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-12 **අංකය** 27




# නයෝමි අවසන් අටට එක් වෙයි



# ජොකොවික් තරගාවලියෙන් ඉවතට

ශ්‍රේණිගත කිරීම්වල අංක එකේ ක්‍රීඩකයකු ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් ශූරතාවලියකින් ඉවත් කළ පළමු අවස්ථාව සටහන් කරමින් සර්බියාවේ නොවැක් ජොකෝවික් අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාවලියෙන් පෙරේදා ඉවත් කරනු ලැබීය.

ඔහුට තරගාවලියෙන් ඉවත්වීමට සිදු වූයේ ස්පාඤ්ඤයේ පැබ්ලෝ කැරිනෝ සමග පැවැති සිවුවැනි වටයේ තරගය අතරතුරදී ප්‍රතිවාදී ක්‍රීඩකයා වෙත පන්දුව පිරිනැමීමේදී සිදුවූ අත්වැරැද්දකින් කෝපයට පත්ව සිදු කළ නීතිවිරෝධී ක්‍රියාවක් හේතුවෙනි. 33 හැවිරිදි මේ සර්බියානු ක්‍රීඩකයා සිය සාක්කුවේ තිබූ අනික් පන්දුව ගෙන එය ඉවතට ඇදී යන සේ වැරෙන් එල්ල කළ පහරින් පන්දුව පැති විනිසුරුවරියගේ ගෙලෙහි වැදිණි. ඒ මොහොතේ ඇය වේදනාවෙන් බිම ඇද වැටුණු අතර, පසුව වෛද්‍ය කාර්ය මණ්ඩලයෙන් ප්‍රතිකාර ලබා ගත්තාය.

මේ සිදුවීම සම්බන්ධව ජොකෝවික් පැති විනිසුරුවරියගෙන් සමාව අයැද සිටිය ද තරග නීතිරීතිවලට අනුව ඔහුට තරගාවලියෙන් ඉවත්වීමට සිදුවිය.

මේ අතර එස්ටෝනියාවේ ඇනට් කොන්ටාවේට් වට 2-0කින් පරාජයට පත් කරමින් මෙවර තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබීමට ජපානයේ නයෝමි ඔසකා සමත් වූවාය.

වසර 2018දී අමෙරිකානු විවෘත ටෙනිස් ශූරිය වන 22 හැවිරිදි ඔසාකා මේ හඹා යන්නේ සිය තුන්වැනි ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් කිරුළය. ඇය ඊට පෙර පසුගිය වසරේදී ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් කිරුළ දිනා ගැනීමට ද සමත් වූවාය.

# රොයිස්ටන්ගේ විරෝධතා වීසි කරමින් පුවනේන්ද්‍රන් යළිත් සිටි ලීග් මුල් පුටුවට

**ප්‍රින්ස් ගුණසේකර**

කොළඹ සිටිලීග් පාපන්දු සමාජයේ වාර්ෂික නිලවරණයෙන් හිටපු සභාපති ආර්. පුවනේන්ද්‍රන් මහතා නිතරගයෙන් යළිත් වරක් එම ධූරයට පත් වෙයි. වසර 15ක් සිටිලීග් පාපන්දු සභාපතිවරයාව සිටි ඒ මහතා එම ලීගයේ සිටි යාසීන් මහතාගෙන් පසු අඛණ්ඩව එම තනතුරේ කටයුතු කරමින් සිටී.

කොළඹ සිටිලීග් ක්‍රීඩාගාරයේ පැවැති මෙම නිලවරණය නීති විරෝධී බවට රිනවුන් ක්‍රීඩා සමාජයේ රොයිස්ටන් ප්‍රනාන්දු මහතා ආරම්භයේදීම මූලික විරෝධතාවක් ගොණු කළ අතර නිලවරණය පැවැත්විය යුතු දිනය ගෙවී ගොස් ඇති බැවින් නිලවරණය අත්හිටුවා නැවත නාමයෝජනා කැඳවිය යුතු බවට ඉල්ලා සිටියේය. එහෙත් එම මතයට ක්‍රීඩා සමාජ 21කින් 20ක්ම එකඟ නොවූ හෙයින් නිලවරණය නියමිත ආකාරයෙන් පැවැත්වීමට කටයුතු යෙදිණි.

කොරෝනා වයිරස ව්‍යාප්ති කාලය අතරතුර නිලවරණය පැවැත්වීමේ දිනය යෙදී තිබූ හෙයින් එම නිලවරණ කැදවීමේ ලිපිය වලංගු නොවන බව ප්‍රනාන්දු මහතා පෙන්වා දුන්නද එය සිටිලීග් ක්‍රීඩා සමාජ නියෝජිතයෝ ප්‍රතික්ෂේප කළහ. සිටිලීග් පාපන්දු සභාපති ආර්. පුවනේන්ද්‍රන් මහතා තම පෞද්ගලික මුදල් වැය කොට පාපන්දු ක්‍රීඩාවේ දියුණුවට කැප වී සිටින හෙයින් ඔහු යළිත් සභාපති තනතුරට පත් කළ යුතු බවට සියලු දෙනා එකඟ වූ බැවින් ඒ මහතා සභාපති තනතුරට නිතරගයෙන් තේරී පත්විය. කොළඹ සිටිලීග් පාපන්දු ලීගයේ ලේකම් ඇතුළු අනෙකුත් සියලු තනතුරු ද නිතරගයෙන් තේරී පත් විය.

සිටිලීග් පාපන්දු ලීගයේ නව නිලධාරී මණ්ඩලය මෙසේය: සභාපති: ආර්. පුවනේන්ද්‍රන් (කොළඹ ප්‍රවීණයන්ගේ ක්‍රීඩා සමාජය), ලේකම් : සබීර් රහීම් (වික්ටරි ක්‍රීඩා සමාජය), ජ්‍යෙෂ්ඨ උප සභාපති: එම්. ප්‍රේමදාස (කොළඹ ක්‍රීඩා සමාජය), උප සභාපතිවරු (6යි) : සායිෆ් යූසුප් (කොළඹ ක්‍රීඩා සමාජය), මැක්සි ලේටන් (ජාවාලේන් ක්‍රීඩා සමාජය), සිවකුමාර් (මාලිගාවත්ත යූත් ක්‍රීඩා සමාජය), මොහොමඩ් ස්මයිල් (වික්ටරි ක්‍රීඩා සමාජය), පියල් සිරිවර්ධන (ස්ලේවයිලන් ක්‍රීඩා සමාජය), එම්. එම්. රාජේන්ද්‍රන් (රිනවුන් ක්‍රීඩා සමාජය), උප ලේකම්: ඇන්ටන් ජෝයි (වැල්ලවත්ත කුරේ ක්‍රීඩා සමාජය), භාණ්ඩාගාරික: එම්. නිශාමුඩීන් කොළඹ ප්‍රවීණයින්ගේ ක්‍රීඩා සමාජය), උප භාණ්ඩාගාරික : ආර්. මනී (යුනයිටඩ් ක්‍රීඩා සමාජය), ක්‍රීඩා භූමි ලේකම්: ජේ. එන්. ඇලෙක්සැන්ඩර් (ස්ලේවයිලන් ක්‍රීඩා සමාජය),



# මාතලේ හොකී පුරවරයට කණකොකා හඬයි

## නන්දිමිත්‍ර ඒකනායක කෘත්‍රිම හොකී ක්‍රීඩාංගණය කාන්තාරයක් වෙලා

## ප්‍රේක්ෂකාගාරය සමාජ විරෝධි මධ්‍යස්ථානයක්



**උකුවෙල විශේෂ - එම්.එස්.එම් මසාහිම්**

හොකී ක්‍රීඩාවේ කේන්ද්‍රස්ථානය ලෙස හඳුන්වන මාතලේ නන්දිමිත්‍ර ඒකනායක ජාත්‍යන්තර කෘත්‍රිම හොකී ක්‍රීඩාංගණය වසර ගණනාවකින් කිසිදු නඩත්තුවකින් තොරව අතහැර දැමීම නිසා සමාජ විරෝධී කටයුතු සිදුවන ස්ථානයක් බවට පත්වී තිබේ.

හොකී ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් 2000 වර්ෂයේ එවකට මධ්‍යම පලාත් ප්‍රධාන අමාත්‍ය හා ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ සභාපති ධුරය දැරූ නන්දිමිත්‍ර ඒකනායක මහතාගේ මූලිකත්වයෙන් ඉදිකළ මේ ක්‍රීඩාංගණයේ කෘත්‍රිම තණතීරුව ද වසර ගණනාවක් වසර ගණනකින් ප්‍රතිසංස්කරණය නොවීම හේතුවෙන් දිරාපත් වී ඇති අතර, එය දිස්වන්නේ කාන්තාරයක් මෙනි.

මාතලේ පුරවරයේ පාසල් කණ්ඩායම්වල පුහුණුවීමේ මධ්‍යස්ථානයක් ලෙස පැවැති කෘත්‍රිම හොකී ක්‍රීඩාංගණයට අත් වී තිබෙන ඉරණම පිළිබඳ ප්‍රදේශ වාසීහු දැඩි කනස්සල්ලට පත්වී සිටිති. මෙරට ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් බිහිකළ මාතලේ නගරයෙන් අනාගත ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිවීමට ඇති ඉඩකඩ ද මේ නිසා දැඩි පසුබෑමකට ලක් වී තිබේ.

එමෙන්ම මෙම ක්‍රීඩාංගණයට යාබදව පිහිටා ඇති ප්‍රේක්ෂකාගාරය ද කිසිදු භාවිතයකින් තොරව අත් හැර දැමීම නිසා එහි සමාජ විරෝධි කටයුතු නිතර නිතර සිදුවන බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.


මාතලේ පොලිස් ස්ථානය සහ සිරිමාවෝ බණ්ඩාරනායක පාසල් අතර සුන්දර පරිසරයක පිහිටා ඇති මෙම ක්‍රීඩාංගණය අලුත් වැඩියා කර මාතලේ හොකී ක්‍රීඩාවේ නිරත වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට යළි භාවිතයට ගැනීම සඳහා නව රජයේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ අවධානය යොමු විය යුතු බව ද මාතලේ ජනතාව පවසයි.

ඡායාරූප - උකුවෙල විශේෂ

වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 08 වැනිදා අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# බද්දර මල්ල


**සතියේ 'තුනපහ' මඩිස්සලේ**




## දොළොස් මහේ පහන

## රුහුණු පුරවරයේදී

## දැල්වුණු වගයි


මනෝ


සුනිල්


බුද්ධි

## එදවස සොඳුරුමය

දොළොස් මහේ පහන අවුරුද්දක් පුරාම නොනිවී දැල්වෙන පහනයි. සිරිපා උඩ මළුවේ, කතරගම කිරි වෙහෙරේ, කැලණි මහ විහාරයේ නොනිවී දැල්වෙන දොළොස් මහේ පහන් මගේ මතකයට නැගේ. වසරක පමණ නිහැඬියාවකින් පසු දිනමිණ බද්දර මල්ල තීරු ලිපි අතිරේකය යළිත් ඇරඹෙන අද වන් දවසක වසර හතළිස් නවයකට වඩා දිගු කලක් දැල්වෙමින් පවතින දොළොස් මහේ පහනක් පිළිබඳ සොඳුරු මතකයට පිවිසෙන්නට ලැබීම අහම්බයක් ලෙස හැඟේ. බද්දර මල්ල පිටු හතරක තීරු ලිපි අතිරේකයේ සංකල්පය එදවස ලේක් හවුසියේ සභාපතිව සිටි බන්දුල පද්මකුමාර මාධ්‍යවේදී ප්‍රවීණයාගේ ය. 2012 දී දිනමිණට එක් වූ බද්දරමල්ල තීරු සංග්‍රහය 2019 ජනවාරි මුල් කාලය පමණ වන තෙක් පළ විණ. එහි ආරම්භයේ සිට තීරුවක් ලියැන්නැයි ඇරියුම් කළෝ බන්දුලයෝම ය. එකල දිනමිණ කර්තෘ වූයේ හිත මිත්‍ර ගාමිණී ජයලත් ය. අතිරේකයෙහි සංස්කාරිකාව නිවන්ති තිලකරත්න සොයුරියයි. ඉඳහිට සුමේධා නවරත්න සොයුරිය ද එහි සංස්කාරිකාව වූ බව මතකය. සති පතා ලිවිය යුතු තීරුවකට සුදුසු නම සොයා ගැනීම දුෂ්කර වූවත්, මා ලියන්නට යන්නේ කුමක්දැයි විස්තර කළ පසු මිත්‍ර මහැදුරු සමන්ත හේරතුන්ගෙන් අපූරු නාමයක් ලැබිණ. එදවස සොඳුරුමය, එදවස මෙදවස සොඳුරු අඳුරු ඉසව් දකිනා තීර්ථ යාත්‍රිකයකුගේ මතක සමුදායෙන් බිඳක්.... තීරු නාමය කෙතරම් සුන්දර ද කිව හොත් 2013 සිට 2019 තෙක් තෝරා ගත් තීරු ඇතුළත් එදවස සොඳුරුමය එකතු හයක් පළ කරන්නට වාසනාවන්ත වීමි. ප්‍රතිමුද්‍රණ ද සහිතව 2013 සිට පළ වූ එදවස සොඳුරුමය තීරු ලිපි පළමු සංග්‍රහය 2014 දී ගොඩගේ ජාතික සාහිත්‍ය සම්මාන උලෙළ පළමුවරට හඳුන්වා දුන් වසරේ ප්‍රශස්තම තීරු ලිපි සංග්‍රහයට පිදුණු ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ අනුස්මරණ සම්මානයෙන් පුදනු ලැබීම එදවස සොඳුරුමය මතකයෙහි සුන්දර මතකයකි. එදවස සොඳුරුමය තීරුවෙන් පෙර අවස්ථා රැසක මතකයට නැගුණු දොළොස් මහේ පහනේ අතීත කතාව අද නැවුම් මතකයක් ලෙස මෙලෙස එක් කරමි.

දොළොස් මහේ පහන පළමු වරට දැල්වෙන්නේ 1971 වසරේ අග භාගයේ දීය. කොළඹ 10 මරදාන ඩේවිඩ් ඇවනියුහි පැල්පත් හා අපද්‍රව්‍ය ගලා යන ඇළ මාර්ගයක් අසබඩ චාමර පොතක් ලෙස දොළොස් මහේ පහන දැල්වෙන්නේ හිත මිතුරු ප්‍රකාශක අයිපීබී සෝමෙගේ, සෝමපාල හේවාකපුගේ ගේ අනුග්‍රහයෙනි. රුපියල් එකකුත් ශත පණහක් වූ කවි පහනෙහි සිළු තුනක් දැල්වූවන් වූයේ බුද්ධදාස ගලප්පත්ති, ජයලත් මනෝරත්න හා සුනිල් ආරියරත්න නම් වූ මිතුරන් තිදෙනාය. අලංකාර පිට කවරය මහගම සේකරයන් විසින් නිර්මාණය කොට දෙන ලද්දකි. අගනා පෙරවදනක් ලියා දුන්නේ කැලණිය විශ්වවිද්‍යාලයෙහි සිංහල අංශයෙහි තරුණ කථිකාචාර්යවරයකු වූ විමල් දිසානායකයි. පිටපත් දහසක මුද්‍රණ ඇණවුමෙහි එකදු පිටපතක් හෝ අද සොයා ගන්නට නොහැකිය. වසර හතළිස් නවයක කාලයක් තුළ පොත් දහසක් අලෙවි වීම අරුමයක් නොවන මුත් පළමු වසර පහක පමණ කාලයක සිට පොත අලෙවියට ඉතිරි වී නොතිබිණ. සොඳුරු මතකය තුළ අඳුරු මතක ද වන බව සිහි වේ. පළමුව, දොළොස් මහේ පහන සිතුවම් කළ මහා පුරුෂයා, මහගම සේකර මතකයෙන් ඈත් ව යන්නේ 1976 ජනවාරියේ දී ය.දෙවනුව අප තිදෙනාගේම හිත මිතුරා සෝමපාල හේවාකපුගේය. ඒ 2016 බක් මහේ දීය. තෙවැන්නා දොළොස් මහේ පහන හිමිකරුවකු වන මනෝය. ඔහු අප අතැර යන්නේ 2020 ජනවාරි දොළොස් වන දා ය.පහන දල්වන්නට අනුග්‍රහය දැක්වූ , හා සරසන්නට නිර්මාණ දායකත්වය දුන් දෙදෙනා අතරට පහන ආලෝකවත් කළ එක් සිළක හිමිකරුවාගේ අනපෙක්ෂිත වියොව කෙසේ දරා ගැනීමට හැකි ද යන්න සිතට වධ දෙන ප්‍රශ්නයකි. මනෝගේ වියොවත් සමඟ යළි මතකයට ආ දොළොස් මහේ පහන කවි එකතුව ප්‍රතිමුද්‍රණයක අවශ්‍යතාවට ප්‍රධාන වූයේ මනෝගේ රසිකයන්ට ඔහුගේ කවි කියැවීමට තිබූ කැමැත්තයි. අලුත් පරපුර මනෝගේ කවිය දැක නොතිබිණ. මනෝ මෙන්ම කවියෙන් ඈත්ව සිටිනා සුනිල්ගේ කවි කියැවීමට ද බොහෝ දෙනාට ඕනෑ වී තිබූ බැවින් කවි එකතුවෙහි දෙවන මුද්‍රණයක් කිරීමේ වගකීම පෙර මෙන්ම මට පැවරුණේ මනෝගේ බිරිය ජයන්තිගේ ද දොළොස් මහේ පහනෙහි අනෙක් කවි සගයා සුනිල්ගේ ද කැමැත්ත මතය.

1971 දී මරදානේ දී පළමු වරට දැල්වුණු දොළොස් මහේ පහන දෙවන වර දැල්වෙන්නේ ද මරදානේ දී ම වීම අහඹු සිදුවීමකි. මෙවර එය මරදාන දේවානම්පියතිස්ස මාවතෙහි සුරස පොතක් ලෙස නව නිමාවකින් නිර්මාණය වී තිබේ. ප්‍රකාශක මිතුරා ප්‍රේම් දිසානායකය. අනෙක් අසිරිමත්ම සිදුවීම වන්නේ දොළොස් මහේ පහන දෙවන මුද්‍රණය සඳහා අපූරු ජනගත කිරීමේ උළෙලක් පැවැත්වීමයි. අගනුවරින් බැහැර මාතොට දී ඊයේ පෙරවරුවේ දොළොස් මහේ පහන තවත් හිමිකරුවකු වන සම්මානිත දෙටු මහදුරු සුනිල් ආරියරත්නට ප්‍රති මුද්‍රණ පළමු පිටපත පිළිගැන් වූ ජනගත කිරීමයි. ෆාස්ට් පබ්ලිෂින් ලිමිටඩ්, දකුණු සිරිලක සාහිත්‍යකාමී පාඨක පාඨිකාවියන් සමග අත්වැල් බැඳ ගැනීමේ අරමුණින් රුහුණු පුරවර මාතොට දී සමාරම්භ වූ සුරස පොත් මැදුරෙහි දී මෙම චාම් උළෙල පවැත්විණ. කවියෙහි සක්‍රියව නොසිටියෙ ද, කාව්‍ය රසිකයකු, විචාරකයකු ලෙස අවදියෙන් සිටිනා විද්වතකුට ප්‍රතිමුදිත පිටපත පිළිගැන්වීමත්, ඔහු එම සංග්‍රහයෙහි එක් හිමිකරුවකු වීමත් එදවස සොඳුරුමය වූ ඇදහිය නොහැකි වූ අත්දැකීමක් ම විය. වසර හතළිස් නවයක් නොනිවී අප රස විඳි දොළොස් මහේ පහන සමූහ කවි එකතුව දැන් අප'තට පත්ව අත. කවිය අත් නොහැර සිටින කවියකුගේ හා කවිය මෙන්ම ජීවිතය ද අත් හැර ගිය සොඳුරු මිනිසකුගේ හා තවත් විශිෂ්ට නිර්මාණකරුවකුගේ එදවස කාව්‍යකරණය පිළිබඳ , රුව ගුණ හඳුනා ගැනීමට දොළොස් මහේ පහනින් යම් හෝ ආලෝකයක් ලැබෙනු ඇතැයි විශ්වාස කරමි.

දොළොස් මහේ පහනෙහි හිමිකාරීත්වය මාහට පවරුණේ කෙසේ දැයි තවමත් කල්පනා කරමි. කවි එකතුවක් පළ කිරීමේ අදහස මනෝගේය. ඊට මගේ කවි ද සුනිල්ගේ කවි ද ඇතුළත් විය යුතු යැයි තීරණය කළේ ද මනෝය. එහෙත් පළමුව මගේ නම යෙදුණේ කෙසේදැයි නොදනිමි. සග මහලු පිළිවෙළට එය එසේ වී ද? මා 1947 දෙසැම්බරයේ දී ද, මනෝ 1948 ජූනි මස ද, සුනිල් 1949 ජූලි මස ද ජන්ම ලාභය ලබා ඇති බැවින් මා අප තිදෙනා අතරින් වෘද්ධතමයා වීම කවි එකතුවෙහි අයිතිය මට පැවරීමේ අහඹු සිදුවීම ද? බුද්ධි මනෝ සුනිල් අතරින් අද අප දෙදෙනා පමණක් ඉතිරිව සිටී. සේකරගේ චිත්‍රයෙහි දැල්වුණු පහන් සිළු ත්‍රිත්වයෙන් එක සිළක ආලෝකය නොපෙනේ. එහෙත් මනෝගේ කවියෙන් අපි ඒ ආලෝකය දකිමු. මනෝගේ ජීවිතය පුරා අප අත් විඳි ඔහුගේ සැහැල්ලු සුන්දර ජීවන රටාව ඔහුගේ කවියෙහි ද අපූරුවට පිළිබිඹු වන බව දකිමු. සරසවි ජීවිතයේ සුන්දර මතක මනෝගේ කවියෙන් ප්‍රතිනිර්මාණය වී තිබුණේ මෙසේය.

දේශක මහතා අද නැත එනිසා අද නැත නිදි මත
එදවස අප ලියූ ගීත තවමත් අත මෙහි පුටු මත

බං බං බං බංගලියා බංගලියා කන්ට ගියා
ගැරුප්පුව කටේ ගියා හෙල්ත් සෙන්ටර් අරං ගියා
නර්ස් නෝන ගන්ට ගියා නර්ස් නෝනත් කටේ ගියා
දොස්තරයා ගන්ට ගියා දොස්තරයත් කටේ ගියා..

වර්තමාන ගේය කාව්‍ය රචනයෙහි අසිරිමත්ම ගේය කාව්‍ය සංකල්පනා හිමිකරුගේ එදවස කවිය තුළ අප අත් විඳින උපහාසය තුළ ගේය කාව්‍ය රචකයා සැඟවී ගොස් ඇති සැටි සුනිල්ගේ කවියකින්ම විමසිය යුතුය.

අහුරක් පමණ බත් ලබුණොත් බුදින්නට
වියාකරණ කාපන් බඩ පිරෙන්නට
තිබහට හොඳයි ඉතිහාසය ගිලින්නට
ඉංගිරිසියෙන් ඇහැකියි බෙලි කපන්නට


තිලක් සමඟ සිනමා නාටක නරඹා
ප්‍රේමදාස වෙරළේ දී මුණ ගැසුණා
සරත් නිසා පිවිතුරු බඹසර බිඳිලා
සනත් සමඟ සත් දිනකින් දීග ගියා..

වසර හතළිස් නවයකට පසු යළිත් දොළොස් මහේ පහනේ කාව්‍යාලෝකය බලන්න. ජීවිතයේ අඩ සියවසක් තරම් කාලයක් තුළ සාහිත්‍ය කලා ක්ෂේත්‍ර රාශියක විවිධ වූ නිර්මාණකරණයෙන් රසික ශ්‍රාවක ප්‍රේක්ෂක පාඨක ජන සමූහයා ආමන්ත්‍රණය කරන ලද නිර්මණකරුවන් තිදෙනකුගේ කාව්‍යකරණය මුල් කොට ගත් අත්දැකීම් රැසක හරස් කඩක් මේ කවි තුළින් ඔබට පෙනෙනු නියතය.දොළොස් මහේ පහනෙහි අතීත කතාවෙහි තවත් සොඳුරු ඉසව් පිළිබඳ ලිවිය යුතු බොහෝ දෑ ඉදිරි දවසක තීරුවකින් කියවමු.



**බුද්ධදාස ගලප්පත්ති**

## බවලතුන්ට තහංචි පැනවූ ඇල්හේන



අතෙකින් කොළපත් ගොටුව ගෙන කුඩා අඩිපාර දිගේ ඕ කඩිසරව පිය නැගුවා ය. කොළපත් ගොටුවේ සැමියාට ගෙන යන කොළපතක එතූ බත්ගෙඩිය ද පානය කරන්නට දිය ගෙනයන ලබු කැටය ද තිබෙයි. හැන්දෑ ඇඳිරිය වැටෙන්නට පෙර බත්පත ඔහුට ලැබෙන සේ තබා ආපසු ගෙපැලට පැමිණිය යුතු ය. ගොම්මන් අඳුරේ තරුණ ගැහැනුන්ට ගමන් බිමන් නුසුදුසු බව ඈ වැඩිහිටියන්ගෙන් දැනමුතුකම් ලද්දී ළමිස්සියක වූ සන්දියේ දී ම ය.

ඇල් හේනට ආසන්න වන විට ඈත තියා දකින්නට ලැබෙන දඬුවැට ඇයට ගෙන ආවේ සැනසිල්ලකි. දැන් ගමනින් අඩක් නිමව ඇත. දඬුවැටේ කඩුල්ල අසලට ගිය ඕ ඒ අසල ඇති බැලුම් කණුවේ බත්ගෙඩිය ලා ඇති කොළපත් ගොටුව එල්ලුවා ය. අනතුරුව රැයේ අහර ගෙනා බව හේනේ පැලේ සිටින සැමියාට හඟවන්නට දඬුවැටේ කඩුල්ල සෙලවූවා ය. වෙනදා මෙන් දිවා රෑ නොදකින සැමියා දකින්නට ඇයට ඇත්තේ බලවත් ආශාවකි. එහෙත් කිල්ල ඇල් වගාවට ගෙන එන්නේ හානියකි. පරම්පරා සම්මත සිරිත් හා තහංචි රකින ඕ ආශාව මැඩගෙන ආපසු හැරුණා ය.

මේ වර්තමානයට අයත් අත්දැකීමක් නම් නොවේ. කෑගලු දිසාවේ තුන් කෝරලයේ අතීත කාලීන අත්දැකීමකි. වනපෙතක ගස්කොළං කපා, ගිනිතබා, දඬුවැට යොදා සැකසූ නවදැලිහේනේ බෙහෙවින් වැපිරුවේ ඇල් වී ය. තුන් කෝරලයේ සමහර ගම්වල හතළිහේ දශකයේදී ද, ඇතැම් ගම්වල පනහේ දශකයේදී ද තවත් සමහර ගම්වල හැටේ සහ හැත්තෑව දශකයේදී ද නවදැලිහේනට තිත තැබිණි. වැවිලි භෝග ව්‍යාප්තිය මෙන් ම කැලෑ හෙළිපෙහෙළි කිරීමේ නීතිරීති දැඩිවීම ද ඊට හේතුකාරක විය. නවදැල්ලේ ඇල් වී වගාව පාරම්පරිකව සම්මත සිරිත් හා තහංචි (ජනශ්‍රැතියේ දී තහන්දි යන වචනය භාවිතා වුවත් ගැමි වහරේ දී එය තහංචි යනුවෙන් යෙදේ.) මත පදනම්ව සිදුවන්නකි.

කිල්ල පිළිබඳව සැලකිලිමත් ගැමි සමාජය ඇල් හේනට ඇතුළුවීම කාන්තාවන්ට තහංචියක් බවට පත්කරයි. නවදැල්ලේ ඇල් වී වපුරන්නේ කැකුළෙනි. වී ඉහීමත් සමඟ අරු කෙටීම සිදුවේ. ගොවියන් දෙදෙනෙක් උදලු තලයෙන් තල තුන බැගින් පොළව කොටාගෙන යාම අරු කෙටීමයි. අරු කෙටීමෙන් පසු ගොවියා සමඟ හේනේ රැඳෙන්නේ තරමක් වියපත් ගැහැනු දිවියේ ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය නිම කළ (ආර්තවහරණය වූ) ගැහැනු පිරිසකි. මෙම වැඩිහිටි ගැහැනු පිරිස වැපිරූ කොටසේ ඇති කුණු, රොඩු, ලී කැබලි, පොතු ආදිය දෑතින් පිසගෙන හේනේ ඉහත්තාවට ගෙනෙති. මෙය ගදාල දැමීමයි. ගදාල දැමූ විට වැපිරූ වී හේනේ සමව විසිරෙයි. පසුව හේනේ නෙළුම් කටයුතුවලට සහභාගී වන්නේ ඉහතින් සඳහන් ගැහැනු පිරිසයි. ගොවියාගේ බිරිඳට ඊට සහභාගී විය හැක්කේ ඇය ආර්තවහරණය වූ එකියක නම් පමණි. ගොවි බිරිඳ තරුණ වියේ පසුවන තැනැත්තියක් නම් හේනට පැමිණීම ඇයට තහංචි වෙයි.

ගොයමේ බණ්ඩි මෝරන විට ගොවියාට හැර කිසිවෙකුට හේනට පැමිණීම තහංචි වෙයි. හේන රකිමින් ඔහු තනිව ම පැලේ කල් ගත කරයි. ගොවියාගේ බත්පත උයා කොළපතක බැඳගන්නා ගොවි බිරිය බත්පත සහිත කොළපත් ගොටුව දඬුවැට අසල බැලුම් කණුවේ එල්ලා දඬුවැටේ කඩුල්ලට තට්ටු කොට බත් පත ගෙනා බව සැමියාට සන්කොට ආපසු යන්නී ය. ඇය සැමියාගේ බත්පතට පිළිහුඩු ඉවීමෙන් වළකියි. කිල්ල මෙන් ම පිළී ඇල් හේනට තහංචි වෙයි.

නවදැලිහේනේ වැවෙන්නේ ඇල් වී පමණක් නොවේ. බතල, කඳල, මඤ්ඤොක්කා වැනි විවිධ අලවර්ග ද වට්ටක්කා, කැකිරි, තියඹරා, මෑ, වැටකොළු, බටු, කොච්චි, මිරිස් වැනි එළවළු වර්ග ද එහි මැනවින් වැවේ. මුලින් ම හේන ගිනි තැබූ පසු ඉතිරි වන පොඩි අතු කැබලි එක තැනකට ගොඩ කෙරේ. මෙය මුලං ගැසීමයි. ඉන්පසු මුලන නැවත වතාවක් ගිනි තැබේ. මුලන ගිනි තැබූ තැන දෙවරක් පිළිස්සුණු තැනකි. එහි එළවළු වැනි බවභෝග සරුවට වැවේ. සය මසකින් පමණ ඇල් හේනේ අස්වනු ලද විගස ඊළඟට කුරහන් ද ඊටත් පසු අමු ද වගා කිරීම ගොවි සිරිතයි. කොහොමටත් නවදැලිහේන අවුරුද්දක් පුරා ගොවි ගෙදර ධාන්‍ය, එළවළු හා අලබතල ආදියෙන් සරු කරන තැනකි.

ඇල්හේනේ ගොයම් කපන්නේ ද පිරිමි ය. බවලතුන්ට එහි ඒම තහංචි ය. ඇල් වී කපන විට කතාබහට තහංචියක් නොවේ. බුම්මැඩි වැයේ. කැපුම් කවි ගායනා කෙරේ. ඇල් වී පාගන්නේ හේනේ ම තනාගත් කුඩා කමතක ය. කුඩා කමතේ දෙපසින් බැඳගත් කරු දෙකකට දණ්ඩියමක් යෙදේ. පිරිමි දෙදෙනෙක් දණ්ඩියම (හරස් ලීය) අල්ලාගෙන දෙපයින් පාගති. පාගන දෙදෙනාට කතාබහ පවා තහංචි වෙයි.

## සංහිඳ පාමුල

අපේ ගීත සාහිත්‍යයට ද ඇල් හේන එක්වෙයි. එක් ගීයක යෙදෙන්නේ මෙසේ ය.

"ඇල් හේන දිගේ පාන වගේ කොයි යනවද
නෑන මගේ."
තවත් ජනප්‍රිය ගීයක මෙසේ යෙදෙයි.
"මහරෑ යාමේ - මේ ඇල් හේනේ
තනියම සීපද කියනු අසා
වෙහෙස දරාගෙන පාර අසාගෙන
ආවෙමි අඳුරෙ ම ඔබව සොයා"

ඇල් හේන දිගේ යන්නට නෑනාට එදවස වරම් තිබුණේ නැත. ඇයට ඊට තහංචි ය. එසේ ම ඇල් හේනේ සීපද කියන මස්සිනා සොයා මහ රෑ යන්නට ද වරම් නැත. ගීතය හෝ කවිය සත්‍ය භෞතික තත්ත්වය ම පදනම් කර නොගනී. ඊට කාල්පනික ලෝකයක් විෂය කර ගනිමින් සංකල්පයන් නිරූපණය කිරීමේ ඉඩහසර ඇත්තේ ය. මූදු පතුල යට සිට මුතු ඇටයක නිදිකරවා පුතු ඇගේ දෝතට ගෙන්වන්නේ ද, සීගිරි ළඳකගෙ මල් වට්ටියෙ ලා පුතු නළවන්නේ ද එහෙයිනි. කවියා ගොවි මස්සිනාට තහංචි ඇල් හේනෙ දිගේ යන නෑනා මනසින් දකින්නටත්, රෑ ඇල් හේනේ පැලට ඇය ගෙන්වා දෙන්නටත් කටයුතු කරයි. ඊට තහංචි කිම? සුන්දරත්වය ඇත්තේ එතැන ය.
(තොරතුරු සැපයීමෙන් දායක වූ පැලම්පිටියේ එම්. ආර්. වික්‍රමසිංහ, එම්. ආර්. සමරසිංහ, පොල්ගස්වත්තේ දයාරත්න අලවත්ත, දික්ඇල්ලකන්දේ එච්. ඒ. වී. පියදාස, තෙබුවත්තේ එම්. ඩබ්ලිව්. දයාරත්න, තලවත්තේ ඩබ්ලිව්. ජයවර්ධන, නිකවලමුල්ලේ ඩී. ඒ. සේනාරත්න සහෘදයන්ට ස්තුතිවන්ත වෙමි.)




**මහානාම දුනුමාල**

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## උඩුපිල සහ යටිපිල

## අත ඇයගේ ය නම ඔහුගේ ය



ඇමෙරිකානු ගත් කතුවරියක වන කැතරින් නිකලස් 2015 වසරේදී අමුතු පර්යේෂණයක නියැළුණා ය. ඇය තම ග්‍රන්ථයක අත්පිටපතක් තම නමින් ද, පිරිමි නමකින්ද ප්‍රකාශකයන් කිහිපදෙනකු වෙත යොමු කළාය. පැය විසිහතරක් ඇතුළත ඇගේ පිරිමි නමින් (ජෝර්ජ් නිකලස්) ඉදිරිපත් කළ අත් පිටපත් සඳහා සතුටුදායක පිළිතුරු පහක්ම ලැබුණි. ප්‍රතික්ෂේප වූ ජෝර්ජ්ට පවා ප්‍රසංශාත්මක හා දිරි ගන්වන සුළු ප්‍රතිචාර ලැබුණි. එහෙත් කැතරින්ට කැඳවීම් ලැබුණේ ප්‍රකාශකයන් දෙදෙනකුගෙන් පමණි.

ගැහැනු සහ පිරිමි නම් දෙකකින් ඉදිරිපත් කළ එකම අත් පිටපතකට දෙවිදියක ප්‍රතිචාර ලැබීම ගැන කැතරින් නිකලස් කතුවරිය දක්වන්නේ මෙබඳු අදහසකි.
"ප්‍රශ්නය තිබුණෙ මගේ නව කතාවේ නෙවෙයි. මගේ නමේ. කැතරින් කියන නමේ."

ප්‍රකාශකයන් විසින් ලේඛිකාවන් ප්‍රතික්ෂේප කිරීමේ කතාව සාහිත්‍ය ඉතිහාසයේ බොහෝ ඈතට දිවයයි. මහා බ්‍රිතාන්‍යයේ වික්ටෝරියානු යුගයේ දී ලේඛන කලාව ස්ත්‍රීන් සඳහා නො වේ ය යන මතය තදින් සමාජ ගතව තිබිණි. පසු කලෙක සුප්‍රකට ලේඛිකාවන් බවට පත් වූ බ්‍රොන්ටේ සහෝදරියන් දෙදෙනාගෙන් චාලට් බ්‍රොන්ටේ 1836 දී ඇය ලියූ කවි කිහිපයක් එවකට සිටි ප්‍රවීණ කවියෙකු වූ රොබට් සදී වෙත යැවුවාය. විසි හැවිරිදි චාලට් තමන් ලද ප්‍රතිචාරයෙන් කම්පනයට පත් වූවාය. සදී කවියා මෙසේ කියා තිබුණි
"සාහිත්‍ය යනු කාන්තාවන්ට අයත් වැඩක් නොවේ. ඔවුන් එහි නොයෙදිය යුතුය."

කෙසේ වෙතත් ඉන් පසුබට නොවූ චාලට් තම සොයුරියන් වූ එමිලි හා ඈන් ද හවුල් කරගෙන 1846 දී 'පොයම්ස්' නමින් කවි එකතුවක් පළ කළා ය. එහෙත් ඔවුන් තිදෙනාගේ සැබෑ නම් වෙනුවට යෙදුවේ කියුර, එලිස්, හා ඇක්මන් බෙල් යන පිරිමි නම් තුනකි. පසු කලෙක ඔවුන්ගේ සැබෑ නමින් ද එම පොත ප්‍රකාශ කෙරුනි. එසේම ජේන් අයර් නවකතාවෙන් චාලට් බ්‍රොන්ටේ ද වදරින් හයිට්ස් නවකතාවෙන් එමිලි බ්රෝන්ටේ ද ද මෙන්ටන් ඔෆ් වයිල්ඩ්ෆෙල් හෝල් තුළින් ඈන් බ්‍රොන්ටේ ද ලැබූ ජාත්‍යන්තර කීර්තියට ළංවන්නට වත් ඔවුන්ට හරස් කැපූ රොබට් සදී ට නොහැකි විය.

පැරණි සාහිත්‍ය තුළ බලපැවැත්වූ පුරුෂාධිපත්‍යය නිසා බොහෝ ලේඛිකාවන් තම නිර්මාණ පළ කළේ ආරූඪ කරගත් පිරිමි නම් වලිනි. වෙස්වළාගත් එම පිරිමි ලේඛකයින් සාහිත්‍ය සමාජයේ මුල් පෙළ අසුන් හිමිකරගත්තේ කාන්තාවන් ගේ ප්‍රතිභාව ද පිරිමින්ට නොදෙවෙනි බව කියාපාමිනි.

'සයිලස් මාතර්' නමැති සුප්‍රකට නවකතාව ලියූ ජෝර්ජ් එලියට් පසුපස සිටියේ මේරි ඈන් එවන්ස් කතුවරියයි. ලිට්ල් විමෙන් හැ බිහයින්ඩ් අ මාස්ක් ලියූ ඒ. එම් බර්නාඩ් යනු ලුයිසා මේ ඇල්කොට් ය. අයිසැක් ඩින්සෙන් නමින් අවුට් ඔෆ් ඇමරිකා (චිත්‍රපටයකට ද නැගුනි) ලියුවේ කැරන් බ්ලික්සන් ලේඛිකාවයි.

හැරි පොටර් පොත් පෙළ තුළින් මහා ජනප්‍රියත්වයක් ලැබූ ජේ කේ රෝලින්ග් ලේඛිකාවගේ සම්පූර්ණ නම වූයේ ජෝ ඈන් කැත්ලින් රෝලින්ග් ය. එහෙත් ග්‍රන්ථ ප්‍රකාශනයේදී ජේ කේ යන මුලකුරු යොදමින් පිරිමි ගතියක් ගැනීමට ඇයට සිදුවූයේ ප්‍රකාශකයාගේ ඉල්ලීම මතය. ඔහුගේ අදහස වූයේ ගැහැනු ළමයින් මෙන්ම පිරිමි ළමයින්ද ආකර්ෂණය කර ගැනීම සඳහා ගැහැනු බව වසන් කර තැබීම වඩා යෝග්‍ය බව ය. එහෙත් සිදුවූයේ ප්‍රකාශකයා නොසිතූ දෙයකි. හැරි පොටර් ඉමහත් ජනප්‍රියත්වයට පත් වෙද්දී ජේ.කේ. රෝලින්ග් යනු කාන්තාවක් බව ද ප්‍රසිද්ධියට පත්විය.

ගත් කතුවරියන් තමන්ද කතුවරුන්ට නොදෙවෙනි බව සනාථ කරනුයේ නොබෙල් සාහිත්‍ය ත්‍යාගය ද දිනා ගැනීමෙනි. නොබෙල් සාහිත්‍යය ත්‍යාගය හිමිකරගත් ප්‍රථම කාන්තාව වන්නේ ස්වීඩනයේ සෙල්මා ලැජලොෆ් ය. ඒ 1909 දීය. ඉන්පසුව, 1926 දී ඉතාලියේ ගාර්සියා දෙලේදා ද 1928 දී නෝර්වේහි සිග්රිඩ් උන්සෙඩ් ද, 1938 දී ඇමරිකාවේ පර්ල් එස් බක් ද, නොබෙල් සාහිත්‍යය ත්‍යාගය දිනා ගැනීමට සමත් වූහ.

එම නාමාවලියට ඩොරිස් ලෙසින්ග් (එක්සත් රාජධානිය) එල්ෆ්රීඩ් ජෙලින්ක් (ඔස්ට්‍රියාව) හර්මා මුලර් (ජර්මන් - රුමේනියා) ඇලිස් මන්රෝ (කැනඩාව) ස්වෙත්ලානා ඇලෙක්සියෙවිච් (බෙලරුස්) ඔල්ගා මොකාර්යුක් (පෝලන්තය) විස්ලාවා සෙම්බොර්ස්කා (පෝලන්තය) ආදීහු ද එක් වෙති.

නොබෙල් දිනූ පළමු කළු ලේඛිකාව ඇමරිකාවේ, ටෝනි මොරිසන් ය.

නොබෙල් සාහිත්‍ය ත්‍යාගයට පමණක් දෙවැනි වන බුකර් සාහිත්‍ය ත්‍යාගය දිනා ගැනීමේ දී ද ලේඛකයා අබිබවා ලේඛිකාවන් ඉදිරියට පැමිණීම වර්තමානයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. (අභාග්‍යයකට මෙන් එම ලේඛිකාවන් සිංහල පාඨකයාට ආගන්තුකය. ඔවුන්ගේ කෘතියක් සිංහලට නැගෙන්නේ ඉතා කලාතුරකිනි. පරිවර්තන පරිවර්තිකාවක් බොහෝ වෙතත් ඔවුන් තෝරා ගනුයේ තමන්ට වැටහෙන සරල නොගැඹුරු ග්‍රන්ථය බව පෙනී යයි.)

පිරිමි නමින් ලියුවත් ඔවුන් කාන්තාවන් බව හඳුනාගෙන සිටි ප්‍රකට ලේඛකයෝ හා කලාකරුවෝ ද සිටියහ. ජෝර්ජ් සෑන්ඩ් නමින් ලියූ ප්‍රංශ ලේඛිකා අමෙන්ටින් ලුසිල් පිරිමි ලේඛක සමාජයේ ජනප්‍රිය චරිතයක් විය. නිතරම දිග කලිසමකින් සැරසී සිටි ඇය සුරුට්ටු පානය කළාය. වංශවතකු හා විවාහ වී සිටිය ද අමෙන්ටින්ට නොයෙක් පෙම් සබඳතා විය. ඉන් එක් අයකු වූයේ ලෝකප්‍රකට සංගීතඥ පෝලන්ත ජාතික ෆෙඩ්රික් චොපින් ය. ඔහු එක් වතාවක් තම මිතුරු සංගීතඥයකු ගෙන් ඇත්තෙන්ම මේ ගැහැනිය සැබෑ ගැහැනියක් දැයි අසා සිටියේය.

අමෙන්ටින් එතරම් නිදහස් ගති පැවතුම් ඇතිව සිටියාය. ඇයගේ තවත් පෙම්වතකු වූයේ ප්‍රංශ නවකතා කරු ගුස්ටාව් ෆ්ලෝබෙයාර් ය. ඔහු ප්‍රංශයේ ගම්බද දිවිය පසුබිම් කරගත් ජෝර්ජ් සෑන්ඩ් ගේ නවකතා, රුසියානු ගත්කරු තුර්ගනියෙව්ට සම කළේය. අමෙන්ටීන් ගේ මල ගමේදී ෆ්ලෝබෙයාර් දරාගත නොහැකි ශෝකයෙන් හඬා වැලපුණේ ය. ෆ්ලෝබෙයාර්ට මදුම් බෝවාරි වැනි නවකතා ලිවීමේදී අමෙන්ටීන් වැනි නිදහස් මතික ප්‍රේමණීය කාන්තාවන්ගේ ඇසුර ද උපකාරී වන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

පුරුෂාධිපත්‍ය මතවාද කාන්තා සාහිත්‍යයට බාධා කළ ද බොහෝ ගත් කතුවරුන් ගේ කෘතීන් හි ප්‍රධාන චරිත බවට පත් වූයේ කාන්තාවන් වීම උත්ප්‍රාසජනක ය

පිරිමි නම්වලට වසං වෙමින් හෝ වෙනත් ආරූඪ නම් යොදා ගනිමින් ලිවීමේ යෙදුණු ලේඛිකාවන් ලොව බොහෝ රටවලින් සොයාගත හැක. බින්ග් ෂිං යන ආරූඪ නමින් ලියූ සී වැන්ග්යින් එබඳු චීන ලේඛිකාවකි. ඇයගේ රචනා ශෛලිය මහත් සේ ජනප්‍රිය වූ අතර එය බින්ග් ෂිං ශෛලිය නමින් හැඳින්වුණි. ඇයගේ කාව්‍ය ශෛලිය 'වසන්ත ජලධාරා' නමින් නම් කෙරුණි.
'නූතන සාහිත්‍යයේ මිත්තණිය' යන ගෞරව නාමයෙන් හැඳින්වුණු බින්ග් ෂිං චීන ලේඛක සංවිධානයේ මුලසුන ද දරුවා ය.

පිරිමි දෘෂ්ටිකෝණයකින් කාන්තාව දෙස බලමින් ඇය ලියූ කතා පෙළ මහත් සේ ජනප්‍රිය විය. එහි පළමු කතාව පළ වූයේ 1941 දී එරට පළ වූ සඟරාවක ය. පසුව ග්‍රන්ථයක් වශයෙන් පළ වූ එම කතා දාසයක එකතුව about women නමින් ඉංග්‍රීසියට නැගුණි. (චීන ජාතික ෂොං ලී ගේ අධීක්ෂණයෙන් යුතුව මවිසින් සිංහලට පරිවර්තනය කළ කත ගැන කතා නමින් 1018 දී ප්‍රකාශයට පත් කෙරුණි.) විවිධ කාන්තා චරිත වටා ලියැවුණු බින්ග් ෂිං ගේ එම කතා විටෙක උපහාසාත්මක ය, උත්ප්‍රාසාත්මක ය. තවත් විටෙක ශෝකීය. මනුෂත්වය උදෙසා දල්වන ලද පහන් එළි බඳුය.

බින්ග් ෂිං ගේ ග්‍රන්ථයෙහි පළමු ලිපිය ඇය අරඹන්නේ මෙසේය.

" පිරිමියකු ගැහැනුන් ගැන ලිවීමට යෑම තුළ කිසියම් හෝ නොගැලපෙන බවක් ඇතැයි පෙනීමට ඉඩ ඇත. එය කිසියම් උපහාසාත්මක කටයුත්තක් ද , නැතහොත් යම් පෙම් පළහිලව්වක් ද කියා ප්‍රශ්න කිරීමට ද ඉඩ ඇත්තේ ගැහැනු ගැන ලිවීම ගැහැනුන්ට ම අයත් කාර්යයක් ලෙස සලකමිනි. මිලියන 200 ක් පමණ වන චීන ජනතාව අතරේ ගැහැනුන් කෙරෙහි වැඩිපුරම ගෞරවය හා සැලකිලි දක්වන එකම මිනිසා මම යයි සිතමි. මා පිළිබඳව දන්නා අය මා සතු ගැහැනු ගති ගැන ද දනිති. ගැහැනුන් සතු මුදු බව ඉවසීම හා කල්පනාකාරී ගුණය මා සතුය. මට සොයුරියන් නොමැතිවීම හා මා අවිවාහකයකු වීමද ගැහැනුන් ගැන කතා කිරීමට ඇති අමතර සුදුසුකම් ය. එහෙත් මගේ මව හැර මගේ ජීවිතයට සමීප වෙනත් ගැහැනුන් නැත. මගේ මිතුරන්ගේ භාර්යාවෝ මගෙන් නිතර මෙසේ විමසති.

" දැන් ඔබේ වයස හතළිහත් පැනලා. හොඳ රස්සාවක් වගේම ප්‍රසිද්ධ නමකුත් තියෙන එකේ ඇයි හොඳ නෝනා කෙනෙක් හොයා ගන්නෙ නැත්තෙ?"

" මට තාම හොඳ කෙනෙක් මුණගැහුණේ නෑ."

" කොයි වගේ කෙනෙක්ද හොයන්නේ. අපිට කියන්නකො බලන්න අපි බලන්නම් හොඳ කෙනෙක් හොයල දෙන්න."

මෙබඳු අවස්ථාවල මම ලැජ්ජාවට පත් වන්නා සේම මට අවශ්‍ය වන්නේ කෙබඳු කතාවක් දැයි කියා ගත නොහැකිව පසුබාන්නෙමි.

දිනෙන් දින එකතු වන මා ප්‍රිය කරන ගැහැනු ලක්ෂණ ගණන අනුව බලන කල මම පරිපූර්ණ ගැහැනියක මවා දීම දෙවියන් වහන්සේට ම භාර දිය යුතුයි. මගේ මිතුරකු ඔහුට බිරියක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කාරණා විසි හයක් සඳහන් කර තිබුණි. වසර දහයක් ගතවූ පසු ඔහුට ගැළපෙන බිරිඳ සොයාගත නොහැකිවිය. අවසානයේ ඉතුරු වූයේ ඇය ගැහැනියක විය යුතුය යන කොන්දේසිය පමණි.

පසු වදනෙහි ලා බින්ග් ෂිං මෙසේ සඳහන් කරයි:

" හතළිස් වසරක අපක්ෂපාතී නිරීක්ෂණයෙන් පසු ගැහැනිය පිළිබඳ මා බැසගත් වැදගත් නිගමනය පැරණි කියමනකට සමානය.

" පිරිමියා තම ජීවිකාව සඳහා ජීවත් වෙයි. ගැහැනිය ආදරය වෙනුවෙන් ජීවත් වෙයි." එහෙත් ආදරය වෙනුවෙන් ජීවත් වීම තරම් වාසනාවට හෝ අවාසනාවට හේතු විය හැකි තවත් දෙයක් නැත.



කපිල කුමාර කාලිංග

## තරුණයනි! අපි රැකෙමු

## කැඳැල්ලක නෙත

අළුවන් අහස වැඩි වේලාවක් ගත වන්නට පෙර රන් රත් පැහැයෙන් බබළන බවට සේයාවක් හෝ නැත්තේ ය. එහෙත් තැනින් තැන පැනනැගෙන කුරුලු කුකුළු නද මෙන්ම රිය සක් හඬ ද තවත් දවසක උපත සිදු වන බවට දෙස් දෙයි. රැයෙන් අඩක් තිස්සේ උඩු බුරලූ බලු රැන නිහඬ නින්දේ පසු වන නිසා විය හැකිය.

"බල්ලො උඩුබුරනවා හරියට. ආයෙත් මරණයක් ආයෙ ඉතින් දෙකක් නෑ." යි කියන්නී අල්ලපු ගෙදර ධර්මාවතී නැන්දා ය. ඔව්. එකක් නොව මරණ කිහිපයක්ම සිදු වී හමාරය. එහෙත් ඒ බේදවාචකයන්ට වගකිවයුත්තේ උඩුබුරන බල්ලා හෝ අසුබ පෙර නිමිත්තක් සේ සලකන හූනාගේ චික් චික් හඬ හෝ නොවෙයි. ඒ ආවීර්ණ කල්පිත මතවාද ඉවත දමා අප යථාර්ථය දැකිය යුතුය.

මගේ වැඩිමලාගේ මිතුරෙකු ලෙස ආගිය ඉන්පසු දෙවැන්නාගේ තෙවැන්නාගේ පමණක් නොව සිව්වැන්නා ගේ ද පස් වැන්නා ගේ ද ආදරය හා මිත්‍රත්වය දිනා ගත් මහේෂ් ධනංජය බණ්ඩාර රත්වත්තේ තරුණයාගේ අකල් මරණයෙන් දින හතක් ද ගෙවී ගොස් මේ උදාවන්නේ අට වන දිනයයි. තවමත් මගේ කොල්ලො පමණක් නොව තවත් කොල්ලො රැසක්ම ඔහුගේ වියෝව විඳ දරාගත නොහුණු ව කඳුළු වගුරති. සුසුම් හෙළති. ඒ ඔහු කලණ මිතුරකු නිසාය. අතිශයින්ම සැහැල්ලු ප්‍රීතිමත් තරුණයකු වූ නිසාය. යතුරු පැදියෙන් අවසන් ගමන ගිය එකම තරුණයා ඔහු නොවේ. අපේ තාරුණ්‍ය රිය අනතුරු හා දිය අනතුරු හේතුකොටගෙන දිනක් පාසා අපට අහිමි වන අයුරු දැක දැක නිහඬව සිටීමට සිදුවීම තරම් ඛේදවාචකයක් තවත් ඇද්ද?

රටක අමිල සම්පත තරුණ ප්‍රජාවයි. වැඩක් කළ හැකි තරමට ජීවයෙන් හා නැවුම් සංකල්පනාවන් ගෙන් උතුරා හැලෙන්නේ ඔවුන්මය. එහෙත් අපේ තරුණ සම්පතෙන් අඩක් අනතුරුවලින් මිය යති. ඉතිරි අඩෙන් කොටසක් ත්‍රීවිල් රථ තුළට වී කල් මරති. තවත් පිරිසක් මත්ද්‍රව්‍ය රකුසාට ගොදුරු ව තාරුණ්‍යයේ ප්‍රමාදයත් අසීමිත කුසලතාවයක් විනාශ මුඛයට යෑමට ඉඩහැර කාලකන්නි භාවයේ පතුලටම ඇද වැටෙති. ඉතිං රටක් සෞභාග්‍යය අත්පත් කර ගන්නේ කෙසේද?

සිය වටිනාම සම්පත, දේශයේ ජීව සාරය විනාශයේ ඉරණමින් ගලවා ගන්නට කිසිදු වැයමක් නොදරන ආණ්ඩු මර නින්දේය. පුරවැසි ජීවිත පිළිබඳ කිසිඳු හැඟීමක්, තැකීමක් නොතිබූ අපේ ආණ්ඩු සමඟ සසඳා බලන කළ කොරෝනා වසංගතය හේතුකොටගෙන ලෝකයේ නොයෙකුත් රටවල අසරණ වූ ලාංකිකයන් මව්බිම වෙත ගෙන්වා ගන්නට වෙහෙසුණු ගෝඨාණ්ඩුවට ප්‍රණාමය හිමි විය යුතුය.

මන්ද යත්: ආණ්ඩුවකට ඡන්ද දායකයාය, පුරවැසියාය යනුවෙන් භේදයක් නුවමනා බැවිනි. ඡන්ද අයිතිය ඇතත් නැතත් බාල මහලු තරුණ හා ජාති කුල ආගම් භේදයන්ගෙන් තොරව සකල ප්‍රජාව දාරක ස්නේහයෙන් ඉවසන්නට ආණ්ඩුවකට යුතුකමක්ද වගකීමක්ද නැද්ද?

දශක තුනකට ආසන්න යුද්ධයෙන් අහිමි වූ ජීවිත පරයන තරමට රිය අනතුරු හේතුකොටගෙන මේ රටේ ජනතාව මරණයට හා ආබාධිත බවට පත් වන්නේ නම් වහා පිළියම් සෙවිය යුතුය. පුවත්පත් සිරස්තල හා හද කම්පා කරවන පුවත් මැවීමෙන් පලක් වේද?

රියැදුරු බලපත්‍ර ලබා දීමේ දී වඩාත් වගකීම් සහගත වීම වැදගත් නමුදු මේ ගැටලුවේ නැතහොත් මහා විනාශය මූලය සොයා යාමේදී පාසලද පන්සල ද මඟ හැර යෑමට නුපුළුවන.

අධ්‍යාපනයට පෙර ආගම වෙතට හැරෙන්නේ නම් අතිශයින් විද්‍යාත්මක හා අගනා දර්ශනයක බුද්ධ පුත්‍රයන්, බුදුබණ යනුවෙන් දේශනා කරන්නේ මොනවා දැයි පිරික්සා බැලිය යුතුය. අකල් මරණයට ලක් වූ තරුණයාගේ පින්කමට වැඩි භික්ෂුව සිය ධර්ම දේශනාවේ දී යළි යළිත් සඳහන් කළේ කර්මය පිළිබඳ ව ය.

සිදුවන හැම සිදුවීමක්ම කර්මයට බාර කොට 'අනිච්චේ දුක්ඛේ සංසාරේ' යැයි හූල්ලා වැටෙන්නේ නම් කිසිදු ප්‍රශ්නයකට පිළියමක් නොලැබේ. අර්බුද හා ඛේදවාචක ගොඩ ගැසෙනවා නියතය. පන්සල ද පාසලද අපේ දරුවාට විනය සංයමය හා නීතිය හරියාකාරව පහදා දුන්නේ නම්, 'තමා උපමා කොට අනෙකා සිතන්න' යන බුදු වදන හදක් පාසා කැටයම් කළේ නම් සමාජ අර්බුද රැසක් ම නිරාකරණය වනවා නොඅනුමානය.


පාසල ද පලක් ඇති ප්‍රායෝගික ජීවිතයට කිසිසේත් බද්ධ කරගත නොහැකි විෂයන් උගන්වනවා වෙනුවට ළමයින් තබා වැඩිහිටියන් පවා නිසියාකාරව නොදන්නා නීතිය වැනි විෂයයක් විෂය නිර්දේශයට එක් කළ යුතු නැද්ද? එවැන්නක් පිළිබඳව කතිකාවතක් පසුගිය කාලයේ ඇති වුවද එයද ඉංග්‍රීසි ඉගැන්වීමට සමාන වී නම් පලක් නො වන්නේය. අපේ ළමයා 3 වසරේ පටන් ඉංග්‍රීසි ඉගෙන ගත්තද හරියකට ඉංග්‍රීසියෙන් වාක්‍යයත් කියා ගන්නට නුපුළුවන.

දිය අනතුරු අවම කර ගන්නට ද අපේ ළමයාට පිහිනීම ප්‍රගුණ කළ යුතු නැද්ද? එවැන්නක් පාසලෙන් ඉවතලනවා වෙනුවට, පිහිනන්නට පිහිනුම් තටාක තබා වැහි පිල්ලක් වත් නැති පාසල් සංඛ්‍යාව ගණනය කරනවා වෙනුවට, සාධනීය පිළියම් සෙවිය යුතුමය.

"හරි දුකයි අම්මේ. හැමතිස්සෙම මහේෂ්ව පේනවා. හිනාව කථාව ඇහෙනවා." යි මගේ කොල්ලෝ ළතවන කළ මම ද සුසුමක් හෙළමි. මරණය තබා ජීවිතය වත් නොදන්නා මේ මල් කැකුළු මරණයේ රුදුරු දුක ඉවසා දරා ගන්නේ කෙලෙසද? මිතුරු හද කම්පාව මෙතෙක් නම් මහේෂ් ධනංජය බණ්ඩාර රත්වත්තේ නම් තරුණයාගෙ මවුපියන් හා සොහොයුරන්ගේ ශෝකාන්තය කොතෙක් බලවත්ද? අපේ තරුණ සම්පත රැක ගන්නට මේ බලවත් හා තෙදවත් ආණ්ඩුව වහා පියවර ගනු ඇතැයි අම්මා කෙනෙකු ලෙස අපේක්ෂා කරමි.



ශාන්ති දිසානායක



## ටොම්සන් මහත්තයා

## අලුත් ගමනක්

ටොම්සන් මහත්තයා සිටින්නේ කොහේ දැයි සොයා ගන්නට අන්තර්ජාතික පොලීසිය පහු ගිය කාලය පුරාම මහත් උත්සාහයක යෙදිණි. උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා ද, නැගෙනහිර කලාපයේ සිට බටහිර කලාපය දක්වා ද හැම තැනකම ටොම්සන් මහත්තයා සොයා ගන්නට අන්තර්ජාතික පොලිසිය ගත් උත්සාහය ව්‍යර්ථ විය. ඒ තරම් සූක්ෂ්ම ලෙස වෙස් වළාගන්නට ටොම්සන් මහත්තයාට හැකි වූයේ කෙසේදැයි කාටත් පුදුමයක් විය.

එක් දවසක උදෑසන ටොම්සන් මහත්තයා ලේක් හවුසියට ආවේ කවුරුනුත් පුදුමයට පත් කරවමිනි.

“ඇත්තටම ටොම්සන් මහත්තයා... කොහේද මෙච්චර කාලයක් හැංගිලා හිටියේ...?” කියා ලේක් හවුසියේ දිනමිණේ බද්දරමල්ලේ කට්ටිය ටොම්සන් මහත්තයා වට කර ගෙන ප්‍රශ්න අසන්නට පටන් ගත්හ.

“මට තේරෙන්නේ නෑ ඒ ප්‍රශ්නේ...?” කියා ටොම්සන් මහත්තයා පුදුමයෙන් වටපිට බැලුවේය.

“නෑ... අපි අහන්නේ ටොම්සන් මහත්තයාව හොයා ගන්න අපි අන්තර්ජාතික පොලිසියටත් දැන්නුවා... ඒත් හොයා ගන්න බැරි වුණා... උත්තර ධ්‍රැවයේ ඉඳලා දක්ෂිණ ධ්‍රැවයටත්, නැගෙනහිර ඉඳලා බස්නාහිර දක්වාත්, හැම තැනම හෙව්වා... අපි ඉතින් හිතුවා අර රටින් පිට වෙලා හැංගිලා ඉන්න පාතාලයෝ වාගේ ටොම්සන් මහත්තයාත් වෙස් වළා ගෙන හැංගිලා ඉන්නවා කියලා...”

“අපෝ නෑ... මං එහෙම කළේ නෑ... බද්දරමල්ල නැති හින්දා මං ඉතින් ඒ ලැබුණු විවේකයෙන් ලෝකේ වටේ ඇවිදින්න ගියා... අපි මේ දූපතක හිරවෙලා ඉඳලාම හරි යන්නේ නැනේ... ලෝකේ වටේ සිද්ධ වෙන්නේ මොනවාද කියලා දැන ගන්නත් එපායැ... අනික පහු ගිය කාලේ මේ කොරෝනා හින්දා ආපසු ලංකාවට එන්නත් විදිහක් නැතිව හිටියේ... ඒ වුණාට ආයෙත් බද්දරමල්ල පටන් ගන්නවා කියලා දැන ගන්න ලැබුණු හින්දා, ආපහු ආවා... ටොම්සන් මහත්තයාව හොයා ගන්න අන්තර්ජාතික පොලිසියට බැරි වෙන්න ඇත්තේ මං හැංගිලා හිටපු නිසා නෙවෙයි... මාව අඳුරගන්න බැරි වුණ හින්දා වෙන්න ඇති...” කියා ටොම්සන් මහත්තයා සිනාසුණේය.

“එතකොට ටොම්සන් මහත්තයා... කොරෝනාවට නිරෝධායනය වෙලාද ලේක් හවුසියට ආවේ... එහෙම නැතිනම් කටුනායක ඉඳලා කෙළින්ම ආවාද? අපොයි... අපොයි...” කියමින් බද්දරමල්ලේ කට්ටිය කෑ ගැහුවෝය.

“අනේ නෑ... මං ආවේ සති දෙකකට ඉස්සෙල්ලා... ඇවිල්ලා කන්දකාඩුවේ නිරෝධායනය වුණා. ඒක අපේ යුතුකම නේ... නැතිනම් කොහොමද මේ වගේ කොරෝනා නැති රටක් රැක ගන්නේ... ඊට පස්සේ තමයි මං මෙහාට ආවේ...”

බද්දරමල්ලේ කට්ටිය මහත් සන්තෝෂයෙන් ටොම්සන් මහත්තයාට සංග්‍රහ කළහ.

“ටොම්සන් මහත්තයා ලෝකේ වටේ ගිය එකත් හොඳයි... එතකොට ඉස්සරට වඩා හුඟක් දේ අහන්න, දකින්නත් ඇති නේ... ඒවා බද්දරමල්ලට ලියන්නත් පුළුවන් නේ... අපේ රසිකයන්ට කියවන්න... ටොම්සන් මහත්තයාට මොනවාද හිතුණේ හුඟක් කාලයකට පස්සේ ලංකාවට ආවාම...?”

“ඒක නම් හරිම අපූරු හැඟීමක්... හුඟක් වෙනස්... හුඟක්ම වෙනස්... රටත් වෙනස්... ආණ්ඩුවත් වෙනස්... ජනී ජනයාත් වෙනස්... මං හිතනවා අපේ රටට ලොකු ගමනක් යන්න තියෙනවා... ඒක නිකම්ම නිකම් ලොකු ගමනක් නෙවෙයි... මුළු රටම වෙනස් කරන ලොකු ගමනක්... ” කියා ටොම්සන් මහත්තයා දැඩි හැඟීමකින් කීවේය.

“ඒ කියන්නේ ටොම්සන් මහත්තයා බොහොම බරපතළ විදිහට හිතලා තියෙන හැඩයි...”

ටොම්සන් මහත්තයා කිසිවක් නොකියා වට පිට බැලුවේය.

“මං කිව්ව දේ වැරදියි වගේද?” කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

“අපොයි නෑ... වැරදියි නෙවෙයි... අපි කිව්වේ... බොහොම බරපතළ විදිහට හිතලා තියෙනවා කියලා...”

“ඒක එහෙම තමයි වෙන්න ඕනෑ... අපි හැම කෙනෙක්ම බොහොම බරපතළ විදිහට හිතන්න ඕනෑ... නැතිනම් අපේ රටට දිග ගමනක් යන්න බෑ... අපි හැම කෙනෙක්ම වෙනස් වෙන්න ඕනෑ... අලුත් විදිහට හිතන්න පටන් ගන්න ඕනෑ... අතීතයේ සිද්ධ වෙච්චි දේවල්වලින් පාඩම් ඉගෙන ගන්න ඕනෑ... පරණ කල්ලිවාදය, පරණ දූෂණ, පරණ අකාර්යක්ෂමතාව වෙනුවට බොහොම බරපතළ විදිහට හිතලා අලුතින් පටන් ගන්න ඕනෑ... මෙහෙම අවස්ථාවක් ආයේ ලංකාවට ලැබෙන්නේ නෑ... මේක තමයි පළමුවැනි හා අවසාන අවස්ථාව... මේ වෙලාවේ බරපතළ විදිහට හිතුවේ නැතිනම් ආයේ ඒ වැරැද්ද හදා ගන්න වෙලාවක් එන්නේ නෑ...” කියා ටොම්සන් මහත්තයා හුනස්නෙන් නැගිට්ටේය.

“ටොම්සන් මහත්තයා යන්ඩද?” කියා බද්දරමල්ලේ කට්ටිය ඇසුවෝය.

“යන්ඩ කිව්වට යන්ඩම නෙවෙයි... මගේ පරණ යාළුවෝ මුණ ගැහෙන්න ඕනෑ... ඇම්බන් මහත්තයා හොයා ගන්නත් ඕනෑ... ජනරංජන මහත්තයාත් හොයා ගන්න ඕනෑ... ඒ වගේම උන්නැහේ කොහේ ඉන්නවාද දන්නෙත් නෑ... මං ඉතින් ඒ ගොල්ලෝ හොයා ගෙන ආපහු එන්නම්... අපි ඔක්කොම එකතු වෙලා අලුත් ගමනක් යමු...”


ටොම්සන් මහත්තයා බොහොම සන්තෝසෙන් ලේක් හවුසියේ පඩි පෙළ බසින්න පටන් ගත්තේය.



බන්දුල පී. දයාරත්න

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ





# සිංහල ගමේ අපූරු මිනිස්සු

දේදුනු තැන්න

සිංහල ගම හරිම සිරියාවන්තය. නිලට නැමුණු කඳු වැටි, ගම මායිම් කළ ඇළ දොළ, එකයායට පීදෙන වෙල් යාය ඇතුළු සොබා දහම ගමට ගෙන එන්නේ අමුතු චමත්කාරයකි.

ගමම මට කවියක්ය
නිලට කඳු පෙළ නැමෙන
සිහින් සුදු මිහිදුමෙන්
ළහිරු රැස් කෙඳි පෙරෙන
කුසුමකට දැවටෙමින්
රැන සමනල ඇදෙන
සිසිලසින නව උදය
සුළඟ පිවිතුරු හමන
ගමම මට කවියක්ය
නිලට කඳු පෙළ නැමෙන
සිහිල් දිය කළය ගෙන
ලිං තොටින ළඳක් යන
අහිංසක සිනා රැළි
මුවින් මුව අග පිපෙන
සෙනෙහසක වැසි වැටී
දිය කඳුරු ඇලි හැලෙන
කුරුලු ගී සර අතර
කුඹුර කෙත කිරි වදින
ගමම මට කවියක්ය
නිලට කඳු පෙළ නැමෙන
ගොපලු වස්දඬු රාව
වෙල පහළ මතු කෙරෙන
කලාතුරකින් වුවද
නලමලක් පිපීයන
ගම් දොරෙහි වරකාව
මෝරලා පැණි පෙරෙන
මිහිරි මී මැසි තුඩින
අතු අගෙහි වද බඳින
ගමම මට කවියක්ය
නිලට කඳු පෙළ නැමෙන
කන්දකින් කන්දකට
පාට දේදුනු ඇදෙන
උණ පඳුරු සේයාව
දොළ දියෙහි අතවනන
ගමම මට කවියක්ය
නිලට කඳු පෙළ නැමෙන

සිරිලක ගම්බිම් වල නොමඳ කලක් සැරි සැරීමෙන් මා ලද අත්දැකීම් බොහෝය. ගම කෙරේ මෙන්ම අහිංසක ගැමියා කෙරේද මා තුළ ඇති ඇල්ම අති මහත්ය.

ගැමිලිය ගමේ මිහිර දෙගුණ කරන්නීය. උදෑසන දකින ගැමි ළඳකගේ රූ සොබාව මඩවල රත්නායක කවියා මේ ලෙස වර්ණනා කරයි.

**මිහිරියේ ගැමිලදේ**

කැලෑමල සුවඳ මුසු මිහිර දෙන නව ළඳේ
පැන්පුරා කළය ගෙන තබා ඔබ මුදු බඳේ
අහිංසක මුවදෙනක ගුණය රැඳවූ හදේ
උදෑසන මා දකින මිහිරියේ ගැමි ළඳේ

ගම්දොරදී අපූරු මිනිස්සු අපට මුණ ගැසෙති. අයෙක් අහිංසක මෝඩ පහේ ගැමියෙකි. තවත් කෙනෙක් දෙලොවක් අතර ජීවත් වන්නෙකි. ගමේ වෙසෙන මෙම අපූරු මිනිස්සුන් ගැන දායනුකම්පාවෙන් බැලීමට ගැමියා සමත් විය.

මෙම අපූරු මිනිස්සු කෙරෙහි සිංහල සාහිත්‍ය වියතුන්ගේ ඇස ගැසුණ අවස්ථා එමටය.

රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමි කොළඹ යුනිවර්සිටි කොලීජියෙහි කලක් ඉගැන් වූ ආචාර්යවරයෙකි. මහාචාර්ය සරච්චන්ද්‍ර මහතා පවා රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන්ගේ ආභාශයෙන් ප්‍රාචීන භාෂා සාහිත්‍ය හා දේශීය කලා ශිල්ප කෙරෙහි යොමු වූ බවක් ඔහුගේ පින් ඇති සරසවි වරමක් දෙන්නේ නම් කෘතියේ සඳහන් කර ඇත. සංස්කෘත, පාලි හා ප්‍රකෘත යන භාෂාවන් පිළිබඳ උන්වහන්සේගේ දැනීම මලලසේකර මහතාගේ දැනීමට වඩා ගැඹුරු වූවක් බව සරත්චන්ද්‍රයෝ පවසති.

රඹුක්වැල්ලේ හිමියන්ට කිරා නමින් යුත් ඇබිත්තයෙක් සිටියේය. කිරා අපූරු ගැමි චරිතයකි. ඔහු ඉතා කම්මැළිය, නින්දට බොහෝ කැමතිය. "කිරා බුදිද බං" යන සුපතළ කවිය උන්වහන්සේ රචනා කළේ මොහුගේ චරිතය ඇසුරෙන්ය.

උදේ පටන් රෑ වන තුරු
රෑ තිස්සේ එළි වෙන තුරු
අතන මෙතන වැටී නිදන
කිරා බුදිද බං

මහාචාර්ය විමල් දිසානායක මහතා වන්නියේ නිකවැව ගමේ තමා ලද අත්දැකීම් කවියට නැගූ කවියෙකි. නාගල කන්ද කවි පොතේ එන නාගලකන්ද හා සිට්ටම්මා වැනි කවිවලින් මෙම අත්දැකීම් මොනවට ප්‍රකාශ වේ.

තම පියා මුල් ගුරු තනතුර හෙබවූ නිකවැව රජයේ පාසැලේ ගුරුගෙදර සිටි දවස තම ඇස ගැසුණ සොබා දහම මෙන්ම අපූරු මිනිසුන් ගැන ද ඔහු කවි ගී ලීවේය.

"අවුසද හාමි" කවි පන්තිය ගමේ අපූරු මිනිසකු ගැන දයානුකම්පාවෙන් ලියූ අපූරු කවි පන්තියකි.

අවුසදහාමි කවි පන්තිය - මනුෂ්‍යත්වය කෙරේ දයානුකම්පාවක් දක්වන්නකි. එය විමල දිසානායකයන්ගේ "ඉතිහාසය සිනාසෙයි" කාව්‍ය ග්‍රන්ථයට ඇතුළත්ය.

**අවුසදහාමි**

කයියක් මරණයක් මඟුලක් ගමෙහි වෙන
ඔහු වැඩ කරයි හැම විට මුල් තැනම ගෙන
හිරු මඬලක් විලස අහසින් නොම බසින
පතුරයි ගමේ දස අත සොම්නස් කිරණ

අවුසදහාමි තනිකඩයෙකි වෙසෙන ගමේ
උදව් කරයි නිති පා බල සුමිතු දමේ
සෙවණ දෙවන නුග ගස සේ ගමෙහි ඉමේ
ඔහු මුදු සලකුණකි හොබවන ගම උරුමේ

අවුසදහාමි අප මුළු ගම මවිත කොට
ගමහැර දා ගියා නොකියා කිසිවකුට
රහස නොදන්නෙමු අපි නම් කිසිලෙසට
කඩා වැටුණි හිරු අහසින් වැව් දියට

අබිරහස් හේතුවක් හින්දා මෙලෙස
ඔහු ගියා සොයා වෙන ගමක සිසිලස
නුග ගස මැලව ඇත පාමින් සිතක රොස
කවියක් ලියමි මගෙ දුක පලවනු පිණිස

"සෝමා" ඇඹුල් අබේ නැමැති කෑගලු දිස්ත්‍රික්කයේ කඳුකර ගම්මානයේ ද මට හමු වූ අපූරු ගැමි චරිතයකි.

රඹුක්කන් පොළ දාට පොළට යන සෝමා පොළේ කුඩා කුප්පිවල තබාගෙන සුවඳ විලවුන් විකුණන මුස්ලිම් වෙළෙන්දාගෙන් සුවඳ විලවුන් තැවරූ පුලුන් රොදක් මිලදීගෙන කනේ ගසා ගැනීම මහත් අභිරුචියෙන් කරයි. අපේ මහගෙදර ඉස්තෝප්පු බැංකුවේ කාටත් නොදැනෙන සේ ඇඳිගන්නා සෝමා වචනයක් දෙකක් දොඩා පවසා බලාගත් දෙස බලාගෙන මඳක් පසු වී කාටත් නොකියාම පිට වී යයි. ඔහු ආගිය දින දැනගත හැකි වන්නේ කනේ ගසා ගත් පුළුන් රොදින් ද අග කවුරුන් නුරුස්සන සුවඳ විලවුන්වලින් වහනය වන සුවඳිනි.

සෝමා කලක් ගමෙන් අතුරුදහන්ව සිට යළි ගමට පැමිණියේ ඈත ගමක බින්න විවාහක ගොස් සිට ඉන් මිදීමෙන් පසුවය. සෝමා මරණයට බිය මිනිසෙකි. උඩරට දුම්රිය මගේ කන්සලගමුව අසල දී සෝමා දුම්රියට අසුවී මිය ගිය බව ආරංචි විය. සෝමා දුම්රියට පැන දිවි නහ ගත්තා ද? නොඑසේනම් දුම්රියට නොදැනීම අසුවුණාද? යන්න ගමේ කාගෙත් කතා බහට ලක් විය.

ගමේ අවුසදහාමි, සෝමා වැනි චරිත දෙස සානුකම්පිත දෘෂ්ටියකින් බැලිය යුතුය. එයට අනුබලයක් අවුසදහාමි කවි පන්තියෙන් ද ලැබෙයි.

ගැමි පරිසරයෙන් චරිතයටත් චරිතයෙන් ගැමි පරිසරයටත් දීප්තියක් ලැබෙයි.



**සුනිල් සරත් පෙරේරා**





වෙද නළාව

# අතුරු ආබාධ ගැන අතුරු කතාවක්

බෙහෙත් තුන්ඩුවත් අතට අරන් යන්න ගියපු ලෙඩා ආපහු හැරිලා ඇවිත් මගේ ලඟින් ඉඳගත්තේ පෝලිමේ ඊලඟට හිටි කෙනාවත් ටිකක් එහාට තල්ලුකරගෙන. මම හිතුවෙ අසනීපය ගැන මොකක් හරි දෙයක් කියන්න බැරි වෙන්න ඇති කියල. ඒත් ලෙඩාගෙ ප්‍රශ්නය වෙනස්ම එකක්.

" ඩොක්ටර්, මේ බෙහෙත් ටික බීවම මට වෙන වෙන ලෙඩ හැදෙන්න පුලුවන් ද ?

අතුරු ආබාධ එහෙමත් නැත්නම් සයිඩ් ඉෆෙක්ට්ස්. බෙහෙත් ගන්න එන හැමෝම අහන්නෙ නැති වුණත් හැමෝම හිතේ තියාගෙන ඉන්න ප්‍රශ්නයක්. එක බෙහෙතක් නිසා තව ලෙඩ ගොඩක් හැදෙන්න පුළුවන් කියල සමහරු කියනව අපිට ඕන තරම් ඇහිල තියෙනව. ඒත් ඒ කතාව ඇත්ත ද?

ඇත්තටම බෙහෙතක අතුරු ආබාධයක් කියන්නේ ඒ බෙහෙත් ගැනීම නිසා ලැබෙන හොඳ ප්‍රතිඵලය එක්කම ලැබෙන සුළු අහිතකර ප්‍රතිඵලයක්. දියවැඩියාව පාලනය කරන්න ගන්න බෙහෙතක් නිසා දියවැඩියාව පාලනය වෙන ගමන් කෑම අරුචිය එන්න පුළුවන්. වේදනාව අඩු කරගන්න දෙන වේදනා නාශකයක් නිසා බඩේ දැවිල්ල එන්න පුළුවන්.

ලෝකෙ බෙහෙත් වර්ග දියුණු වෙනකොට මේ කියන අතුරු ආබාධ පුළුවන් තරම් අඩු බෙහෙත් වර්ග හැදුණා. ඉස්සර දීපු වේදනා නාශක නිසා හැදුණ තරම් ලොකු බඩේ දැවිල්ලක් දැන් අලුතින් එන වේදනා නාශක වලින් හැදෙන්නේ නෑ. හැබැයි මේ ලෝකෙ කවදාවත් අතුරු ආබාධ නැති බෙහෙත් හදන්නත් බෑ.

ඉතින් එහෙම නම් ඇයි මේ අතුරු ආබාධ තියාගෙන මේ බෙහෙත් මිනිස්සුන්ට දෙන්නේ ? ඒක තමයි ගොඩක් අයට ඊළඟට එන ප්‍රශ්නය.

දොස්තර කෙනෙක ළඟට ලෙඩෙක් ආවාම දොස්තර එයාට බෙහෙත් නියම කරන්න කලින් හිතන දෙයක් තියෙනවා. ඒ තමයි මම මේ ලෙඩාට මේ බෙහෙත දුන්නොත් මොකද වෙන්නෙ ? නොදුන්නොත් මොකද වෙන්නෙ කියන කාරණාව.

බෙහෙත දුන්නම ලෙඩාට ලැබෙන හොඳ ප්‍රතිඵලය බෙහෙතෙන් එන අතුරු ආබාධය නිසා වෙන නරක ප්‍රතිඵලයට වඩා ගොඩක් වැඩි නම් අපි ඒ බෙහෙත ඒ ලෙඩාට දෙනවා. මෙහෙම හිතන්න. අපි හැමෝම දැකල තියෙනවා ප්‍රතිකාර නිසා කොන්ඩෙ සම්පූර්ණයෙන්ම ගැලවිලා ගිය පිළිකා රෝගීන්. හැබැයි ඒ අය ජීවත් වෙන්නෙ ඒ බෙහෙත නිසා. ජීවිතයක් බේරෙන වෙලාවක අතුරු ආබාධයක් හැටියට කොන්ඩෙ යනවා කියන එක නොසලකා හැරිය හැකි තරම්. ඒත් අපි කවදාවත් සුළු ආබාධයකට කොන්ඩෙ යන බෙහෙතක් දෙන්නෙ නෑ.

දියවැඩියාව ප්‍රෙශර් එක වගේ ලෙඩවලට දෙන බෙහෙත් වුණත් එහෙමයි. ප්‍රෙශර් එකට දියවැඩියාවට දෙන බෙහෙත් නිසා වකුගඩු නරක් වෙනවා කියලා සමහරු කියනවා අපිට ඇහිලා තියෙනවා. ඒත් ඇත්ත කතාව තමයි ඒ බෙහෙත හරි විදිහට නොගත්තොත් හරිම ඉක්මනින් දියවැඩියාවයි ප්‍රෙශර් එකයි නිසා වකුගඩු දෙක නරක්වෙලා යන්න පුළුවන් කියන එක.

තවත් වැදගත් දෙයක් තමයි අපි අතුරු ආබාධ ගැන කතා කරන්නේ හරි ප්‍රමාණයෙන් බෙහෙත ගන්න වෙලාවල. මොකද බෙහෙතක මාත්‍රාව එහෙමත් නැත්නම් සැරේකට ගන්න ඕන ප්‍රමාණය තීරණය කරල තියෙන්නෙ අතුරු ආබාධ අඩුම වෙන හැටියට. ඒත් කවුරුහරි බෙහෙත වැඩිපුර බිවුවොත් වෙන්නෙ බෙහෙත විස වෙන එක මිසක් අතුරු ආබාධයක් එන එක නෙවෙයි. ඒ නිසා බෙහෙත වැඩිපුර බීවම විස වුණා කියලා නියමිත ප්‍රමාණයට බිවුවම අතුරු ආබාධ එනව කියලා හිතන්න එපා.

වැදගත්ම දේ තමයි බෙහෙත්වලින් එන්න පුළුවන් අතුරු ආබාධ අඩු කරගන්න අපිට මොනවද කරන්න පුළුවන් කියන එක.

පළවෙනිම දේ තමයි වෛද්‍ය උපදෙස් මත විතරක් ම බෙහෙත් ගන්න එක. මොකද වෙන කාටවත් බෙහෙත්වල අතුරු ආබාධ ගැන දැනුමක් නෑ. ඊළඟට කියල තියෙන ප්‍රමාණයට වගේම කියල තියෙන දවස් ගාණට විතරක් බෙහෙත් ගන්න එක. ක්ලිනික්වලට එන සමහර රෝගීන් මාසෙ බෙහෙත් ටික ඉවර වුණාම ක්ලිනික් නෑවිත් ඒ බෙහෙත් ටික ෆාමසියෙන් අරන් දිගටම බොනවා. එහෙම බීල අතුරු ආබාධ එක්ක එන රෝගීන් අපිට හමුවෙනවා. ඒ නිසා විශේෂයෙන්ම දියවැඩියාව ප්‍රෙශර් වගේ ජීවිත කාලයම දිනපතා බෙහෙත් ගන්න රෝගීන් මාසයකට හෝ දෙකකට සැරයක් අදාළ ක්ලිනික් එකට ගිහින් පරීක්ෂා කරවගෙන බෙහෙත් ගන්නවා නම් අතුරු ආබාධ අඩු කරගන්න පුළුවන්.

හැමෝම දැනුවත් වෙන්න ඕන අනිත් කාරණය තමයි ඕනෑම බෙහෙතක අතුරු ආබාධ ගැන දැනගැනීමේ වැදගත්කම. ඔබට පුළුවන් ඔබේ වෛද්‍යවරයාගෙන් ඔබට දෙන බෙහෙතේ අතුරු ආබාධ ගැන අසා දැනගන්න. එහෙම දැනුවත් වුණාම ඔබට පුළුවන් හරිම විදිහට බෙහෙත පාවිච්චි කරන්න. හැබැයි අතුරු ආබාධ තිබෙන නිසා බෙහෙත් නොගෙන ඉන්න එක නම් ඒ තරම් නුවණට හුරු වැඩක් නෙවෙයි.




**වෛද්‍ය නුවන් තොටවත්ත**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## අපට තිබුණේ නැද්ද ඇත්තට කසාදේ නොලියාම ඉන්නට



■ ටිකක් වයසට ගියත් ඇයි බැරි
අතින් අල්ලන් පාරෙ යන්නට
කවුද කිවුවේ ලැජ්ජ වෙනවැයි
එහෙම ගියොතින් ළමයි දෙන්නට
සිද්ද වෙන බව දන්නවා නම්
කසාදෙන් පසු ඇත් වෙන්නට
අපට තිබුණේ නැද්ද ඇත්තට
කසාදේ නොලියාම ඉන්නට

● කියන තරමක් කතා ඔක්කොම
ඔහෙට යෑ මට නොවැ ඇහෙන්නේ
මදන ගායලු මඟුල් විසයලු
හොඳම පදවලිනුයි කියන්නේ
බැඳපු ඈයෝ ඉන්න ඕනෑ
දහ අටේ උන් වගෙ නෙවෙයි නේ
ඔහෙගෙ පාඩුවෙ ඔහේ ඉන්නකො
මගේ පාඩුවෙ මං හිඳින්නේ

■ බස් එකේ පිටිපස්සෙ ඉඳගෙන
ගියේ අත්වැල් එකට පටලා
අතහරින්නට ලෝබ හිතුවේ
මේ ඔයාමද එදා කමලා
සුවඳ මතකයි සෙනෙහෙ කොළයේ
ඔයා දුන් හතරකට නමලා
ඒ වගේ ආදරේ දෙන්නට
බැරිද දැන් මගෙ නළල ඉඹලා

● අනේ ඇත්තට ඇයි නටන්නට
හදන්නේ මේ මඟුල් විගඩම්
හතළිහත් පැන්නාට පස්සේ
මොකටදෑ ඔය මනමාලකම්
රට්ටු කියනා කයි කතන්දර
ඔහෙගෙ කනටත් ඇහෙනවා නම්
එන්නෙ නෑ ඕවා කියාගෙන
මගේ අහලට වත් තවත් නම්

■ පැටවු දෙන්නත් හදයි දවසක
අපි වගේ උන්ගේම කූඩු
ආදරේ හැටි දන්නෙ නැත්නම්
උන්ට වෙනවා බොහොම පාඩු
දැකල නැතුවද තරුණ කාලෙම
රණ්ඩු සරුවල් කරන ජෝඩු
රට්ටු හින්දා ඔයා මැණිකේ
මගෙන් අරගන්නවද වාඩු


● මේක ඒරොප්පේ වුණානම්
ඉන්නවා ඔහෙ කියන හැටියක
මක් කරන්නද ඔහේ පිච්චෙමු
රටේ උන් ළිප තැබූ තැටියක
බැඳී ඉන්නේ බැන්දෙ කවුරුද
කියා වත් නොම දන්න මිටියක
බැඳපු උන්ගේ ආලෙ ඇත්තේ
මහ රෑට ගන අඳුරු කුටියක

■ ඔන්න ඕකම තමයි මැණිකේ
කාට කාටත් වැරදිච්ච තැන
රණ්ඩු සරුවල් එළියෙ දාගෙන
ලැජ්ජ වෙනවා ආදරේ ගැන
දරා ගන්නම බෑ වගේ නම්
ඕන එකෙකුට ගැනුණ දෙන් උණ
දහ අටේ වගෙ ආදරෙන් ඉමු
එහෙම හිටියම ගහනවයෑ හෙණ



දිල්රූ ජයසේකර

## යකාගේ හැටියටයි විමානේ



රටක නායකයා හෝ නායිකාව අලුතෙන් පත් වීමත් සමඟ එම අලුත් පාලක මණ්ඩලය විසින් ඇතැම් ආයතනවල තනතුරු සඳහා නව පිරිසක් තෝරා පත් කර යැවීම සාමාන්‍යයෙන් සිදු වේ. කලින් ආණ්ඩුව විසින් පත් කළ නිලධාරීන් වෙනත් ස්ථානවලට මාරු කර යැවෙන අතර අලුත් ආණ්ඩුව විසින් වෙනත් අය පත් කර එවීම බොහෝ රටවල සිදු වන ක්‍රමයයි. නමුත් එම ආයතනවල දේශපාලන නොවන පත්වීම්වල රාජකාරි කරන්නන්ටත්, රටේ ජනතාවටත් මේ ක්‍රමය නුරුස්සන, හිරිහැරකාරී ක්‍රියාමාර්ගයක් බවට පත් වී ඇත්තේ ඇයි? තමන් විසින් පත් කෙරෙන නිලධාරීන් සහ නිලධාරිනියන් එම තනතුරු හෙබවීමට උපරිම ශක්‍යතාවක් ඇති අය ලෙස ආණ්ඩුව පොරොන්දු වුවත් ආණ්ඩු මාරුවත් සමඟ සිදු වන මෙම තෝරා පත් කර ගැනීම් බොහෝ විට ආයතන තුළ අනවශ්‍ය ආකූලතා ඇති කිරීමට හේතු වන්නේ ඇයි?

මෙම ආයතනවල වැඩකටයුතු ගලා යෑම වඩා කාර්යක්ෂම ඵලෝත්පාදකයක් කරනු වෙනුවට තමන් විසින් වූ පත්වීම් නිසා එම කටයුතු අඩපණ වීම හෝ එහි ගමනේ කැලඹීමක් වේ නම්, සියලු ආණ්ඩු නිසා එසේ සිදු වීම ඉතිහාසය පුරා යම් යම් අවස්ථාවල සිදු වූ සහ සිදු වෙමින් පවතී නම්, කිසියම් ආණ්ඩුවක් ඒ ඇයි කියා සොයා බලනු පිණිස, විමසීමක් කර ඇද්ද? "දැන් මම තමා ලොක්කා. මම ආණ්ඩුවේ පත්වීමක්. මගේ ක්‍රමයට වැඩේ කරපන්" නොකියා, ජනතාවට සිදු විය යුතු සේවය, එම ආයතනය විසින් සිදු විය යුතු කාර්යභාරය නොපිරිහෙළා ඉටු කිරීමට, එම ආයතනය වැඩ කරන ආකාරය ගැන සොයා බලන, නායක නායිකාවන් ඔබට හමු වී ඇති ද?

එසේ වූ අවස්ථා සොච්චමක් සමඟ එසේ නොවනා අවස්ථා සිය දහස් ගණනක් වූ විට ආණ්ඩු මාරුවේ තනතුරු මාරුව හිසරදයක් වීම ස්වභාවිකය. වැඩ කිරීමට නොහැකි හෙංචයියන් තනතුරුවලට පත් නොවී වැඩකරුවන් පත් වීම ආයතනයක් සාමාජික සාමාජිකාවන්ට පක්ෂ පාට බේදයක් නැති ශක්තියක් සපයයි. ඒ නිසා හැම පාලක මණ්ඩලයක් සතුවම වැඩකරුවන් වැඩකාරියන් මිස බොරුකාරයන් බොරුකාරියන් සිටීමෙන් පලක් නැත. පලක් වන්නේ ඒ හෙංචයියන්ට පමණි. ආණ්ඩුවටවත් පලක් වන්නේ නැත. ඒවායින් පාඩම් ඉගෙන ගන්නා ජනතාවගේ ඡන්දය නැවත ලැබීමට 'පිස්සු කෙළිනා ආණ්ඩුවලට' ඇති ඉඩ අඩු වීමයි. නීත්‍යනුකූල ඡන්ද විමසීමකින්, රටක සාමය, සෞභාග්‍යය වනසන පාලක මණ්ඩලයක් නැවත නැවත එක දිගට පත් වන්නේ නම් ඒ යකා ඒ විමනේ හැටියට විය යුතුය, නමුත් මානව හිමිකම් ගැන අල්පයක් වත් දන්නා මිනිසුන් ඉන්නා රටවල කණප්පුව පහසුවෙන් කරකැවීම නොනවතියි.

පිරිමි පලතුරු

එසේ නම් තමන්ට පක්ෂපාත, විශ්වාසී, අවශ්‍ය කාර්යය ඉටු කර ගැනීමට සුදුසුම ගුණවත්ම අය පත්කර ගැනීම ගැන පාලන මණ්ඩලයක් විසින් ඉටු වෙද්දී වඩා සුපරීක්ෂාකාරී විය යුත්තේ ඒ ආණ්ඩුවම මිස වෙන කෙනකු නොවේ. අප නියෝජනය කිරීමට අප පත් කළ අය වැඩ බැරි දාසයෙක් ද නො එසේ නම් නියම වැඩකරුවකුද යන වගකීමේ බර උසුලාගත යුත්තේ එම පත්වීම සිදු කළ ආණ්ඩුවයි.

බිම් මට්ටමේ සොයා බැලීම්, ආයතනයේ දේශපාලන නොවන පත්වීම්වල වැඩකටයුතු කරන පිරිස සමඟ සාකච්ඡා, සමීක්ෂණ, පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව, ඒවා වග විභාගය නීත්‍යනුකූලව සිදු කිරීම, අවැසි නම් තනතුරුවල සිටිනා අය මාරු කරවා යැවීමෙන් ආණ්ඩුවකට අඩුම තරමේ තමන්ගේ පාලන මණ්ඩලයේ සම්පූර්ණත්වය රැක ගැනීමට උත්සාහ කරණු හැකි. එහෙත් කාරණා එසේ සිදු වීමට ඉඩක් ඇති බවට සාමාන්‍ය වැසියන්ට විස්වාසයක් ඇති නොවන්නේ ඇයි? පක්ෂ පාට බේදයකින් තොරව, ආණ්ඩු, ඒ තරමට නින්දා සහගත දෙයක් ලෙස සාමාන්‍ය වැසියන්ට පෙනෙන්නේ ද?

"කවුරු ආවත් අපිට වැඩක් වෙන්නේ නැහැ, අපි හම්බ කළොත් අපි කනවා. අපිට ඔය දේශපාලන හොරුන් සමඟ හැප්පෙන්නට බැහැ" යන ආකල්පය ආණ්ඩුව පත් කරන්නට තරම් විසල් බලයක් ඇති ජනතාවට පෙර කිඳා බැස තිබුණත්, දැන් දැන් එම ආකල්ප වෙනස් වී ගෙන නො එන්නේ ද?

නීතිය ක්‍රියාත්මක නොවේ නම් ඡන්දය පාවිච්චි කිරීමෙන් තමන් පත් කළ ආණ්ඩුව නෙරපා හැරීමට තමන් සතුව ඇති බලය ගැන සාමාන්‍ය මිනිසුන් දේශපාලනිකව දැන උගත් වෙමින් පවතියි. ඔවුහු කරුණු කාරණා විමසන්නට ඉදිරිපත් වෙති.

"කවුරු ආවත් අපිට වැඩක් වෙන්නේ නැහැ,අපි හම්බකළොත් අපි කනවා," යන්න දන්නා මිනිස්සු පක්ෂ, පාට වලට නොරැවටී තමන් විසින් බලයට පත් කළ පුද්ගලයින්ගෙන් සැදුම් ලත් පාලන මණ්ඩලයේ ප්‍රතිපත්ති, කාර්යශූරභාවය, සම්පූර්ණත්වය, ඵලදායකත්වය වැනි කාරණාවන් තමන්ට වූ පොරොන්දුවලට අනුකූලව සිදු වන්නේ ද යන්න නිතර විශ්ලේෂණය කිරීමක් සිදු කරති. වෙනස සෙමෙන් සිදු වන්නේ ජනතාව අතරය.

බත් මුල්, අරක්කු, රුපියල් සත අල්ලස්, රැස්වීම්, වංක සමාජ ජාලා මෙහෙයවීම නැති නිලවරණ... මින් සදා පැතීමට ලංකාවේ හෝ අමෙරිකාවේ හෝ වේවා අපට නොහැකියි. අපේ ඡන්දය ලබා ගැනීමට දඟ දැමීම බලයට පත්වීමට තැත් කරන අයගේ එකම අරමුණයි. අපට කළ හැකි වෙනත් නොයෙක් දේ ඇත.

ප්‍රධානම කාරණාව හඬ නැඟීමයි. අකටයුතු, අසාධාරණ, වංචාව දුටු විට සාක්ෂි ඉදිරිපත් කරමින් හඬ නගන්න. හුදෙක් විරුද්ධ පාක්ෂික ප්‍රචාරණ මඩ ප්‍රහාරවල ගැලී, ගිලී, වල්මත් නොවී, පත් වී ඇති පාලක මණ්ඩලය සහ ආයතන ප්‍රධානීන් ගැන අඛණ්ඩව විමසිල්ලෙන් සිටින්න. ඔවුන් විසින් ජනතාවට සිදු විය යුතු සේවය ඉටු කරවා ගැනීමට නම් ඔබේ කාර්යභාරය නිසිලෙස ඉටු කරන්න.



හිමාලි එන්. ලියනගේ



## අංශක 360 ආදරේ

### නෙල්ලි කතන්දර

නෙල්ලි කතන්දර ඉස්සෙල්ලාම ලියුවේ දෙදහස් දොළහෙ සැප්තැම්බර් මාසෙ දවසක. ඊට අවුරුදු අටකට පස්සෙ දෙදහස් විස්සෙ අගෝස්තු මාසෙ අග දවසක නෙල්ලි කතන්දර තීරු ලිපි මාලාවෙ අලුත් පරිච්ඡේදයක් ආරම්භ වෙන එදා මෙදා තුර සෑහෙන්න දේවල් වෙනස් වෙලා. බද්දර මල්ලට ලියපු සමහර උදවිය යන්නම ගිහින්. මගේ වගේම ලියන, කියවන හැමෝගෙමත් ජීවිත වෙනස් වෙලා. සිද්ධ වෙච්චි වෙනස්කම් අතරෙ හදවතට වැඩියෙන්ම දැනුණෙ මගේ ලිපි වැඩියෙන්ම රස විඳපු රසවතාගේ නික්ම යෑම.

තාත්තා. එයා යන්නම ගියේ නෙල්ලි කතන්දර විරාමය අතරතුර.

දෙදහස් දොළහ අවුරුද්දෙ පළවෙනි නෙල්ලි කතාව ලියන්නෙ අංශක 180ක ආදරයක් ගැන. තාත්තට කොච්චර ආදරේ ද කියලා ඇහුවම අංශක 180ක් තරමට අත් දෙක දෙපැත්තට විහිදවපු කාලෙ සිද්ධ වුණ,

දොඩම් ගෙඩි දෙකක් තරම් උස නැති, හෝඩියේ අකුරු හරියට කියවගන්න බැරි දවස්වල අංශක 180 යි කියලා අත්දෙක දෙපැත්තට විහිදවලා පෙන්නපු ආදරේ තාත්තගෙන් ආපහු ලැබිච්ච ආදරෙත් එක්කලා එක්කාසු වුණාම ඊට වඩා වැඩි පරාසෙක පැතිරෙනවා කියලා තේරුම් ගන්න ටික ටික උස යද්දි මට පුළුවන් වුණා. ඒත් ඒ ආදර පරාසය අංශක 360ක් තරමටම විශාලයි කියලා තේරුණේ තාත්තා යන්නම යන්න බොහොම කිට්ටු දවස්වල.

පහුගිය අවුරුදු අටක කාල පරාසයේ අතර මැද්දෙ දවසක තාත්තයි මමයි එකිනෙකාට මුහුදු කීපයක දුරින් ජීවත් වෙන්න පටන් ගත්තා. ඊට පස්සෙ අපි එකිනෙකාව සජීවීව දැක්කෙ අවුරුද්දට වතාවයි, එහෙම නැත්නම් දෙකයි. මම දන්න කාලේ ඉඳලම තාත්තා යන්නම ගියපු දවස වෙනකල් ජීවත් වුණේ කන්දක් උඩ තිබුණු තේ පඳුරුවලින් වටවෙච්ච ඇතළතින් වගේම පිටිනුත් සුදු පාටින් පාට වෙච්ච ගෙදරක. බැංකුවේ රස්සාව කළත් ජීවිත කාලෙම ආස කළේ වවන්න හින්දා එයාට වවපු ඉඩම් සෑහෙන්න තිබුණා.

අහලා දැකලා තියෙන අනිත් බොහෝ නෑදෑයො වගේ "ආපහු ලංකාවට පදිංචියටම එන්නෙ කවද්ද?" කියලා තාත්තා ඇහුවෙ නෑ. වවපු ඉඩම් පාළුවෙයි කියලා හිත හේදිලා ගිය අවස්ථා තියෙන්න ඇති වුණත් කවදාවත්ම ඒ ගැන මතක් කරලා හිත රිද්දුවේ නෑ.

අලුත් තාලෙ වීඩියෝ දුරකථන ඇමතුම්වලට වැඩි මනාපයක් නොතිබිච්චි හන්දා මාස දෙක තුනකට වතාවක් මට ලංකාවෙන් ලියමනක් ලැබුණා. ඒ ලියමන්වල කිසි කොනක "දුවට මං ආදරෙයි" කියලා තිබුණේ නෑ. කියවන්න පටන්ගත්ත අලුත් පොත ගැන, ලංකාවේ දේශපාලන තත්ත්වය ගැන වගේම මේ කන්නෙ වැස්ස හන්දා වී වගාවට නොසෑහෙන කරදරය වගේ අපේ බැඳීමට අදාළ නැති වටපිට තොරතුරුවලින් ඒ ලියුම් පිරිලා තිබුණා. ඒත් ඒ ලියමන්වල නොලියා ලියැවුණ ආදරේ හිතේ පතුලටම දැනුණා.

ලංකාවට ගියපු වෙලාවල, ජීවිතේ අන්තිම අසරණ වෙච්ච අවස්ථාවලදිත් ගම් රටවල් දාලා නොගියපු මිනිස්සු ගැන,ඒ මිනිස්සු ජීවිතේ දිනපු හැටි ගැන කතන්දර කියුවත් කොයි වෙලාවකවත් ආපහු එන්න කියුවේ නෑ. සමහර මිනිස්සු ගාවට මරණය, නොකියාම හිටි ගමන් ඇවිත් එයාලව අරගෙන යනවා. තවත් සමහර මිනිස්සුන්ට මරණයට දිනයක් නියම වෙනවා. ඉස්සර කාලෙ වගේ නෙමෙයි දැන් කාලෙ දොස්තරලා ලෙඩා ඉස්සරහා පිටම "වැඩිම වුණොත් තව අවුරුදු දෙකක් ඉදියි" කියලා ලෙඩේ ගැන පහදලා දෙනවා.ඒකෙ වරදක් නෑ. එතකොට මරණෙට වුණත් ලෑස්ති වෙන්න කල් තියෙනවා.

තාත්තාට හිමි වුණේ දිනයක් නියම වුණ මරණයක්.

මූදු අතර දුර ගෙවා ගෙන අන්තිම අවුරුද්දෙ කීප වතාවක් මම තාත්තව බලන්න යනවා. රස්සාව නූලෙන් බේරෙන විදිහට තාත්තත් එක්ක මාසයක් දෙකක් නැවතිලා ආපහු එනවා. ඒත් තාත්තට හොඳටම අමාරු වුණ අන්තිම මාසෙ තාත්තා ළඟින් ඉන්න මට යන්න බැරි වෙනවා.

ඒ මාසෙ දවසක හැමදාම වීඩියෝ දුරකථන ඇමතුම්වලට කැමැත්තක් නොපෙන්නපු තාත්තාගෙන් මට වීඩියෝ ඇමතුමක් ලැබෙනවා.

"මං බොහොම සනීපෙන් ඉන්නවා. ඔහේ එන්න කලබල වෙන්න එපා. උවමනා වුණොත් මං කියන්නම්" දකුණෙ භාෂාවෙන් වේදනා පිරුණු හිනාවක් මූණෙ අලවගෙන තාත්තා කියනවා.

ඒ ඇමතුමෙන් සතියකට පස්සෙ දවසක තාත්තා යන්නම යනවා. යන්නම යන්න දවසකට කලින් කොහොම හරි මම තාත්තාව බලන්න යනවා. හිතේ ඉතිරෙන කඳුළු හිනාවකින් වහන් කරගෙන මම තාත්තගෙ ඔලුව අතගානවා. නවත්තන්නෙම නැතුව දිගටම. "දැන් ඇති පුතේ"....ඇහෙන නෑහෙන කෙඳිරිලි හඬින් තාත්තා කියනවා.

"ඇයි තාත්තේ?" මං අහනවා. "ඔහේගෙ අත රිදෙනවා ඇතිනේ..." මට උත්තර ලැබෙනවා. ඊට පහුවෙනිදා බොහොම සන්සුන් ගමනින් කිසි කලබලයක් නැතුවම තාත්තා යන්න යනවා.

පැණි වළලු ලියපු, පහුගිය දවසක යන්නම ගියපු ගංගානාත් දිසානායක මහත්තයා ගැන ඔහුගේ ගමන් සගයෙක් වුණ සමන් ආතාවුද හෙට්ටි මහත්මයා ලියපු ලියමනක මෙහෙම තියෙනවා."ඔහු ජපානයේ ගුරු රස්සාව අතැර දමා තමන් බැලීමට පැමිණීමට සූදානමින් සිටි බාල දියණිය රුවීට නොපැමිණෙන ලෙස බල කළේය.

"තාත්තා ඔයාගෙන් ඉල්ලන්නේ එකම එකයි. එන්න එපා"

වචනයෙන් වගේම හදවත පතුලෙන්ම එහෙම ඉල්ලීමක් එන්නේ දරු සෙනෙහස හදවත පතුලේම රැඳුන "ඇත්තටම ආදරේ" තාත්තලාගෙන්ම විතරය. අංශක 360 පරාසයක විහිදුණ ආදර කතා අවසාන වෙන්නේ එහෙමය.





දසුනි හෙට්ටිආරච්චි

# රැකියා ඇබෑර්තු





## ආකර්ෂණීය වැටුපක් හිමිකර ගන්න ....
## එන්න අප හා එක්වන්න

## සී/ස කටුගම්පල විවිධ සේවා සමුපකාර සමිතිය

පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගෙන් 2020.09.21 දින දක්වා වයස අවු. 18 – 45 ත් අතර කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුරු පුරප්පාඩු

01. **අලෙවි කළමනකරු - අධි ශ්‍රේණිය (ඉන්ධන පිරවුම්පල හා ශාඛා පරීක්ෂක)**
    1/2015. SL- රු. 27500 - 450x10-525x10-625x10=43500 -A ශ්‍රේණිය
02. **බැංකු ප්‍රවර්ධන නිලධාරී**
    1/2015. OL- රු. 20500 - 320x10-375x10-500x10=32450- A ශ්‍රේණිය
03. **අලෙවි කළමනාකරු**
    1/2015. OL- රු. 20500 - 320x10-375x10-500x10=32450-A ශ්‍රේණිය
04. **රියදුරු**
    1/2015. MSSL (T)- රු. 17000 - 270x10-320x10-375x10=26650- A ශ්‍රේණිය
05. **වෙළඳ සහකාර**
    1/2015. MSSL - රු. 16000 - 185x10-225x10-270x10 - 320x10 =26000- A ශ්‍රේණිය
06. **මුරකරු**
    1/2015. MSSL -රු.16000-185x10-225x10-370x10-320x10=26000-A ශ්‍රේණිය
07. **කම්කරු**
    1/2015. MSSL -රු.16000-185x10-225x10-270x10-320x10=26000-A ශ්‍රේණිය

තනතුරට අදළ සුදුසුකම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඕනෑම සමුපකාර සමිතියකින් ලබාගත හැක. ඉහත වැටුපට අමතරව චක්‍රලේඛ අනුව ගෙවන රු. 2,500/= ක දීමනාව හා රු 2,000/= ක පැමිණීමේ දීමනාව හිමි වේ. සේවක අර්ථසාධක හා සේවා නියුක්තියට අමතරව දයක විශ්‍රාම වැටුපට හිමිකම් ලැබේ. ඔබ විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සමග ඔබගේ අධ්‍යාපන සුදුසුකම්, වෙනත් සුදුසුකම්, ග්‍රාම නිලධාරී සහතිකය, උප්පැන්න සහතිකයේ හා හැඳුනුම්පතේ ඡායා පිටපත් ද අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කර 2020.09.21 දින දහවල් 12.00 ට පෙර "**ගරු සභාපති - සී/ස කටුගම්පල වි. සේ.ස. සමිතිය - පන්නල**" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**සාමාන්‍යාධිකාරී**

**සී/ස කටුගම්පල වි. සේ. ස. සමිතිය,**
**පන්නල.**
2020.09.04
දුරකථන : 037-4942113/ 037-4937779





## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2020.09.25 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

*මානව ශාස්ත්‍ර පීඨය*

01. **ඉංග්‍රීසි අධ්‍යයන අංශය**
    කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I
02. **පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය**
    කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I / පාලි පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය (විනේතෘ)
03. **බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය**
    කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I
04. **වාග්විද්‍යා අධ්‍යයන අංශය**
    කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I
05. **නූතන භාෂා අධ්‍යයන අංශය**
    කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

**අයදුම් කරන පිළිවෙළ**

මෙම තනතුරු සඳහා අදළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ www.kln.ac.lk, news.kln.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපැලෙන් ලබාගැනීමට අවශ්‍යනම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. **අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම** අයදුම්පත් යොමුකළ යුතු අතර, අයදුම්පත් අදළ සහතිකවල පිටපත් සමග 2020.09.25 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුවේ.** අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**කැලණිය.**
**2020.09.03**





■ නාඋල සමූහ

# මධ්‍යම පළාතේ වගා බිම් රැසක් මහ වැස්සෙන් වැනසෙයි

දසත - දස අත ම එක තැන

රෑට පුරා ඇති වූ වැසි හා සුළං තත්ත්වයෙන් මධ්‍යම පළාතේ වගා බිම් රැසකට දැඩි බලපෑම් එල්ලවී ඇතැයි ගොවි සංවිධාන කියා සිටියි.

වැසි සමග ඇති වූ දැඩි සුළං තත්ත්වය හමුවේ කුඹුරු වගාවල ගොයම් පෙරළී යැම් මෙන්ම භෝග වගා රැසකට ද හානි සිදුව ඇතැයි ගොවි සංවිධාන කියා සිටියි.

මාතලේ දිස්ත්‍රික්කයේ අක්කර 500 ක වගා කටයුතු සිදු කරනු ලබන නාඋල - අඹන මහ වෙල්යායේ, අඹන ගොවි සංවිධානයේ ක්‍රියාකාරී සාමාජික වයි.එම්.එස්. බණ්ඩාර මහතා කියා සිටියේ සවස් කාලයේ සිට රාත්‍රිය පුරා දැඩි සුළං සහිත වැසි පතිත වූ බවයි.

දැඩි නියං තත්ත්වයක් පැවැති පසුගිය දින කිහිපයේ භෝග රැසකට හානි පැමිණි බවත් හිටි හැටියේ ඇද හැළුණු වර්ෂාව හේතුවෙන් යළි වී වගාවන් හා ආධාරක ආශ්‍රිතව වගා කටයුතු සිදුකර ඇති එළවලු කොරටු වලට හානි සිදුව ඇතැයි ද කියාසිටියේය.



## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

### කළමනාකාර අධ්‍යක්ෂ තනතුර

රාජ්‍ය අංශයේ සුවිශාල ආයතනයක් වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි කළමනාකාර අධ්‍යක්ෂ ධුරය සඳහා සුදුසුකම් සහිත තැනැත්තෙකු බඳවාගැනීමට අපේක්ෂා කරයි.

වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු මෙහෙයවීම, සංවිධානය කිරීම හා එහි බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම, සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය හා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාන්‍ය විධානවලට යටත්ව හා සභාපතිවරයාගේ විශේෂ විධානවලට යටත්ව කටයුතු කිරීම කළමනාකාර අධ්‍යක්ෂවරයාට පැවරෙනු ඇත.

01. **සුදුසුකම්**
    ඉහත සුදුසුකම් සපුරා ඇති රජයේ / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ප්‍රධාන විධායක හෝ ඉහළ කළමනාකාර තනතුරක පළපුරුද්ද සහිත ප්‍රවීණ තැනැත්තෙකු විය යුතුයි.
02. **වැටුප**
    සාකච්ඡා කර තීරණය කළ හැක.
03. **ප්‍රතිලාභ**
    වරාය අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් (ඉන්ධන), සංග්‍රහ දීමනාව, වෛද්‍ය රක්ෂණ ආවරණය, දුරකථන / ජංගම, නිල නිවස.

වෘත්තීය නිපුණතාව සනාථ කරගැනීම සඳහා වන සහතිකවල ඡායා පිටපත් සමග අයදුම්පත් 2020.09.15 දින හෝ ඊට ප්‍රථම "**ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, මානව සම්පත් කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13**" ලිපිනය වෙත හෝ chrm@slpa.lk යන විද්‍යුත් තැපැල වෙත ලැබෙන සේ එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුවේ. අදළ සහතිකවල ඡායාපිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ හා රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර, අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදාහැරීමට එකඟවන බවට සටහනක් තිබීම අවශ්‍ය කෙරේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය.**



■ කේ.ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

## මත්පැන් සමඟ සැකකරුවෝ අසුවෙති



කල්පිටිය පොලිසිය විසින් කළ වැටලීම් රැසකදී නීති විරෝධි කසිප්පු බෝතල් 150ට ආසන්න ප්‍රමාණයක් සමග සැකකරුවන් දෙදෙනකු හා නීති විරෝධි හෙරොයින් මිලි ග්‍රෑම් 800ට ආසන්න ප්‍රමාණයක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවකුද අත්අඩංගුවට ගෙන තිබිණි.

මෙලෙස පොලිස් අත්අඩංගුවට පත් සැකකරුවන් මොහොත්තුවාරම, වත්තිමුන්දලම හා ඒත්තාල යන ප්‍රදේශවල පදිංචිකරුවන් පිරිසක් බවත්, මොවුන් මෙම නීති විරෝධි මත්පැන් ඉතා සූක්ෂම ලෙස පෙරා හොර රහසේ අලෙවි කිරීමේ ජාවාරමක නිරතව සිට ඇති බවට පොලිසියට ලද තොරතුරකට අනුව මෙම වැටලීම සිදුකර තිබේ.

## අබලන් මාවතට පිළියම් කරමු



මීගමුව, කුරණ, ගුවන් හමුදා කඳවුර මාවතේ සිවුමං සන්ධිය අසල කලෙක සිට පවතින අබලන් තත්ත්වය හේතුවෙන් ප්‍රදේශවාසීහු දැඩි අපහසුතාවට පත්ව සිටිති. මීගමුව සිට කටුනායක දෙසට විකල්ප මාර්ගයක් ලෙස ඒ හරහා වැටී ඇති අතර, මෙම තත්ත්වය මත එම මාර්ගය භාවිත කරන රථ වාහන ද දැඩි අපහසුතාවට පත්ව තිබේ. ගුවන් හමුදා කඳවුර මාවත දෙපස වර්ෂාව දිනවල අධික ලෙස ජලය රැඳීමෙන් අබලන් වීමෙන් යතුරුපැදි ගණනාවක්ම අනතුරට පත්වූ අවස්ථාවන්ද වාර්තා වෙයි. එම මාර්ගය අයත් බල ප්‍රදේශය වන කටුනායක - සීදූව නගර සභාවේ අවධානය මේ පිළිබඳ යොමු නොවීම කනගාටුවට කරුණක් බව ද ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.



## මිල ගණන් කැඳවීමේ දැන්වීම (IFB)

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රම කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLDC) වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් අයිතමයන් සඳහා සුදුසුකම් ලත් ටෙන්ඩර්කරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

| ප්‍රසම්පාදන අංක | විස්තරය | සුදුසුකම් | ලංසු විවෘත කරන දිනය | ආපසු නොගෙවන ලංසු පත්‍රිකා ගාස්තු |
|---|---|---|---|---|
| S/204/20 | පෙදරේරු, වඩු කාර්මික, පයිප්ප වැද්දුම්කරු, විදුලි කාර්මික, පැස්සුම්කරු, ජල නළ කාර්මික හා කම්කරු | සමාන ක්ෂේත්‍රයක අවම වශයෙන් අවුරුදු 2 ක සේවා පළපුරුද්ද | 2020 සැප්තැම්බර් 29 දින ප.ව.1.30ට | රු. 1000.00 |

1. සිංහල භාෂාවෙන් පිළියෙල කරන ලද ටෙන්ඩර්පත් කට්ටල 2020 සැප්තැම්බර් මස 08 දින සිට 2020 සැප්තැම්බර් මස 29 වන දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.30 අතර කාලය තුළ (වැඩ කරන් දිනයන්හිදී) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්), ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ඉහත සඳහන් ටෙන්ඩර්පත් ගාස්තු ගෙවීමෙන් පසු ලබාගත හැකි අතර, සියළු ගෙවීම් සංස්ථා ප්‍රධාන කාර්යාල නව ගොඩනැඟිල්ලේ 03 වන මහලේ පිහිටි මුදල් අංශයේ මුදල් අයකැමිට පමණක් මුදලින් ගෙවිය යුතුය.
2. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍ර බහාලූ කවර මුද්‍රා තබා එහි වම්පස ඉදිරි කෙළවරේ ටෙන්ඩර් අංකය සහ ටෙන්ඩර් නාමය සඳහන් කර 2020 සැප්තැම්බර් මස 29 වන දින ප.ව 1.30 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ සංස්ථා නව ගොඩනැඟිල්ලේ පළමු මහළේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.
   සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
3. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී එකී ටෙන්ඩර් විවෘත කරන අතර, ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.
4. මේ සදහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර විස්තර දුරකථන අංක 011-2 862438 (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉදිකිරීම්) මගින් ලබා ගත හැක.

සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
වෙබ් අඩවිය: www.landreclamation.lk



■ එස්.ජී.විජේරත්න- කටුගස්තොට සමූහ

## නිවෙසේ උඩුමහලින් ඇදවැටී පෙදරේරුවා මරුට

අකුරණ දෙඩම්ගොල්ල ප්‍රදේශයේ ඉදි කෙරෙමින් පවතින තෙමහල් නිවෙසක උඩු මහලින් පහළට ඇද වැටුණු පුද්ගලයකු බරපතළ තුවාල ලබා රෝහල් ගත කිරීමෙන් පසු මියගොස් තිබේ. මෙසේ මියගොස් ඇත්තේ අලවතුගොඩ විලානගම පදිචිකරුවකු වන සරනවනමුත්තු මහේෂ්වරන් නමැති 40 හැවිරිදි පුද්ගලයකු වන අතර ඔහු ඉදිකෙරෙමින් පවතින නිවෙසේ ප්‍රධාන පෙදරේරුවා බවද වාර්තා වේ.

මියගිය පුද්ගලයාගේ දේහය පිළිබඳ මූලික මරණ පරීක්ෂණය මහනුවර නාගරික හදිසි මරණ පරීක්ෂක පී.බී.විජේකෝන් මහතා විසින් සිදුකර ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණය මහනුවර ජාතික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි ආර්.පී.ජයසූරිය මහතා විසින් සිදුකර ඇත.අලවතුගොඩ පොලිසිය විසින් පරීක්ෂණ කටයුතු මෙහෙයවා තිබේ.

## මිල ගණන් කැඳවීමේ දැන්වීම (IFB)

**නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අාමාත්‍යාංශය**

### ඒකඟතාව ප්‍රකාශ කිරීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ විශේෂිත වූ සේවාවන් සඳහා පුහුණු ශ්‍රමිකයින් කුලී පදනම මත සැපයීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLDC) වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් අයිතමයන් සඳහා සුදුසුකම් ලත් ටෙන්ඩර්කරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | අයිතම විස්තරය | වෘත්තීය සුදුසුකම් | අවසන් දිනය සහ වේලාව | අධ්‍යාපන සුදුසුකම් | ආපසු නොගෙවන ටෙන්ඩර්පත් ගාස්තුව |
|---|---|---|---|---|---|
| S/319/20 | බර යන්ත්‍ර ක්‍රියාකරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්‍ෂණික පුහුණු කිරීමේ ආයතනයක් විසින් පවත්වනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටම හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක සේවා පලපුරුද්දක් ලබා තිබිය යුතුය. | 2020 සැප්තැම්බර් 29 දින 13.30 ට | අ. පො. ස. (සා/පෙළ) විභාගයට පෙනී සිට තිබිය යුතුය | රු 1,000.00 |
| | සැහැල්ලු යන්ත්‍ර ක්‍රියාකරු | TVEC විසින් පිළිගත් තාක්‍ෂණික පුහුණු කිරීමේ ආයතනයක් විසින් පවත්වනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය | | | |
| | ට්‍රැක්ටර් රියදුරු | බර වාහන පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනයක බර වාහන පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය | | | |
| | බර වාහන රියදුරු (ලොරි, ටිපර්) | | | | |

1. සිංහල භාෂාවෙන් පිළියෙල කරන ලද ටෙන්ඩර්පත් කට්ටල 2020 සැප්තැම්බර් මස 08 දින සිට 2020 සැප්තැම්බර් මස 29 වන දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.30 අතර කාලය තුළ (වැඩ කරන් දිනයන්හිදී) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්), ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ඉහත සඳහන් ටෙන්ඩර්පත් ගාස්තු ගෙවීමෙන් පසු ලබාගත හැකි අතර, සියළු ගෙවීම් සංස්ථා ප්‍රධාන කාර්යාල නව ගොඩනැගිල්ලේ 03 වන මහළේ පිහිටි මුදල් අංශයේ මුදල් අයකැමිට පමණක් මුදලින් ගෙවිය යුතුය.
2. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍ර බහාලූ කවර මුද්‍රා තබා එහි වම්පස ඉදිරි කෙළවරේ ටෙන්ඩර් අංකය සහ ටෙන්ඩර් නාමය සඳහන් කර 2020 සැප්තැම්බර් මස 29 වන දින ප.ව 1.30 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ සංස්ථා නව ගොඩනැගිල්ලේ පළමු මහළේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.
   සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
3. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී එකී ටෙන්ඩර් විවෘත කරන අතර, ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.
4. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන පූර්ව ටෙන්ඩර් කැඳවීමේ රැස්වීම 2020 සැප්තැම්බර් මස 22 වන දින පෙ.ව. 10.00ට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.
5. උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන්ට සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) වෙතින් වැඩිදුර පැහැදිලි කිරීම් ලබාගත හැකිය. දු.ක +9411 2 869 320, ෆැක්ස් +9411 2 8 669 320

සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
වෙබ් අඩවිය: www.landreclamation.lk

# ලංසු කැඳවීම

## අංක LPA/06/2020

# ලේක්හවුස් ආපනශාලාව

සේවකයින් 1500 කට පමණ ආහාරපාන සපයනු ලබන ලේක්හවුස් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පළපුරුදු ආපනශාලාකරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ආපනශාලාව භාවිත කරන සංඛ්‍යාව රඳා පවතින්නේ, ආපනශාලාකරුවන් විසින් සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය මතය.

ආපනශාලාව දිවා රාත්‍රී විවෘතව තැබෙන අතර, (පැය 24) තෝරාගනු ලබන ආපනශාලාකරු විසින් තත්ත්වයෙන් උසස් ගුණාත්මක බවින් යුත් ආහාරපාන නියම කරන ලද මිලට සැපයීම කළ යුතු වනු ඇත.

**මුළුතැන්ගෙයි උපකරණ, ආපනශාලාවේ ගෘහ භාණ්ඩ, විදුලිය, ජලය සහ මාසයකට (කි.ග්‍රෑ. 37.5) ගෑස් සිලින්ඩර් 20 ක් බැගින් නොමිලේ සපයනු ලබන අතර, කුලී අයකරනු නොලැබේ.**

ලංසු අයදුම්පත්‍ර සහ කොන්දේසි 2020 **සැප්තැම්බර්** 07 **සිට** 18 **දින තෙක්** සතියේ දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා** ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් රු. 5000/- ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් හා **රු. 1000/- ක** ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීම මත ලබාගැනීමට පුළුවන.

සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා, මුද්‍රා තබන ලද ලිපි කවරයක ඇතුළත් කර **"ආපනශාලාව සඳහා ලංසු කැඳවීම" යනුවෙන් ලිපි කවරයේ ඉහළ වම් කෙළවර සළකුණු කොට ප්‍රධානි - ප්‍රසම්පාදන, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම"**, යනුවෙන් යොමුකොට 2020 **සැතැම්බර්** 21 **ප.ව.** 2.30 **ට** ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

2020 **සැප්තැම්බර්** 21 **දින ප.ව.** 2.30ට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

